ස්තූතිය

පර්යේෂණ කටයුතු සඳහා අරමුදල් ලබාදීම, පර්යේෂණ කාර්ය මණ්ඩලය හුවමාරු කිරීම සහ පුහුණු කිරීමේලා පහසුකම් සැළසීම යනාදිය සිදුකළා වූ ආයතන හා විදේශීය රාජ්‍යයන්ටත් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයටත් මෙම මධ්‍යස්ථානය සිය ස්තූතිය පිරිනමන අතර, ඔවුන් දැක්වූ සහයෝගය පිළිබඳ කෘතඥතාවය ද මෙහිලා සඳහන් කරමි.

මෙම මධ්‍යස්ථානයේ කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක කර ගැනීම සඳහා ඊට නන් අයුරින් සහයෝගය දැක්වූ, ආධාර කලා වූ සමස්ථ කාර්ය මණ්ඩලයටත්, සභාපති ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය මෙයින් පිරිනැමේ.

ඉංජි. ඩබ්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු
සභාපති
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

පටුන

මාතෘකාව	පිටු අංක
01. පනත්, නීති හා වස්ථාපිත පාලනය	02-03
02. අධ්‍යක්ෂ මණ්ඩලය හා සංවිධාන ව්‍යුහය	04-06
03. සභාපතිතුමාගේ පණිවිඩය	07-08
04. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය	09-11
05. මානව සම්පත් කලමනාකරණය	12-16
06. 2017 වර්ෂයේදී කාර්යසාධනය පිළිඹිමු කිරීම	17-38
07. සුභසාධන හා ආගමික කටයුතු	39
08. ගිණුම්කරණ ප්‍රතිපත්ති	40-44
09. 2017.12.31 දිනට තත්ව ප්‍රකාශය	45
10. 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් වර්ගීකරණය කාර්ය පදනම මත විදහා පෑම	46
11. 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය	47
12. 2017.12.31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය	48
13. 2017.12.31 දිනට ගිණුම්කරණ සටහන්	49-55
14. 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව	56 – 64
15. 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පැහැදිළි කිරීම	65-72

01. පනත්, නීති හා ව්‍යවස්ථාපිත පාලනය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ ප්‍රතිපාදන අනුව 1974 වර්ෂයේදී පිහිටුවන ලද අතර වර්තමානයේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. දේශීය කර්මාන්ත, තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රයන්හි දියුණුව හා ප්‍රගමනය උදෙසා ව්‍යවස්ථාපිත පනතේ අරමුණු පෙරදැරිව ආයතනයේ කාර්යභාරය ඉටුකරනු ලබන අතර ජා ඇල, ඒකල, කාර්මික ජනපදය තුළ පිහිටුවා ඇත.

ආයතනයේ දැක්ම, පරමාර්ථය සහ මෙහෙවර පහත දැක්වේ.

දැක්ම

"දකුණු ආසියාවේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය බවට පත්වීම"

අභිමතාර්ථය

"ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වන ඉංජිනේරුමය මැදිහත්වීම."

මෙහෙවර

"නව නිපැයුම් සහ ආයතනයේ කාර්ය මණ්ඩලය මෙන්ම ආයතනය පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන්ගේ නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය වන සංස්කෘතියක් ආයතනය තුල ඇති කරමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ඍජුව බලපෑමක් කළහැකි ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකරමින් ඉංජිනේරු තාක්ෂණයන් සංවර්ධනය, අත්පත් කරගැනීම, භාවිතා කිරීම හා පැවරීම"

මධ්‍යස්ථානය පිහිටුවන ලද පනතට අනුව වන අරමුණු වනුයේ ;

1. ශ්‍රී ලංකාවේ නව සොයාගැනීම් සහ නිර්මාණ කුසලතාවන්ට ධෛර්ය දීමෙන්ද, ඒවායේ සංවර්ධනයට ආධාර දීමෙන්ද, දේශීය තාක්ෂණය සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික ක්‍රම ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම

2. සාමූහික ප්‍රයත්නයන් ඵලදායී අයුරින් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය ඉංජිනේරු සහ පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැළස්වීම.

3. රටේ සම්පත් දායාදයන්ට සහ ජාතික ක්‍රම සම්පාදනයේ අරමුණු වලට අනුකූල වන තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයුක්ත කිරීමට සහ ඒවා යොදා ගැනීමට වගබලා ගැනීම

4. අවශ්‍ය වූ විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි උචිත ආයතනයන්ට ඍජු ආකාරයෙන් සහ වක්‍ර ආකාරයෙන් තාක්ෂණික ශිල්පීය ක්‍රම මාරු කිරීමේ උපක්‍රම පරීක්ෂා කිරීම සහ ඒ ආයතනයන්ට උපදෙස් දීම.

5. උචිත තාක්ෂණික ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීමෙන් රටේ මානුෂික හා ද්‍රව්‍යමය සම්පත් වලින් විශේෂයෙන්ම ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත් වලින් උපරිම උපයෝජණය අත්කර ගැනීමට අනුබල දීම.

6. ඉංජිනේරු ශිල්පීය සැළසුම් පර්යේෂණ පිළිබඳ තාක්ෂණික දත්තයන් සහ ලේඛණානයනය ජාත්‍යාන්තර හා ජාතික නියෝජිත ආයතනයන්ගේ සහයෝගයෙන් යුක්තව අඛණ්ඩව සමීක්ෂණය කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

7. කාර්මික, වාණිජ සහ වෙනත් අරමුණු සඳහා යන්ත්‍ර භාවිතා කරන්නන් විසින් ඉල්ලුම් කරනු ලැබූවිට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අරපිරිමැස්මෙන් යුක්තව සැළසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම.

8. රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ව්‍යවසායනයට අඛන්ඩ උපදේශක සේවාවන් සැලසීම, රටේ ඉංජිනේරු සහ කාර්මික සැළසුම් පදනම මෙන්ම පර්යේෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම.

9. කාර්මික, වාණිජ සහ වෙනත් අරමුණු සඳහා යන්ත්‍ර භාවිතා කරන්නන් විසින් ඉල්ලුම් කරනු ලැබූවිට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අරපිරිමැස්මෙන් යුක්තව සැළසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම.

02. අධ්‍යක්ෂ මණ්ඩලය හා සංවිධාන ව්‍යුහය

සභාපති

ඉංජි. ඩබ්.ජේ.එල්. එස්. ප්‍රනාන්දු මයා
B Sc(Hon)Eng., M Eng., FIESL, MIET, C Eng.

අධ්‍යක්ෂ මණ්ඩලය

1. ඉංජි. ඊ.ඒ.එස්.කේ. එදිරිසිංහ මහතා
   C.Eng., MIET
2. ජී. චන්ද්‍රසිරි මහතා
   B Com Degree
3. ඒ.එස්.ආර්. වෛද්‍යසේකර මහතා
   MBA(PIM-USJ), Chartered Marketer
4. ඉංජි. ඒ.එස්. සමරසිංහ මහතා
   C.Eng
5. ඩී.ජී .නිලූකා කුමාරි මහත්මිය
   Master of Business Studies, CBA
6. ඒ.එච්.එම්. අන්වර් මහතා

අධ්‍යක්ෂ ජනරාල්/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ඉංජි. ඩී.ඩී.ඒ. නාමල් මයා
M Eng. (Energy Technology), B Sc Eng. (Hons), C Eng., MIE(SL)

ශ්‍රී ලංකා ජාතික ඉජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

සංවිධාන ව්‍යුහය (අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුව)



කාර්යාලය

2පී/17බී, කාර්මික ජනපදය
ඒකල, ජා ඇල.

තැපැල් සංකේත අංකය

11380

ඇමතුම් විස්තරය

+ 94-011-2236284
+ 94-011-2236384
+ 94-011-2236307
+ 94-011-5354597

+ 94-011-2233153

nerdcentre@nerdc.lk

www.nerdc.lk

බැංකු කරුවෝ

- ලංකා බැංකුව - ජා ඇල
- ලංකා බැංකුව - ආයතනික ශාඛාව

විගණකවරු

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව

03. සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වන ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ (NERDC) 2017 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ඉමහත් සතුටකි.

නර්ඩ් මධ්‍යස්ථානය විසින් පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති, නියමු ව්‍යාපෘති, කර්මාන්ත සඳහා අවශ්‍ය තාක්ෂණික සේවා සැපයීම්, තාක්ෂණ ප්‍රචලිත කිරීම, විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපනය ප්‍රවර්ධනය යනාදි කාර්යයන්හි නියැලෙමින් 2017 වර්ෂය තුලදී ද තම සේවාවන් අඛණ්ඩව ලබාදීමට කටයුතු කර ඇත. නව තාක්ෂණයන්, නිෂ්පාදන සහ ක්‍රියාවලි හඳුන්වාදීම හා වැඩිදියුණු කිරීම, නව තාක්ෂණය පාදක ස්වයං රැකියා අවස්ථාවන් ඇති කිරීම, කාර්මික හා තාක්ෂණික සේවාවන් සැපයීම තුලින් කර්මාන්තයන්හි ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම, සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමට යොමු කිරීම, නව නිපැයුම්කරුවන්ගේ ධාරිතා වර්ධනය යනාදිය මධ්‍යස්ථානය විසින් රටට ලබා දී ඇති ප්‍රතිලාභ හා ප්‍රතිදාන වේ.

මධ්‍යස්ථානයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු, තාක්ෂණ හා කාර්මික සේවා සැපයීම් ඇතුලු සමස්ථ කාර්යයන් තවදුරටත් කාර්යක්ෂම සහ ඵලදායි කිරීමේ අභිප්‍රාය ඇතිව 2017 වර්ෂය තුළ දී පියවරයන් රැසක් ගනු ලැබීය. ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අභිප්‍රායන් ප්‍රති සමාලෝචනය කිරීම, මධ්‍යස්ථානයේ දැක්ම, මෙහෙවර, අභිප්‍රායන් නිරූපණය වන පරිදි සහ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය එම කාර්යයන්ට අභිප්‍රේරණය වීම දිරිමත් කිරීම සඳහා මධ්‍යස්ථානයට නව නිල ලාංඡනයක් සහ තේමා ගීතයක් හඳුන්වා දෙනු ලැබීය. නව නිපැයුම්කරුවන් සහ කාර්මාන්තකරුවන් සඳහා පහසුකම් සැලසීමට තාක්ෂණ ඉන්කියුබේටර් අංශය ස්ථාපිත කරනු ලැබීය. තවද, මධ්‍යස්ථානයේ වානිජ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන සහ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම, මෙම වසරේ අප මධ්‍යස්ථාන ව්‍යුහය තුල සිදුවූ සුවිශේෂී වෙනසක් වූ අතර එමගින් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර දෙපාර්තුමේන්තු සහ අංශ ප්‍රතිසංවිධානය විය.

ජාතික පර්යේෂණ සහ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන පරිදි 2017 වසර තුලදී ද මධ්‍යස්ථානය විසින් බලශක්ති සහ පාරිසරික කළමනාකරණය, නිවාස සහ ඉදිකිරීම්, කෘෂි ඉංජිනේරු, මෙකට්‍රොනික් ඉංජිනේරු, විදුලි සහ විද්‍යුත් ඉංජිනේරු යනාදී ක්ෂේත්‍ර නියෝජනය කරමින් පර්යේෂණ හා සංවර්ධනයන් ගනණාවක් සිදු කරනු ලැබීය.

2017 වර්ෂය තුල සිදුකරන ලද ප්‍රධාන පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති අතර අඩුකාලයක් සහ කුඩා ඉඩ ප්‍රමාණයක සවිකල හැකි අඩු වියදම් පැතිබැම් ඉදිකිරීමේ තාක්ෂණය හඳුන්වා දීම, ගල් අඟුරු විදුලි බලාගාරයෙන් නිපදවෙන දුවිලි අළු (Fly ash) යොදාගනිමින් පෙර නිමි (Pre-cast) කොන්ක්‍රීට් නිමවුම් සැකසීම සහ අනෙකුත් ඉදිකිරීම් සඳහා යොදා ගැනිම, ගල් අඟුරු බලාගාරවලින් නිපදවෙන Bottom ash යොදා ගනිමින් සිමෙන්ති වැලි ගල් නිෂ්පාදනය කිරීම, වහල සෙවිලි කරන උළු නිෂ්පාදනයේ දී උළු වල තෙතමනය ඉවත් කිරීම සඳහා චලනය කල හැකි ලුවර සහිත උෂ්ණත්වය පාලනය කළහැකි ආකාරයේ ට්‍රොලි පද්ධතියක් සහිත කාර්යක්ෂම සහ ඵලදායි තාක්ෂණයක් හඳුන්වා දීම, අධිපීඩිත ඔක්සිජන් චිකිත්සක සඳහා වන Hyperbaric ඔක්සිජන් කුටීරයක් නිර්මාණය කිරීම යනාදිය දැක්විය හැක. විදී ලාම්පු දැල්වීම සඳහා ආරක්ෂිත ක්‍රමවේදයන් හඳුන්වා දීම, මෙරට ජාතික විදුලි බල පද්ධතිය හා සම්බන්ධ සූර්ය විදුලි පද්ධතියේ කාර්යසාධනය විශ්ලේෂණය කිරීම සහ විදුලි පරිභෝජනය සම්බන්ධ තොරතුරු විශ්ලේෂණය කිරීම, විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ක්ෂේත්‍රය තුළ සිදු කරනලද පර්යේෂණයන් විය.

තව ද ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ආදර්ශ ව්‍යාපෘතියක් ලෙස ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක්, ලංකා විදුලිබල මණ්ඩලයේ කොත්මලේ විදුලි බලාගාර සේවක ගම්මානය සඳහා එම මණ්ඩලයේ අනුග්‍රහය ඇතිව ආරම්භ කරන ලද අතර මෙය නියමු ව්‍යාපෘතියක් ලෙස යොදාගනිමින් ඝන අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා රට පුරා ව්‍යාප්ත කිරීමේ හැකියාව සොයා බලනු ඇත. ස්වංක්‍රීයව ක්‍රියාකරන බීම වර්ග සහ යෝගට් පිරවීමේ සහ ඇසුරුම් කිරීමේ යන්ත්‍ර හඳුන්වාදීම, කොහු ලණු ඇඹරීමේ යන්ත්‍ර වැඩිදියුණු කිරීම, දුම් ගැසු මාළු නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය හඳුන්වාදීම, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සඳහා අවශ්‍ය කුඩා සහ මධ්‍යම පරිමාණ යන්ත්‍ර වැඩිදියුණු කිරීම, පොල් කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා අවශය යන්ත්‍ර සූත්‍ර, මෙවලම් හඳුන්වා දීම යනාදිය 2017 වර්ෂය තුල ක්‍රියාවට නංවන ලද ව්‍යාපෘති අතර ප්‍රධාන වේ.

පසු ආතති පෙරසවි බැමි ඉදිකිරිම, ගෘහස්ථ ජීව වායු ඒකක ස්ථාපිත කිරිම, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරිම සඳහා අවශ්‍ය යන්ත්‍ර සහ සෞඛ්‍ය ආරක්ෂිත තල් වියලනය වැඩිදියුණු කිරිම යනාදිය 2017 වසර තුල ක්‍රියාවට නංවනු ලැබූ ප්‍රධාන නියමු ව්‍යාපෘති අතර වේ.

පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතින්ට අමතරව නර්ඩ් මධ්‍යස්ථානය විසින් කර්මාන්ත සඳහා අවශ්‍ය ප්‍රධාන ඉංජිනේරුමය ක්ෂේත්‍රයන්ට අදාලව ඉංජිනේරු සේවාවන් සැපයීම ද, කර්මාන්තකරුවන් සඳහා විශේෂ තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම, කර්මාන්තකරුවන්, විවිධ වෘත්තිකයන්, ව්‍යවසායකයින් සහ ආධුනිකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, මහා පරිමාණ සහ කුඩා පරිමාණ කර්මාන්තවල භාවිතාවන යන්ත්‍ර සූත්‍ර ප්‍රශස්ථ ලෙස භාවිතා කිරිම සඳහා තාක්ෂණ සේවා සැපයීම, ඉංජිනේරු සැළසුම් හා නිර්මාණයන් සැකසීම, කර්මාන්තශාලාවල කාර්මික ක්‍රියාවලි අධීක්ෂණය සහ විසඳුම් ලබා දීම, විද්‍යාගාර පරීක්ෂණ සේවා සැපයීම, පරිසර කලමනාකරණ සේවා සැපයීම් යනාදිය ද සිදුකරනු ලබයි. තාක්ෂණ පැවරුම් සහ තාක්ෂණය ප්‍රචලිත කිරිමේ වැඩසටහන් අඛණ්ඩව වාර්ෂිකව සිදුකරනු ලබන අතර වාර්ෂික ඉංජිනේරු සහ තාක්ෂණ විවෘත දින ප්‍ර දර්ශනය සහ පර්යේෂණ සමුළුව පැවැත්වීම 2017 වසරේ ඔක්තෝබර්, නොවැම්බර් මාසවලදි සිදුකරන ලදි.

අමාත්‍ය මණ්ඩලයේ ඉල්ලීම පරිදි පසුගිය වසර 20 තුල නර්ඩ් ආයතනය විසින් ඉදිකරන ලද අඩුවියදම් තාක්ෂණය සහිත ගොඩනැගිලි පිළිබඳ විශේෂ වාර්තාවක් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සහයෝගය ද ඇතිව සකස් කරමින් එම විශේෂ වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්තාව පදනම් කරගනිමින් ඉදිරි වසර තුන තුළ රුපියල් මිලියන 900ක වියදමින් නර්ඩ් තාක්ෂණය භාවිතයෙන් කුඩා අඩි පාලම් 1000ක් ඉදිකිරිමට සහ රුපියල් මිලියන 50 ට වඩා අඩු වටිනාකමින් යුත් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරිම, නර්ඩ් තාක්ෂණය භාවිතයෙන් සෘජුවම සිදු කිරීම සඳහා 2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. ඒ අනුව අඩි පාලම් ඉදිකිරීම් තාක්ෂණය සම්බන්ධ දැනුවත් කිරිමේ වැඩසටහන් පවත්වන ලදි. මධ්‍යස්ථානය විසින් සංවර්ධනය කරනු ලැබූ තාක්ෂණයන් රට පුරා ප්‍රචලිත කිරිම සඳහා මෙය මහගු අවස්ථාවන් වනු ඇත.

මධ්‍යස්ථානය විසින් බොහෝ සමාජ සත්කාරක කාර්යයන් හි 2017 වසරේ දී නියෙලුනු අතර ඒවා අතරින් අයගම සහ කළවාන ප්‍රදේශවල පැවති ගංවතුර සහ නායයාම් වලින් අවතැන් වූ ජනතාවට අවශ්‍යය තාක්ෂණික හා ඉංජිනේරුමය සේවාවන් ක්ෂණිකව ලබාදීමට දැක්වූ දායකත්වය ප්‍රමුඛ විය.

දිගින් දිගටම පෙන්වා දෙන පරිදි රාජ්‍ය අංශයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන් හි පර්යේෂණ ඉංජිනේරුවන් සඳහා පවතින අඩු වැටුප් හා දීමනා පරිපාටීන් තුළ දක්ෂ පර්යේෂණ ඉංජිනේරුවන් මධ්‍යස්ථානයේ සේවයට බඳවා ගැනීමේ සහ රඳවා ගැනීමේ පවතින දැඩි දුෂ්කරතාවය, මධ්‍යස්ථානයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා අහිතකර ලෙස බලපා ඇත. කෙසේ වෙතත් මධ්‍යස්ථානය අනාගත අභියෝගවලට මුහුණ දිමේ ක්‍රමෝපායක් ලෙස මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා දේශීය සහ විදේශීය වශයෙන් අවස්ථා ලබා දීම මගින් ඔවුන් දිරිමත් කිරිම සහ මධ්‍යස්ථානයේ සේවයේ රඳවා ගැනීමේ නිරන්තර උත්සාහයක් දරණු ලබයි. අදාල ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් තරගකාරී සහ ආකර්ශණීය වැටුප් හා දිරි දීමනා පරිපාටියක් හඳුන්වා දෙමින් රජයේ පර්යේෂණ ආයතන වල ඉංජිනේරුවන් දිරිමත් කිරිමට ප්‍රතිපත්ති සම්පාදනය කරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට කාලය පැමිණ ඇත. එය දැනුම් පදනම් වූ ආර්ථිකයක් තුළ සිදුකළ යුතු වැදගත් ක්‍රියා මාර්ගයකි.

මධ්‍යස්ථානයේ ඉහත සඳහන් සියලු කර්තව්‍යයන් සාර්ථකව මෙහෙයවමින් රටේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනයක් වශයෙන් මෙම මධ්‍යස්ථානය පත්කිරීම උදෙසා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්, ඉංජි. ඩී ඩී. ආනන්ද නාමල් මහතා විසින් ලබාදෙන දායකත්වය හා කැපවීම බෙහෙවින් ප්‍රශංසනීය වේ. එමෙන් ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන්නා වූ මාර්ගෝපදේශයන් සහ සහයෝගය ද කෘතවේදීව සිහිපත් කරමි. තව ද 2017 වසරේදී මධ්‍යස්ථානයේ අරමුණු ලඟාකරගැනීම සඳහා දායකත්වය ලබාදුන් මධ්‍යස්ථානයේ ඉහළ කළමණාකාරීත්වය, අධ්‍යක්ෂවරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, පර්යේෂණ කාර්යමණ්ඩලය, තාක්ෂණික කාර්යමණ්ඩලය සහ අනෙකුත් සහායක කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුද කිරිමට මෙය අවස්ථාවක් කරගනිමි.



ඉංජි. ඩබ්. ජේ. එල්. එස්. ප්‍රනාන්දු
සභාපති

04. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය

සභාපති

ඉංජි. ඩබ්.ජේ.එල්. එස්. ප්‍රනාන්දු මයා
B Sc(Hon)Eng., M Eng., FIESL, MIET, C Eng.

අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. ඩී.ඩී.ඒ. නාමල් මයා
M Eng. (Energy Technology), B Sc Eng. (Hons), C Eng., MIE(SL)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)

ඉංජි. ජී.කේ.කේ.ඒ ද සිල්වා මයා
M Sc (Building Technology), B Sc Eng (Hons), C Eng., MIE (SL)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සේවා)

ඒ. එච්. පියසිරි මයා
M Sc (Management of Technology), B Sc Eng. (Hons)

ඉංජිනේරු සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තු වශයෙන්

කෘෂි ඉංජිනේරු සහ යන්ත්‍ර සංවර්ධන දෙපාර්තමේන්තුව	සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ (තාක්ෂණික) ඉංජි. කේ.වයි.එච්.ඩී. ශාන්ත මයා MSc Eng., BSc Eng., AMIE(SL)	**අධ්‍යක්ෂ (තාක්ෂණික)** ඉංජි. ජේ.ඒ.සී. ක්‍රිෂාන්ති මිය BSc Eng.,C Eng., MIE(SL)
ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු වයි.එම්.එම්.කේ. රණතුංග මිය NDT ඉංජි. ඒ.ජේ.ජී.එස්. දහනායක මයා BSc Eng., C Eng., MIE(SL) **ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ** ආචාර්ය කේ.එම්.ඩබ්. රජවත්ත මිය - 2017.09.01 දක්වා PhD., MSc., BSc. **ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු** ඉංජි. පී.එම්.වයි.එස්. පතිරාජ මිය BSc Eng., MSc., AMIE (SL) **පර්යේෂණ ඉංජිනේරු** ඉංජි. එස්.ඒ.පී. ශලින්ද සිල්වා මයා BSc Eng., M Eng., AMIE (SL) ඉංජි. පී.එස්.එෆ්. පෙරේරා මයා BSc Eng., MEng., AMIE (SL)	**ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු** ඉංජි. ඩබ්.ඩබ්.පී.කේ. පෙරේරා මයා M Eng., BSc Eng. (Hons), C Eng., MIE(SL) **ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ** ආචාර්ය. එස්.එම්. යං මෙනවිය - 2017.07.12 දක්වා PhD, M Phil, MSc., BSc. **පර්යේෂණ ඉංජිනේරු** ඉංජි. අයි.පී. බටුවිට මයා B Sc Eng., AMIE(SL) **ඉංජිනේරු** කේ.එස්.එස්. වීරසිංහ මිය Special Apprentice (Civil Eng.), IESL (Part I)

බලශක්ති හා පාරිසරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

පර්යේෂණ විද්‍යාර්ථී/ දෙපාර්තමේන්තු ප්‍රධානී

ඉංජි. ජේ.ඒ.ඒ.ඩී. ජයසූරිය මයා
M Eng., BSc Eng., MIE(SL)

පර්යේෂණ විද්‍යාර්ථී

ඉංජි. ඩබ්.කේ.ආර්. පීරිස් මයා
MA (Buddhist Stud), BSc Eng., C.Eng. MIE(SL)

ඉංජි. ඊ. ඒ. එන්.කේ. එදිරිසිංහ මයා
MPhil, BSc Eng., MIE(SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. එච්.එම්.එල්.යූ. හේරත් මයා
BSc Eng., AMIE(SL)

ආචාර්ය ඒ.එස්.කේ. වරාහේන මයා - 2017.09.30 දක්වා
PhD, M Eng., BSc Eng.

පර්යේෂණ ඉංජිනේරු

ඊ.බී.යූ.සී. කුමාර මයා - 2017.01.30 දක්වා
BSc Eng. (Hons)

ඉංජි. එන්.එම්.ජේ.එස්. නිස්සංක මයා
BSc Eng, AMIE(SL) - 2017.09.04 දක්වා

ඉංජි. පී.කේ.එස්. ලක්මාලි මෙනවිය
BSc Eng, AMIE(SL) - 2017.03.01සිට 2017.11.30 දක්වා

විදුලි හා විද්‍යුත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

පර්යේෂණ විද්‍යාර්ථී/ දෙපාර්තමේන්තු ප්‍රධානී

ඉංජි. එන්.ජී.ඩී. විජේසිරිවර්ධන මිය
M Eng., C Eng., MIE(SL)

ජ්‍යෝෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. යූ.සී. බොතේජු මයා
BSc Eng. C Eng., MIE(SL)

පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. ඩී.ආර්.එස්.කේ. විමලරත්න මිය
BTech Hons, AMIE(SL)

වයි.එම්.ඒ.ජී.එස්.පී.කේ. කුලරත්න මෙනවිය
BSc Eng. - 2017.02.03 දක්වා

ඉංජි. වයි.එස්.පී. වීරසිංහ මයා
BSc Eng. AMIE(SL)

ඉංජි. එච්.සී. ගනේගේ මිය - 2017.11.03 දක්වා
BSc Eng. AMIE(SL)

ඉංජි. එච්.කේ.අයි.එස්. ලක්මාල් මයා - 2017.01.02 සිට
BSc Eng. AMIE(SL

මෙකට්‍රොනික්ස් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ (තාක්ෂණික)

ඉංජි. ඩී.එම්. පුංචිබණ්ඩා මයා
BSc Eng., AMIE(SL)

ජ්‍යෝෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. එච්.පී.එච්. කුමාර මයා
MSc Eng., EC(UK) PART I & II, AMIE(SL)

පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. එස්.එම්.එස්. සේනාරත්න මයා
B Tech, AMIS(SL)

ඉංජි. ජී.එම්.පී.එම්. රාජකරුණා මයා
BSc Eng., AMIE(SL)

ඉංජි. ඩබ්.එම්.එස්.පී.කේ. වනසිංහ මයා
B Tech., AMIE(SL)

ඉංජි. එම්.ඒ.ටී.එම්. කුමාර මයා - 2017..01.09 සිට
BSc Eng., AMIE(SL)

බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව

පර්යේෂණ විද්‍යාර්ථී /දෙපාර්තමේන්තු ප්‍රධානී

ඉංජි. කේ.ටී. ජයසිංහ මයා
M Eng., BSc Eng., C Eng., MIE(SL)

ජ්‍යෝෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. එන්.පී.ටී. පෙරේරා මෙනවිය
MSc, BSc Eng. (Hons.), AMIE(SL)

ඉංජි. ඒ.ජී.එම්.ටී. සිරිවර්ධන මෙනවිය
MSc, MEng, BSc Eng., AMIE(SL)

පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. එම්.ඩී. සහර්දීන් මයා
BSc Eng., AMIE(SL)

ඉංජි. කේ.පී.ඩී.ඩී. ජයසේකර මයා
BSc Eng.(Hons), AMIE(SL)

ඉංජි. ටී.කේ. ගීගනගේ මයා
BSc Eng. AMIE(SL)

ඉංජි. ජී.එස්.ආර්. කොස්තා මිය
BSc Eng, AMIE(SL)

ඉංජිනේරු

එච්.ඩී.සී. හෙට්ටිආරච්චි මිය
NDT

තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව	සංවර්ධන හා ව්‍යාපෘති දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ (තාක්ෂණික) - 2017.03.06 දක්වා ඉංජි.එම්.ඒ.එම්. ප්‍රනාන්දු මයා PG Dip (Energy) IESL Part I & II, CEng., MIE (SL)	**වැ.බ අධ්‍යක්ෂ (තාක්ෂණික)** ඉංජි. කේ.වයි.එච්.ඩී. ශාන්ත මයා MSc Eng., BSc Eng., AMIE(SL)
අධ්‍යක්ෂ (තාක්ෂණික) - 2017.03.07 සිට ඉංජි. ඒ.ඒ.එස්.පී. ජයසිංහ මයා BSc Eng.(Hons), MBA, MIE(SL)	**ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු** ඩබ්.පී.ආර්.ඩී. වීරසිංහ මයා NDT, CEI PART I, IESL PART I
ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු ඩී.වී. විමලසේන මයා - 2017.02.22 දක්වා NDT, Dip in Marketing (SL)	**පර්යේෂණ ඉංජිනේරු** ඉංජි. ඒ.එන්.එස්. අමරදාස මයා BSc Eng., AMIE(SL)
පර්යේෂණ ඉංජිනේරු ජේ.ඩී.එම්.එච්. ජයන්තා මෙනවිය BSc Eng, AMIE(SL)	**ඉංජිනේරු** ඩී.එම්.ඒ.කේ. දිගල මිය Special Apprentice (Civil Eng.), IESL(Part 1)
පර්යේෂණ විද්‍යාඥ බී.ඩී.පී.එස්. රණවීර මිය BSc.	ඩබ්.ඒ.ඩී.එල්.එස්. කරුණාවර්ධන මයා HNDE
අලෙවි නිලධාරී එස්. විජේසූරිය මයා - 2017.06.20 දක්වා MBS, BSc (Agriculture) Sp.	පී.ඒ.යූ.ඩබ්.කේ. පරණගම්පොල මයා NDES
සහකාර අධ්‍යක්ෂ - අලෙවි පී.එන්.ඩී. පතිරණ මිය - 2017.02.01 සිට BSc (Hons) Sp. MCIM (UK), MSLIM (SL)	**ගෘහ නිර්මාණ ශිල්පී** බී.ඩී.ආර්. වාමිකා මිය MSc, BSc.
තාක්ෂණික ඉන්කියුබේටර් අංශය	**නඩත්තු ඒකකය හා මධ්‍යම වැඩහල**
ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු/අංශ භාර නිලධාරී ඉංජි. ඒ.ආර්.සී. සල්ගාදු මයා BSc Eng, AMIE(SL)	**ඉංජිනේරු** එන්.ඒ.ඩී.ඩී.ජේ. ප්‍රසන්න මයා NDT
පර්යේෂණ ඉංජිනේරු ඉංජි. සුරේශ් පී පෙරේරා මයා EC (UK) Part I & II, NDT, AMIE(SL)	**පාලක - වැඩහල** ඩබ්.එච්.එස්. රමල් මයා - 2017.05.08 දක්වා NDES
තාක්ෂණ උද්‍යානය සහ ඉංජිනේරු කෞතුකාගාරය	
පාලක - තාක්ෂණ උද්‍යානය ඒ.ඒ.එන්.එස්. අධිකාරි මයා BSc (Computer Science), Diploma in IT (UK)	
පාලක - ඉංජිනේරු කෞතුකාගාරය ඩී.කේ. ජයවීර මිය - 2017.11.01 සිට BSc (Hons.)	
මානව සම්පත් දෙපාර්තමේන්තුව	**මූල්‍ය දෙපාර්තමේන්තුව**
අධ්‍යක්ෂ (මානව සම්පත්) ඩී.ඒ.එම්. මුණසිංහ මිය BSc (HRM), MBA (HRM), AM(IPM)	**අධ්‍යක්ෂ - මූල්‍ය** ඩී.වී.එස්. පෙරේරා මිය ICMA Professional Part II, IPFA, ICEA
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ආර්. ගමගේ මයා BA (Social Sc.) Sp., MA in Sociology	**ගණකාධිකාරි** ජේ.එම්.ආර්.එස්. ජයසිංහ මයා BBA (Busi. Admin) Sp. , MBA, ICASL – Prof. Part I
තොරතුරු තාක්ෂණ අංශය	**පුස්තකාලය**
ජාල පරිපාලක බී.පී. වික්‍රමසූරිය මයා BSc (Computing & Infor. Systems)	**පුස්තකාලයාධිපති** ඩී.එම්.ටී.පී.කේ. දේවගිරි මිය BA (Library Science) Sp., MSc, ASLLA
අභ්‍යන්තර විගණන අංශය	**ප්‍රසම්පාදන අංශය**
අභ්‍යන්තර විගණක බී.පී. සුසන්ත මයා HNDA	**සැපයුම් නිලධාරී** ආර්.එච්.ඒ. ජීවානන්ද මයා BSc (Physical Science)

05. මානව සම්පත් කලමනාකරණය

ආයතනයක අරමුණු, පරමාර්ථ ළඟාකරගැනීමේදී එම ආයතනය සතු මානව සම්පත සුවිශේෂී වේ. පර්යේෂණ ආයතනයක මෙය ප්‍රධානතම සාධකය වේ. මධ්‍යස්ථානයේ සිදු කරනු ලබන පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතීන්, වානිජ්‍ය ව්‍යාපෘතීන්, තාක්ෂණික සේවා සැපයීම් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම යනාදී මූලික කාර්යයන්හි සාර්ථකත්වය මුළුමනින්ම රඳා පවතිනුයේ දැනුම සහ නිපුණතා සපිරි කාර්ය මණ්ඩලය මතවේ. ඒ අතුරින් ඉංජිනේරු හා තාක්ෂණික කාර්ය මණ්ඩලය ප්‍රමුඛ වේ.

රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනයන්හි පවතින අඩු වැටුප් හා දීමනා හේතුවෙන් සුදුසුකම් ලත් ඉංජිනේරු පර්යේෂකයින් හා තාක්ෂණික කාර්ය මණ්ඩලය බඳවාගැනීම සහ රඳවාගැනීම, මධ්‍යස්ථානයේ මානව සම්පත් කළමනාකරණයේදී මුහුණදී ඇති ප්‍රධාන ගැටළුව වේ. මෙම ගැටළුවට පිළියම් ලෙස පර්යේෂණ වැඩසටහන් සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් පැවතීම, පර්යේෂණ භාවිතයන් ජාතික සංවර්ධන කාර්යයන් සඳහා අදාළ කරගැනීම, ඉංජිනේරු පර්යේෂකයින් රාජ්‍ය අංශය සඳහා බඳවාගැනීමේදී පෞද්ගලික අංශයට සාපේක්ෂව තරගකාරී වැටුප් හා ප්‍රතිලාභ ලබාදීම, දේශීය හා විදේශීය වශයෙන් පුළුල් පුහුණු හා සංවර්ධන අවස්ථාවන් ලබාදීම යනාදී කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයකින් කටයුතු කරනු ලැබිය යුතු වේ.

කෙසේ වෙතත්, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවතින තත්වයන් හා සීමාවන් යටතේ ධාරිතා සංවර්ධන වැටසටහන් (උදා - උසස් අධ්‍යාපන අවස්ථාවන්/ පුහුණු හා සංවර්ධන අවස්ථාවන්/ ජාත්‍යන්තර වැඩමුළු සම්මන්ත්‍රණ සඳහා යොමු කිරීම යනාදිය) පහසුකම් සහිත වැඩ පරිසරයක් ඇතිකරලීම, රැකියා සංවර්ධන අවස්ථාවන් සඳහා පහසුකම් සළසාදීම යනාදී වූ විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කරමින් නිපුණතා සපිරි පර්යේෂකයින්, බඳවාගැනීම සහ ඔවුන් සේවයේ රඳවාගැනීම සඳහා වූ හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගනිමින් පවතී.

මධ්‍යස්ථානයේ 2017 වර්ෂයේ (2017.12.31 දිනට) **සමස්ථ කාර්යමණ්ඩල තොරතුරු සාරාංශය පහත පරිදි වේ.**

සේවා බාන්ඩය	සංඛ්‍යාව
ඉහළ කළමනාකරණ මණ්ඩලය	3
ඉංජිනේරු කාර්ය මණ්ඩලය	45
විධායක කාර්ය මණ්ඩලය	10
කණිෂ්ඨ කළමණාකාර කාර්ය මණ්ඩලය	10
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	23
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	51
ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය	138
එකතුව	**280**



5.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

5.1.1 2017 වර්ෂය තුල සිදුකළ නව බඳවාගැනීම්

	නම	තනතුර	සේවා කාණ්ඩය	බඳවාගත් දිනය
1	එම්.එල්.එස්.එස්.එස්. ගුණරත්න මයා	විදුලි කාර්මික	PL 3	2017.01.02
2	එන්.කේ.අයි.එස්. ලක්මාල් මයා	පර්යේෂණ ඉංජිනේරු	AR 1	2017.01.02
3	එස්.ඒ.ටී.එම්. කුමාර මයා	පර්යේෂණ ඉංජිනේරු	AR 1	2017.01.02
4	පී.එන්.ඩී. පතිරණ මිය	සහකාර අධ්‍යක්ෂ (අලෙවි)	MM 1-1	2017.02.01
5	ජේ.එම්.ඒ.යූ. ජයසේකර මයා	විදුලි කාර්මික	PL 3	2017.02.15
6	ඩබ්.එම්.එම්.ආර්.බී. සමරසිංහ මයා	වැද්දුම්කරු	PL 3	2017.02.15
7	ජේ.ඩී.එම්.එච්. ජයන්තා මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	AR 1	2017.03.01
8	පී.කේ.එස්. ලක්මාලි මිය	පර්යේෂණ ඉංජිනේරු	AR 1	2017.03.01
9	ජේ.එම්.එච්.යූ. බණ්ඩාර මයා	කාර්මික සහකාර	MA 2-2	2017.04.03
10	එච්.ආර්.ඒ.එන්. කුමාර මයා	කාර්මික සහකාර	MA 2-2	2017.04.04
11	එච්.ඒ.සී. හපුආරච්චි මයා	කාර්මික සහකාර	MA 2-2	2017.04.17
12	ටී.ටී.එස්.ආර්. රොද්‍රිගෝ මයා	කාර්මික සහකාර	MA 2-2	2017.04.21
14	ජී.ජී.කේ.එච්. කෞෂල්‍යා මෙනවිය	කාර්මික සහකාර	MA 2-2	2017.07.12
15	පී.එම්.ඩී. සඳරුවන් මයා	අලෙවි නිලධාරී	JM 1-2	2017.10.02
16	එච්.වයි.ඩී. රණසිංහ මයා	කාර්මික සහකාර	MA 2-2	2017.10.02
17	එච්.ආර්. හෙන්ද්‍රික්ස් මයා	කාර්මික සහකාර	MA 2-2	2017.10.02
18	ඩී.කේ. ජයවීර මිය	පාලක - ඉංජි. කෞතුකාගාරය	JM 1-2	2017.11.01

5.1.2 2017 වර්ෂය තුල සිදුකළ අභ්‍යන්තර බඳවාගැනීම්

	නම	පැවති තනතුර	නව තනතුර	දිනය
1	ඊ.ඒ. එන්. චන්දන මයා	කාර්මික සහකාර	කාර්මික නිලධාරී	2017.05.02
2	ඉංජි. ඩී.එම්. පුංචිබන්ඩා මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	අධ්‍යක්ෂ - තාක්ෂණික	2017.09.01
3	ආචාර්ය කේ.එම්.ඩබ්. රජවත්ත මිය	ජේෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ	ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ	2017.09.01

5.1.3 2017 වර්ෂය තුල සේවයෙන් විශ්‍රාම ගැනීම්

	නම	තනතුර	සේවා කාණ්ඩය	විශ්‍රාම ගත් දිනය
1	ඩී.වී. විමලසේන මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	HM 1-3	2017.02.22
2	ඉංජි. එම්.ඒ.එම්. ප්‍රනාන්දු මයා	අධ්‍යක්ෂ (තාක්ෂණික)	HM 1-3	2017.03.06
3	බී.ඩී. ගුණදාස මයා	මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු	PL - 3	2017.03.13
4	එම්.ජී.කේ. අබේරත්න මයා	කම්කරු	PL - 3	2017.05.21
5	ඩබ්.ඩබ්. ආර්. මෙන්ඩිස් මයා	වැද්දුම්/පෑස්සුම්කරු	PL - 3	2017.06.11
6	එම්.පී.ඩබ්.පී. කුලසේකර මයා	වාත්තුකරු	PL - 3	2017.07.28
7	ඒ.එස්.වී.ජේ. පෙරේරා මයා	කම්කරු	PL - 3	2017.08.08
8	එම්. පියසේන මයා	රිය සහායක	PL - 3	2017.08.28

5.1.4 2017 වසර තුල සේවයෙන් ඉල්ලා අස්වීම්

	නම	තනතුර	සේවා කාණ්ඩය	ඉල්ලා අස්වූ දිනය
1	ආර්.එම්.ආර්.එස්. විජේබණ්ඩාර මයා	විදුලි කාර්මික	PL - 3	2017.01.08
2	බී.යූ.සී.කේ. එඩේරආරච්චි මයා	පර්යේෂණ ඉංජිනේරු	AR 1	2017.01.30
3	වයි.එම්.ඒ.ජී.එස්.පී. කුලරත්න මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	AR 1	2017.02.03
4	පී.ආර්.සී.පී.ඩබ්. පරණවිතාන මයා	කාර්මික නිලධාරී	JM 1-2	2017.02.05
5	කේ.ආර්.ටී. ඉෂාරා මෙනවිය	කාර්මික සහකාර	MA 2-2	2017.03.23
6	ඩබ්.එච්.එස්.ආර්. සිල්වා මයා	පාලක - වැඩබල	JM 1-2	2017.05.08
7	එච්.ආර්.ඒ.එන්. කුමාර මයා	කාර්මික සහකාර	TA	2017.06.01
8	අයි.ඩී.එන්. ප්‍රේමකුමාර මයා	කම්කරු	PL - 3	2017.06.02
9	එස්.එච්.ඒ.සී. දයාරත්න මයා	කාර්මික සහකාර	MA 2-2	2017.06.09
10	ආචාර්ය එස්.එම්. යං මෙනවිය	ජ්‍යේෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ	AR -2	2017.07.12
11	ජී.එම්. සංගීත් මයා	පුස්තකාල සහායක	PL - 1	2017.07.14
12	එම්.ඩී.පී.එස්.කේ. ජයතිලක මයා	සැළසුම් ශිල්පී	MA 2-2	2017.07.16

	නම	තනතුර	සේවා කාණ්ඩය	ඉල්ලා අස්වූ දිනය
13	ඒ. මංජුලා දමයන්ති මිය	කාර්යාල සහායක	PL - 1	2017.08.15
14	එන්.එම්.ජේ.එස්. නිස්සංක මයා	පර්යේෂණ ඉංජිනේරු	AR 1	2017.09.04
15	බී.ඩී.ටී.කේ. ප්‍රියංකර මයා	යන්ත්‍ර ශිල්පී	PL - 3	2017.09.28
16	ආචාර්ය ඒ.එස්.කේ. වරාහේන මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	HM 1-3	2017.09.30
17	එච්.සී. ගනේගේ මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	AR 1	2017.11.03
18	පී.කේ.එස්. ලක්මාලි මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	AR 1	2017.11.30
19	ටී. ගජේන්තිනී මිය	කළමණාකාරණ සහාකර (ප්‍රදර්ශක)	MA 1-2	2017.12.31
20	එච්.පී.එස්.පී. පරණමාන මයා	පැස්සුම්කරු	PL - 3	2017.12.31

5.2 මානව සම්පත් සංවර්ධනය

ආයතනය විසින් සෑම විටම මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රමුඛ අවධානය යොමු කරමින් ඒ සඳහා වූ පහසුකම් අඛණ්ඩව සැපයීමට නිරන්තර උත්සාහ ගනු ලැබේ. දැනුම, කුසලතා හා නිවැරදි ආකල්ප වර්ධනය කිරීම තුලින් නිපුණතා සපිරි ඵලදායී කාර්ය මණ්ඩලයක් නිරතුරුව මධ්‍යස්ථානය තුළ පවත්වාගැනීමට සෑම විටම ක්‍රියා කරනු ලැබේ. ඒ සඳහා ධාරිතාවය ගොඩනැංවෙන සහ දැනුම, කුසලතා, ආකල්ප, වර්ධනය කරලීමේ වැඩසටහන් සඳහා අදාළ කාර්යමණ්ඩලය යොමු කරවනුයේ ඔවුන්ගෙන් මධ්‍යස්ථානයට සිදුවන සේවාවන්, රාජාකාරී වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ලබාගැනීමේ අරමුණ මෙන්ම ඔවුන්ගේ පුද්ගල රැකියා සංවර්ධනයද ඉලක්ක කරගනිමිනි.

5.2.1 2017 වර්ෂයේදී නර්ඩ් මධ්‍යස්ථානය කාර්ය මණ්ඩලය සළසාදී ඇති පුහුණු හා සංවර්ධන අවස්ථාවන්

සේවා ඛාන්ඩය	පුහුණු අවස්ථාවන් සංඛ්‍යාව
ඉහළ කළමනාකරණ	6
ඉංජිනේරු	225
විධායක	51
කණිෂ්ඨ කළමනාකරණ	11
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	21
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	82
ප්‍රාථමික	60
එකතුව	**456**



5.2.2 කාර්යස්ථානයෙන් බැහැරව සිදුකරනු ලැබූ නේවාසික පුහුණු හා සංවර්ධන වැඩමුළු

ආයතනයට අලුතින් බඳවාගන්නා ලද කාර්ය මණ්ඩලයේ 27 දෙනෙකු සඳහා 2017 අප්‍රේල් 05 සහ 06 යන දිනයන්හිදී නේවාසික පුහුණු වැඩසටහනක් තාක්ෂණ උද්‍යානයේදී පවත්වන ලදි.

5.2.3 පශ්චාත් උපාධි /වෘත්තීය සුදුසුකම් සපුරාලීම සඳහා පහසුකම් සැළසීම

2017 වසර තුල පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම්

	නම සහ තනතුර	සුදුසුකම	ආයතනය	සම්පූර්ණ කරන ලද දිනය
1	ඉංජි. එස්.ඒ.පී.එස්. සිල්වා මයා පර්යේෂණ ඉංජිනේරු	M.Eng. Degree	මොරටුව විශ්ව විද්‍යාලය	2017/07/01
2	ඉංජි. පී.එෆ්.එස්. පෙරේරා මයා පර්යේෂණ ඉංජිනේරු	M.Eng. Degree	මොරටුව විශ්ව විද්‍යාලය	2017/09/01

2017 වසර තුල කරගෙන යනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාවන් හැදෑරීම

	නම සහ තනතුර	සුදුසුකම	ආයතනය	ආරම්භ කරන ලද දිනය	සම්පූර්ණ කිරීමට නියමිත දිනය
1	ජී.එස්.ආර්. කොස්තා මිය පර්යේෂණ ඉංජිනේරු	M.Eng./PG Diploma Pro.in Energy Technology	මොරටුව විශ්ව විද්‍යාලය	2016/02/06	2018/02/05
2	ආර්. ගමගේ මයා සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)	Master in Labouer Relations and Human Resources Management - 2016/17	කොළඹ විශ්ව විද්‍යාලය	2016/06/01	2018/05/31
3	බී.ඩී.පී.එස්. රණවීර මයා පර්යේෂණ විද්‍යාඥ	M.Sc Degree Programme in Industrial and Environmental Chemistry 2016/18	කැළණිය විශ්ව විද්‍යාලය	2016/06/18	2018/06/17
4	බී.පී. වික්‍රමසූරිය මයා ජාල පරිපාලක	M.Eng./PG Diploma in Information Tech. -2016	මොරටුව විශ්ව විද්‍යාලය	2016/10/22	2018/10/21
5	කේ.පී.ඩී.ඩී. ජයසේකර මයා පර්යේෂණ ඉංජිනේරු	M.Eng./PG Diploma in Environmental Eng. & Mgt.	මොරටුව විශ්ව විද්‍යාලය	2016/10/12	2018/10/21
6	බී.පී. සුසන්ත කුමාර මයා අභ්‍යන්තර විගණක	MPM Programme	SLIDA	2015/07/24	2018/07/30
7	අයි.පී. බටුවිට මයා පර්යේෂණ ඉංජිනේරු	PG Diploma/M.Eng in Highway &Traffic Eng.	මොරටුව විශ්ව විද්‍යාලය	2015/02/28	2018/12/31
8	එස්.එම්.එස්.එස්. සේනාරත්න මයා පර්යේෂණ ඉංජිනේරු	M.Sc/PG Diploma Course in Industrial Automation	මොරටුව විශ්ව විද්‍යාලය	2015/10/24	2018/10/31
9	ටී.කේ. ගිගනගේ මයා පර්යේෂණ ඉංජිනේරු	M.Sc/PG Diploma Course in Sustainable Process Eng.	මොරටුව විශ්ව විද්‍යාලය	2015/12/05	2018/05/30
10	ඒ.ඒ.එන්.එස්. අධිකාරි පාලක - තාක්ෂණ උද්‍යානය	MBA Degree (Master of Business Administration)	කොළඹ විශ්ව විද්‍යාලය	2015/11/28	2018/02/28
11	ඉංජි. ඒ ජී.ඒම්.ටී. සිරිවර්ධන මෙනවිය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	PhD Studites of Engineering and Computer Sciences	Australian National University	2017/11//01	2021/10/31

2017 වසර තුල වරලත් ඉංජිනේරු සුදුසුකම් සපුරාලීම

	නම	තනතුර	සාමාජිකත්වය	ආයතනය
1	ඉංජි. එච්.කේ.අයි.එස් ලක්මාල් මයා	පර්යේෂණ ඉංජිනේරු	ආශ්‍රිත සාමාජිකත්වය	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
2	ඉංජි. අයි.ඩී.එම්.එච්. ජයන්තා මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	ආශ්‍රිත සාමාජිකත්වය	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය

5.3 විදේශ ශිෂ්‍යත්ව/ සම්මන්ත්‍රණ/ පුහුණු වැඩසටහන්/ වැඩමුළු සඳහා සහභාගී වීම

	නම සහ තනතුර	වැඩසටහන	රට	කාලපරිච්ඡේදය
1	එන්.පී.ටී. පෙරේරා මිය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	Sakura Programme for Government Officials	ජපානය	2017/02/19-2017/02/25
2	ඒ.එච්. පියසිරි මයා නි. අධ්‍යක්ෂ ජනරාල් (සේවා)	2017 Seminar on Information and Communication Technology for Sri Lanka	චීනය	2017/04/03-2017/04/23
3	ඉංජි. ඩබ්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මයා සභාපති	International Workshop on Science, Technology, Innovation and Management for Water sustainability.	ඉන්දියාව	2017/04/19-2017/04/20
4	ඉංජි. ඒ.ජී.එම්.ටී. සිරිවර්ධන මෙනවිය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	Programme for Annual International Training Course (AITC) - Green Energy for Low Carbon Society	තායිලන්තය	2017/05/15-2017/05/29
5	ජී.කේ.කේ.ඒ. ද සිල්ව මයා නි.අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)	Ferro cement National Convention in Kerala	ඉන්දියාව	2017/05/12-2017/05/16
6	ඩබ්.පී.ආර්.ඩී. වීරසිංහ මයා ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු			
7	ඉංජි.ඩී.ඩී.ඒ. නාමල් මයා Eng. අධ්‍යක්ෂ ජනරාල්	Presidents Summit : Regional Conference on IP Hub Project	දකුණු කොරියාව	2017/06/21-2017/06/23
8	ඉංජි. ඒ.ඒ.එස්.පී. ජයසිංහ මයා අධ්‍යක්ෂ (තාක්ෂණික අලෙවි)			
9	ඩබ්.එම්.එස්.පී.කේ. වනසිංහ මයා පර්යේෂණ ඉංජිනේරු	WAITRO-ISESCO-SIRIM Research Fellowship Programme (WRFP) form October 23-November 03, 2017	මැලේසියාව	2017/10/23-2017/11/03
10	ඉංජි. ඩබ්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මයා සභාපති	13th Session of the Governing Council of the Committee of the Asian and Pacific Centre for Transfer of Technology (APCTT	පිලිපීනය	2017/11/28-2017/11/30

5.4 කාර්යස්ථ පුහුණු වැඩසටහන් සංවිධානය

	පුහුණු වැඩසටහන	දිනය	සේවා බාණ්ඩයන්	සහභාගී වූ සංඛ්‍යාව
1	Workshop on How to write a Manuscript	.2017/03/16	කළමනාකරණ සහ ඉහළ සේවා බාණ්ඩ	25
2	Quantification of GHG Emission and calculating Carbon Footprint according to ISO 14064-1,2,3 Standards	2017/03/29-30	කළමනාකරණ සහ ඉහළ සේවා බාණ්ඩ	35
3	හරිත ඵලදායීතාවය හා 5 S සංකල්පය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	2017/05/31	සමස්ථ කාර්ය මණ්ඩලය	119
4	Water Auditing, quantifying water footprint and water conversation & management techniques in industrial applications.	2017/06/06-07	කළමනාකරණ සහ ඉහළ සේවා කාණ්ඩ	31
5	Workshop on MS Word and MS Excel office tools	2017/09/13,22 , 27	කළමනාකරණ සහකාර	49
6	සුරක්ෂිතව රිය පැදවීම පිළිබඳ පුහුණු වැඩසටහන	2017/11/26	රියදුරු සහ මෝටර් කාර්මික	14
7	MS Project Management	2017/12/27-28	කළමණාකරණ සහකාර (තාක්ෂණික) සහ ඊට ඉහළ සේවා කාණ්ඩ	43

5.5 අනෙකුත් ප්‍රධානසමාජ සත්කාරක සේවාවන් - 2017

ආධුනිකයින් සඳහා වෘත්තීය/ කාර්මික පුහුණු අවස්ථාවන් සළසාදීම

විශ්වවිද්‍යාල හා පිළිගත් වෘත්තීය/කාර්මික පුහුණු ආයතනයන් විසින් යොමු කරනු ලැබූ ආධුනිකයින් 53 දෙනෙකු සඳහා මාස 3/ මාස 6 සහ වසරක වැනි කාල පරිච්ඡේදයන්ට අදාළව වෘත්තීය/ කාර්මික පුහුණු අවස්ථාවන් 2017 වර්ෂය තුල සළසාදී ඇත.

06. 2017 වර්ෂයේදී කාර්යසාධනය පිළිඹිමු කිරීම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ඉංජිනේරු, පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC), විසින් 2017 වර්ෂය තුලදී පර්යේෂණ සහ සංවර්ධන කටයුතු, නියමු ව්‍යාපෘති, තාක්ෂණයන් ප්‍රචලිත කිරීම, කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා සේවාවන් සැපයීම්, පාසල් දරුවන් අතර විද්‍යා දැනුම වැඩිකරලීම යනාදී කාර්යයන්හි ප්‍රධාන වශයෙන් නියෙලන ලදි.

මධ්‍යස්ථානයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු, වානිජ ව්‍යාපෘති, තාක්ෂණික සේවාවන් සැපයීම වඩාත් ඵලදායි හා කාර්යක්ෂම කිරීමේ අරමුනින් එහි මෙතෙක් පැවති දෙපාර්තමේන්තු ප්‍රතිසංවිධානය කර නව අංශයන්ද හඳුන්වා දෙන ලදි. ඒ අනුව සිවිල් ඉංජිනේරු, විදුලි හා විද්‍යුත් ඉංජිනේරු, කෘෂි ඉංජිනේරු සහ යන්ත්‍ර සංවර්ධන, සහ බලශක්ති හා පාරිසරික ඉංජිනේරු, මෙකාට්‍රොනික් ඉංජිනේරු, සංවර්ධන සහ ව්‍යාපෘති, බලශක්ති හා පාරිසරික සේවා, තාක්ෂණික සහ අලෙවි ලෙස දෙපාර්තමේන්තු ප්‍රතිසංවිධාන ගත කරන ලදි. මූලික වශයෙන් මධ්‍යස්ථානයේ සියළුම වාණිජ, ව්‍යාපෘති හා සේවාවන්, "සංවර්ධන සහ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව" සහ "බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව" මගින් ඉටු කිරීමත් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු අනෙකුත් තාක්ෂණික දෙපාර්තමේන්තු මගින්ද ඉටු කරණු ලැබේ. තවද තාක්ෂණික සහ අලෙවි දෙපාර්ථමේන්තුව යටතේ අළුතින් ආරම්භ කරන ලද තාක්ෂණික ඉංකියුබේටර් අංශය මගින් නව නිපැයුම්කරුවන්ට හා කර්මාන්තකරුවන්ට අවශ්‍ය තාක්ෂණික සේවාවන් සපයන අතර නව නිපැයුම් කරුවන්ගේ නව නිපැයුම් වාණිජ මට්ටම දක්වා සංවර්ධනය කිරීමට අවශ්‍ය තාක්ෂණික පහසුකම් සලසයි. 2017 වර්ෂය තුළ අපගේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ලෙස නව තාක්ෂණයන් හඳුන්වා දීම්, තාක්ෂණය හුවමාරු ක්‍රියාවලිය හරහා ඉදිකිරීම්, කෘෂිකාර්මික, කාර්මීක, බලශක්ති යනාදි ක්ෂේත්‍රයන්හි නව රැකියා අවස්ථා උත්පාදනය සඳහාද අවස්ථාව සැලසී ඇත.

6.1 ආයතනය මගින් 2017 වර්ෂයේ සිදු කරන ලද ප්‍රධාන කාර්‍යයන් පහත දැක්වේ.

6.1.1 අයගම සහ කලවාන යන ප්‍රදේශවල ගං වතුර සහ නායයෑම්වලින් අවතැන් වූ ජනතාවට අවශ්‍ය ක්ෂනික තාක්ෂණික සේවාවන් ලබාදීම සඳහා දායකවීම.

2017 මැයි මාසයේදී කලවාන සහ අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සිදු වූ නායයාම් සහ ගංවතුර නිසා විපතට පත්වූවන් සඳහා අවශ්‍යය වූ ඉංජිනේරු සේවාවන් ලබා දීමෙන් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට දායකත්වය දෙන ලදි. මෙම ප්‍රදේශවල ක්ෂණික සහන ලබාදීම සඳහා පත් කරන ලද ජනාධිපති කාර්‍ය සාධක බලකායේ ඉල්ලීම මත අප ආයතනයේ නිලධාරීන් සහ සේවක මහතුන් විසින් අත්‍යාවශය යටිතල පහසුකම් ක්ෂණිකව පිළියෙල කරදීම හා ලබාදීමට කටයුතු කරන ලදි. ඒ අනුව

- පොතුපිටිය හා කලවාන ප්‍රජා ජලසම්පාදන ව්‍යාපෘතිය, පවුල් 150 දක්වා යථා තත්වයට පත් කරන ලදි.
- අයගම පොලිස් ස්ථානය පවත්වාගෙන යාමට සුදුසු ලෙස අයගම බස්නැවතුම්පලේ උඩුමහල සකස් කරණ ලදි.
- ගංවතුර සහ නායයෑම් ලක් වූ කලවාන සහ අයගම කොට්ඨාශ තුල පිහිටි පාසැල් ගොඩනැගිලි නැවත භාවිතා කල හැකිද යන්න පිළිබඳව වාර්තා සකසා අදාල බලධාරීන් වෙත ඉදිරිපත් කිරීම.
- ගංවතුරින් අනතුරට පත් වූ අයගම විහාරස්ථානයේ දහම් පාසල් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය සියළු තාක්ෂණික උපදෙස් සහ අදාල සැලසුම් ලබාදෙන ලදි.
- අයගම මහ රෝහලේ හානියට පත් ජල සම්පාදන ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම යනාදිය ප්‍රධාන කාර්යයන් විය.

නායයෑම් නිසා පොතුපිටිය සහ කලවාන ප්‍රදේශයට හානි සිදු වූ ජල සම්පාදන ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීම.



අයගම දානශාලාව, විහාර මන්දිරය සහ ගංගාරාමය ප්‍රතිසංස්කරණය

අයගම බස් නැවතුම්පළ ගොඩනැගිල්ල සකස්කරදීම

6.1.2 තාක්ෂණික ඉන්කියුබේටර් අංශය ස්ථාපිත කිරීම.

ජාතික විද්‍යා දිනයට සමගාමීව කර්මාන්ත ක්ෂේත්‍රයට හා නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික සේවා ලබාදීම අරමුණු කරගෙන ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ සහභාගීත්වයෙන් මධ්‍යස්ථානයේ තාක්ෂණික ඉන්කියුබේටර් අංශය 2017.11.19 දින විවෘත කරන ලදි.

තාක්ෂණික ඉන්කියුබේටර අංශයෙන් ලබා ගත හැකි ප්‍රධාන පහසුකම් වනුයේ;

- අන්තර්ජාල පහසුකම් සහිත නව නිපැයුම්කරුවන් සහ වෙනත් බුද්ධිමය ජාලකරණය.
- නවතම CAD / CAM මෘදුකාංග සමඟ සැලසුම් පහසුකම්.
- නූතන CNC යන්ත්‍ර සමඟ නිෂ්පාදන පහසුකම්.
- ව්‍යාපාර සැලසුම් සංවර්ධනය සඳහා සහාය ලබා දීම.
- බුද්ධිමය දේපල පිළිබඳ ගැටළු පිළිබඳ උපදේශකත්වය.
- නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳ උපදේශනය.
- ආධාර සහ අරමුදල් නියෝජිත ආයතන සඳහා ජාල පහසුකම් සැපයීම.

ඉන්කියුබේටර් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල වනුයේ;

- හඳුන්වා දෙනු ලබන නව නිෂ්පාදන සංඛ්‍යාව වැඩි කිරීම.
- වර්ෂයකට නිකුත් කරණු ලබන පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව වැඩි කිරීම.
- අපනයනය කරන ලද භාණ්ඩ වැඩි කිරීම හා ඒ තුලින් වන විදේශ විනිමය වැඩි කිරීමට දායකවීම.
- නව ව්‍යාපාර අවස්ථා උදා කිරීමට දායකවීම.
- මධ්‍යස්ථානය විසින් ලබා දෙන තාක්ෂණික සේවාවන් වැඩි කිරීම.
- තාක්ෂණික සේවාවන් ලබා ගැනීම සඳහා වන පරිශීලකයන් ගණන වැඩි කිරීම.
- මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබන තාක්ෂණික පුහුණු කරීම් වැඩි කිරීම.

6.1.3 ආයතනික තේමා ගීතය සහ නව ලාංජනය එළි දැක්වීම

මධ්‍යස්ථානයේ දැක්ම, මෙහෙවර, හා අරමුණු නිරූපණය වන පරිදි නිර්මාණය කරණ ලද ආයතනික තේමා ගීතය සහ ලාංජනය 2017/11/19 දින ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ඇමති තුමා විසින් එළි දක්වන ලදි. ආයතනය පිළිබඳ සේවක හැඟීම් වර්ධනය සහ ආයතනික අනන්‍යතාවය වර්ධනය කිරීම මෙහි අරමුණ විය.



ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ තේමා ගීතය

ලෝකය ජයගන්න
ලොවම දිනාගන්න
ඉන්දියානු සාගරයෙන් එතෙරට
යන්නට සැරසෙන්න
නෙළා දෙන්න දෝතින්
ඉංජිනේරු පර්යේෂණ අස්වැන්න ....

"යමු යමු පෙරටම ජය ගැන නැත සංකා
අපේ හදවතයි "නර්ඩ්" ශ්‍රී ලංකා"

අනුරපුරය පුලතිසිපුර දඹදෙණිය
මුළු ලොව විස්මිත කළ ඒ සීගිරිය
අපට උරුම කළ දැනුමේ ආකරය
මුතු පවුරක් බැඳ සුරකී සාගරය

"යමු යමු පෙරටම ජය ගැන නැත සංකා
අපේ හදවතයි "නර්ඩ්" ශ්‍රී ලංකා"

සියක් මහල් නිල් අහසට හිමි කරමු
ඇල දොළ වැව් ඉදිකර බිම සරු කරමු
නව නිපැයුම් මැද පරිසරය ද රකිමු
විදුලි වේගයෙන් රට පෙරටම යවමු

"යමු යමු පෙරටම ජය ගැන නැත සංකා
අපේ හදවතයි "නර්ඩ්" ශ්‍රී ලංකා"

බී වී කේ ධම්මික බණ්ඩාර
නිදහස් මාවත
දම්බොක්ක
බෝයගනේ

6.1.4 කුඩා පාලම් 1000 ක් (අඩි පාලම්) ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබීම.

දිවයිනේ ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රවාහන දුෂ්කරතා අවම කිරීම මගින් ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩලය විසින් නර්ඩ් තාක්ෂණය භාවිතයෙන් කුඩා පාලම් 1000ක් අවුරුදු 3ක් තුල ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. රු. මිලියන 900ක් වූ මෙම ව්‍යාපෘතිය යටතේ දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි මෙම කුඩා පාලම් ඉදි කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව 2017 වර්ෂය තුළ අඩි පාලම් ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක මට්ටමෙන් සංවිධානය කරන ලදි.

6.1.5 රු. මිලියන 50 කට අඩු රජයේ ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති නර්ඩ් තාක්ෂණය භාවිතා කර ටෙන්ඩර් පටිපාටියකින් තොරව නර්ඩ් මධ්‍යස්ථානය හරහා සිදුකර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදීම

නර්ඩ් ආයතනය විසින් හඳුන්වා දී ඇති ඉදිකිරීම් තාක්ෂණ භාවිතා කර රජයේ ගොඩනැගිලි ඉදි කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ අතර ඒ සඳහා පසුගිය අවුරුදු 20 ඇතුලත ඉදි කරන ලද ගොඩනැගිලි පිළිබඳ තත්ව වාර්තාවක් පිළිගත් ආයතනයකින් සහතික කර ලබා ගන්නා ලෙස දැණුම් දෙන ලදි. ඒ අනුව 2017 වර්ෂයේදී ගොඩනැගිලි පිළිබඳ වාර්තාව, CIDA ආයතනය මගින් පිළියෙල කර අමාත්‍ය මණ්ඩලය වෙත බාර දුන් අතර ඒ සඳහා අනුමැතිය ද ලැබුණි.

6.1.6 නර්ඩ් ආයතනයේ වාර්ෂික පර්යේෂණ සමුළුව සහ විවෘත දින ප්‍රදර්ශනය පැවැත්වීම

මධ්‍යස්ථානයේ වාර්ෂික පර්යේෂණ සමුළුව විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ඔක්තෝබර් මස 19 වන දින පැවැත්විනි. මේ සඳහා පර්යේෂණ පත්‍රිකා 7ක් විවිධ ඉංජිනේරු ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් ඉදිරිපත් වූ අතර හොඳම පර්යේෂණ පත්‍රිකා ඇගයීමකට ලක් කරන ලදී.

මධ්‍යස්ථානය විසින් සංවිධානය කරනු ලබන විවෘත දින ප්‍රදර්ශනය 2017 නොවැම්බර් මස 11 වන දින ගරු විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය තුමාගේ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර එමගින් සාමාන්‍ය ජනතාවට නොමිලේ තාක්ෂණ උද්‍යානය නැරඹීමට අවස්ථාව ලබුණු අතර තාක්ෂණික සේවාවන් ලබා ගැනීමට ද හැකිවිය.

6.2 ප්‍රධාන පර්යේෂණ ව්‍යාපෘති – 2017 වර්ෂය

නර්ඩ් ආයතනය මගින් සිදු කල ප්‍රධාන පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ සාරාංශ ගත විස්තරය පහත දැක්වේ.

6.2.1 ස්වයංක්‍රීයව ක්‍රියා කරන, බීම වර්ග සහ යෝගට් පිරවීමේ යන්ත්‍රයක් හඳුන්වා දීම

වඩා ඵලදායි හා කාර්යක්ෂමව මෙන්ම සෞඛ්‍යාරක්ෂිතව යෝගට් සහ බීම වර්ග ඇසුරුම් වලට පිරවීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය සිදු කරණ ලදි.

සුළු පරිමාණ කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම මත සහ අරමුදල් මත මෙම යන්ත්‍රය නිපදවීම සඳහා වු පර්යේෂණය ආරම්භ විය. ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුදල - රු .750,000 / - කි. යන්ත්‍රයේ නිෂ්පාදිත ධාරිතාව - පැයකට මී.ලි200 බහලුම් (Cups) 300 කි.

6.2.2 පැති බැමි ඉදි කිරීම සඳහා තාක්ෂණයන් හඳුන්වාදීම

සම්පූර්ණ කරන ලද පැති බැම්ම

භාවිතා කරන ලද බ්ලොක් ගල්

වර්තමානයේ නිවාස ඉදි කිරීම් සඳහා අත්‍යාවශය පැති බැමි ඉදි කිරීම සඳහා වන පැති බැමි ඉදි කිරීමේ නව තාක්ෂණයක් හඳුන්වා දීම මෙහි අරමුණ විය. සිමෙන්ති සහ ගල් කුඩු මිශ්‍රනයෙන් ගඩොල් සාදා එම ගඩොල් මගින් පැති බැම්ම ඉදි කර පසුව අධි ආතති කම්බි භාවිතා කරමින් එම පැති බැමි වලට බලයක් යොදා සවිමත් කරනු ලැබේ.

මෙම ක්‍රමයේ ඇති වාසි වනුයේ :

- නිෂ්පාදනය සඳහා අඩු ඉඩකඩක් අවශ්‍ය වීම.
- බාහිර පෙනුම අලංකාර වීම.
- සාමාන්‍ය ක්‍රමයට වඩා සමස්ත වියදම අවමවීම

6.2.3 Fly Ash (දුවිලි අළු) පෙර නිමි කොන්ක්‍රීට් නිෂ්පාදන සඳහා යොදා ගැනීම

දුවිලි අළු (Fly Ash) භාවිතා කරමින් රසායනාගාරයේ පූර්ව කොන්ක්‍රීට් සැදීමේ සංගයක පරීක්ෂා කිරීම.

දුවිලි අළු යනු ගල් අඟුරු දහනය වීමේදි සුලඟේ පාවී ගොස් පොළවේ තැන්පත් වන ඉතා කුඩා අංශු වලින් සැදුණු ද්‍රව්‍යයක් වන අතර නොරොච්චෝලේ ගල් අඟුරු විදුලිබලාගාරයේ විදුලිය නිපදවීමේදී අපද්‍රව්‍ය වශයෙන් මෙය අවට පොළවේ තැන්පත් වේ. මෙසේ බහුල වශයෙන් දුවිලි අළු පොළවේ තැන්පත්වීම බලාගාරයේ ප්‍රධාන ගැටළුවක් බවට පත් වී ඇත. දැනට මෙම ෆ්ලයි ඇෂ්, ඉදිකිරීම් කටයුතු සඳහා සහ පෙර නිමි කොන්ක්‍රීට් ගොඩනැගිලි උපාංග නිෂ්පාදනය කිරීමට යොදාගත හැකිදැයි සොයා බැලීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. පර්යේෂණවල ප්‍රතිඵල අනුව 15% ෆ්ලයි ඇෂ්, සිමෙන්ති වෙනුවට භාවිතා කල හැකි බවට තහවුරු විය. එසේම 20% පමණ ප්‍රමාණයක් සම්පීඩිත සිමෙන්ති පස් ගල් නිෂ්පාදනය සඳහා භාවිතා කල හැකි බවට තහවුරු විය. ලංකා විදුලිබල මණ්ඩලයේ ඉල්ලීමකට අනුව මෙම පර්යේෂණය ආරම්භ කරන ලදී. මේ අනුව, දැනට භාවිතයට නොගන්නා මෙම ෆ්ලයි ඇෂ් ඉදිරියේදී ඉදි කිරීම් කටයුතු වලට යොදා ගැනීමට හැකි වනු ඇත.

6.2.4 Bottom Ash (බොටම් ඇෂ්) භාවිතාකර සිමෙන්ති බ්ලොක් ගල් සහ බිම් ඇතුරුම් කැට නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය හඳුන්වා දීම

නොරොච්චෝලේ විදුලි බලාගාරයේ ගල් අඟුරු දහනය වීමේදි නිපදවන තවත් අපද්‍රව්‍යයක් වනුයේ බොටම් ඇෂ් ය. මෙය ද ගැටළුවක් බවට පත්වී ඇත. ලංකා විදුලිබල මණ්ඩලයේ ඉල්ලීමකට අනුව bottom ash භාවිතා කර සිමෙන්ති වැලි ගල් නිෂ්පාදනය කිරීම පිළිබඳව වැඩමුළු දෙකක් සංවිධානය කරන ලදි. එහිදී 30 දෙනකු මෙම වැඩසහටහනට සහභාගී වූ අතර දැනට ඔවුන් bottom ash භාවිතා කර සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය සිදු කරනු ලබයි.

6.2.5 වහල සෙවිලි කරණ උළු නිෂ්පාදනයේදී උළු වල තෙතමනය ඉවත් කිරීම සඳහා කාර්යක්ෂම හා ඵලදායි තාක්ෂණයක් හඳුන්වා දීම

උළු නිෂ්පාදනයේ අධික නිෂ්පාදන වියදම අඩුකර ගැනීම සඳහා, වානිජ සහ කර්මාන්ත අමාත්‍යාංශය, උළු නිපදවන්නන්ගේ සංගමය මගින් සිදු කරන ලද අධ්‍යනයේදී උළු වල තෙතමනය ඉවත් කිරීම සඳහා වූ තාක්ෂණය වැඩි දියුණු කල යුතු බව තහවුරු කරගෙන ඇත. ඔවුන්ගේ ඉල්ලීම පරිදි සුදුසු වියලීමේ පද්ධතියක් වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

උළු නිෂ්පාදනාගාරයේ වාෂ්ප කට්ටලය සහ උදුන

2017 වර්ෂය තුළදී උළු වියලිමේ පද්ධතියක් සඳහා අවශ්‍ය ගොඩනැගිල්ල සහ දහකයක් (Kiln) සහ චිමිනිය නිර්මාණය කරන ලදී. යෝජිත වියලීමේ පද්ධතිය 100' x 25' ගොඩනැගිල්ලකින්, දාහකයක්, තල්ලු කරගත යා හැකි පරිදි උස අඩි 9.0 තැබිය හැකි රාක්ක 12 කින් යුත් tunnel එක, පැටවීම සහ බෑම සිදු කිරීම පිණිස යාන්ත්‍රික පද්ධතියක්, සහ වියලි වාතය ගමන් කිරීම පිණිස GI බට, සහ 60' උස චිමිනියකින් යුක්ත වේ. 2017 වර්ෂය අවසාන වන විට මෙම පද්ධතියේ 95% පමණ වැඩ කොටසක් නිම කර තිබුණි.

6.2.6 ප්‍රජා සහභාගීත්වය ඇතිව ඒකාබද්ධ කසළ කළමනාකරණ ව්‍යාපෘති හඳුන්වාදීම

නිසි පරිදි කසළ කළමනාකරණය සිදු නොවීම අප රටේ නගර ආශ්‍රිතව ප්‍රධාන ගැටළුවකි. කසළ කළමනාකරණය ආදර්ශ ව්‍යාපෘතියක් ලෙස ඒකාබද්ධ කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක ගම්මානය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ අනුග්‍රහය ඇතිව ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය 20 m^3ක ජීරණ ටැංකි දෙක, සහ දාහකයකින් (incinerator) සමන්විතය. ජීරණ ටැංකි පිළිබඳව එම ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා මෙම පද්ධති ඔවුන් හට පවරා දී ඇත.

ලං.වි.ම, කොතමලේ බලාගාරයේ ආරක්ෂිත නේවාසිකාගාරය සඳහා 20m3 Biogas Digester

ලං.වි.ම, කොතමලේ බංගලාව සඳහා 20m3 Biogas Digester

6.2.7 වීදි ලාම්පු දැල්වීම සහ නිවීම සඳහා ආරක්ෂිත ක්‍රමවේදයක් හඳුන්වාදීම

ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි සමාගම (LECO), ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය NWS(IESL) , ගුවන් විදුලි තරංග භාවිතා කොට ආරක්ෂිත ලෙස වීදි ලාම්පු දැල්වීම සහ නිවා දැමීම සඳහා තාක්ෂණයක් හඳුන්වා දීමට ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. දැනට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ දායකත්වය ඇතිව පර්යේෂණය සිදු කරමින් පවතී.

6.2.8 ජාතික විදුලි පද්ධතිය හා සම්බන්ධ සූර්ය බලාගාරවල කාර්යසාධනය විශ්ලේෂණය කිරීම

සූර්ය තාපබලාගාරවල කාර්යසාධනය ප්‍රධාන වශයෙන් එම ප්‍රදේශයේ කාලගුණික සාධක මත රැඳී පවතී. කාලගුණික සාධක වෙනස්වන තත්වයක් පවතින විටදී සූර්ය තාපබලාගාරයේ විදුලි නිෂ්පාදනය පිළිබඳ අධ්‍යනයක් කිරීමට මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මේ සඳාහා දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටා ඇති සූර්ය තාප බලාගාරවල විදුලි නිෂ්පාදනය සහ එම කාල සීමාවල කාලගුණික දත්ත එක්රැස් කර ගැනීම, මෙම අධ්‍යයනය යටතේ සිදුකර ඒවා අතර සම්බන්ධය විශ්ලේෂණය කරණ ලදී. ඒ අනුව, දැනට පවතින දත්ත යටතේ සූර්ය තාපබලාගාරවල විදුලි නිෂ්පාදනය හා අදාල කාලගුණික සාධක අතර සම්බන්ධය ගොඩනගමින් පවතී.

6.2.9 දුම් ගැසූ මාළු නිෂ්පාදනය

දුම් ගැසූ මාළු සඳහා දේශීය සහ විදේශීය වශයෙන් විශාල ඉල්ලුමක් පවතින අතර එසේ දුම් මාළු නිෂ්පාදනය කිරීම ධීවර ප්‍රදේශවල ජනතාවගේ ආර්ථිකය ඉහළ නැංවීමට හේතුවක්වේ. මෙම නව පර්යේෂණය සිදුකර දුම් ගැසූ මාළු නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය හඳුන්වාදී ඇති අතර නියමු ව්‍යාපෘතියක් ලෙස ඒකක දෙකක් දැනට නිෂ්පාදනය කර ඇත.

6.2.10 ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සඳහා අවශ්‍යය යන්ත්‍ර වැඩි දියුණු කිරීම

ආයුර්වේද වෛද්‍ය ක්‍රමය යටතේ ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන ගුලි නිෂ්පාදනය වැඩි කරීම සඳහා සහ බෙහෙත් කල්ක සෑදීම පිණිස යන්ත්‍ර වැඩි දියුණු කර ඇත.

ඖෂධ ගුලි සෑදීමේ යන්ත්‍රය

ඖෂධ ගුලි ඔප දැමීමේ යන්ත්‍රය

6.2.11 පොල් කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය මෙවලම් හඳුන්වාදීම

වර්තමානයේ පොල් කැඩීම සහ පොල් ලෙලි ගැසීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය කම්කරු ශ්‍රමය ලබාගැනීම සහ කම්කරු මිල ඉහල යාම නිසා පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ පොල් කැඩීම උග්‍ර ගැටළුවක් බවට පත්වී ඇති අතර එම ගැටළුව සඳහා විසඳුමක් ලෙස පොල් අස්වනු නෙලීම පිණිස මෙවලම් හඳුන්වා දෙන ලදි. පොල් කැඩීම සඳහා දිග ප්‍රමාණය අඩු වැඩි කල හැකි පරිදි සකස් කරණ ලද කෙක්ක ක්ෂේත්‍ර පර්යේෂණ නිම කර පසු විපරම් දත්ත ලබා ගනිමින් සිටියි. මෙයට අමතරව පොල් ලෙලි ගැසීම සඳහා අතින් ක්‍රියා කරන යන්ත්‍රයක් සහ විදුලිබලයෙන් ක්‍රියාත්මක කරන යන්ත්‍රයක් හඳුන්වා දී ඇත. එම යන්ත්‍ර ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා යොමු කොට පසුවිපරම් තොරතුරු ලබා ගනිමින් සිටියි.

අතින් පොල් ලෙලි ගැසීමේ උපකරණය

කර්මාන්තමය පොල් ලෙලි ගැසීමේ යන්ත්‍රය

6.2.12 Hyperbaric ඔක්සිජන් Therapy සඳහා වන Hyperbaric ඔක්සිජන් Chamber

Hyperbaric Oxygen Therapy යනු 100% ඔක්සිජන් සහිත පරිසරයක සම්පීඩන වායුගෝල පීඩන 2ක යටතේ රෝගියා ඔක්සිජන් කුටිය තුළ තබා ප්‍රතිකාර කරණ ක්‍රමයකි. මෙම ක්‍රමය සඳහා ඔක්සිජන් chamber එක නිපදවීම ව්‍යාපෘතියේ මූලික අරමුණ විය. දැනට ඔක්සිජන් කුටීරය මූලික ලෙස සකසා ඇත.

6.2.13 කොහු ලණු ගෙතීමේ යන්ත්‍රයක් සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ කොහු ලණු නිෂ්පාදනය ප්‍රධාන වශයෙන් ගෘහ කර්මාන්තයක් ලෙස සිදු කෙරේ. මෙම නිෂ්පාදන දේශීය වෙළෙඳපොළ තුළ මෙන්ම විදේශ රටවලට අපනයනය කරනු ලැබේ. (මෙම කර්මාන්තය ශ්‍රමය මූලික කරගත් හා කර්මාන්තවල නියැලී සිටිනන් අඩු ජීවන මට්ටමක් ඇති ජනතාවවේ.) නිෂ්පාදන කාර්යක්ෂමතාව හා ගුණාත්මකතාවය වැඩි කිරීම තුලින් එම ජනතාවගේ ආදායම වැඩිදියුණු කිරීම සහ ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීමේ අරමුණෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. කොහු ලණු සෑදීම සඳහා වැඩි ශ්‍රමයක් වැය නොකර ඒ සඳහා යන්ත්‍රයක් සංවර්ධනය කිරීම ඉලක්ක කර ඇති මෙම ව්‍යාපෘතියෙන් දැනට සැලකිය යුතු මට්ටමකින් වැඩ නිමකර ඇත.

6.2.14 කුඩා පරිමාණ කිරි දොවන යන්ත්‍රයක් හඳුන්වාදීම

කුඩා පරිමාණයේ කිරි ගොවින්ගේ ආදායම ඉහළ නැංවීම අරමුණු කරගෙන අතින් ක්‍රියා කරනු ලබන මෙම කිරි දෙවීමේ යන්ත්‍රය හඳුන්වාදෙනු ලැබේ. සාර්ථකව සිදු කරන ලද ක්ෂේත්‍ර පරික්ෂණ වලින් පසුව මෙම යන්ත්‍ර ගොවීන් හට බෙදා දෙනු ලැබූ අතර ඔවුන්ගෙන් පසුවිපරම් වාර්තා ලබාගන්නා ලදී.

දැනට මෙම යන්ත්‍ර නිෂ්පාදනය කිරීම සඳහා සුදුසු ගැනුම්කරුවන් අතට පත් කිරීමට කටයුතු කරමින් සිටී.

6.3 නියමු ව්‍යාපෘති

මධ්‍යස්ථානය විසින් හඳුන්වා දෙනු ලැබූ තාක්ෂණයන් ප්‍රචලිත කිරීම සහ ප්‍රයෝගික භාවිතයේදී සිදු කළ යුතු වැඩිදියුණු කිරීම් හඳුනාගැනීම සඳහා නියමු ව්‍යාපෘතීන් සිදු කරනු ලැබේ.

6.3.1 පසු ආතති පෙරසවි පැති බැම්ම

දළුපිටිය සායන ගොඩනැගිල්ල සඳහා පැති බැම්ම ඉදිකිරීම

දළුපිටිය සායනික ගොඩනැගිල්ලේ පිහිටි ඉඩම මහර ප්‍රාදේශීය සභාව සතු වන අතර මෙම ව්‍යාපෘතිය නියමු ව්‍යාපෘතියක් ලෙස ඉදිකිරීම සඳහා තෝරා ගෙන මහර ප්‍රාදේශීය සභාව මගින් අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදී. භූමිය තුළ රඳවා තබා ගන්නා පසු බැවුම මීටර 2.4 කි. රැඳවුම් බිත්තියේ දිග මීටර් 6.7 කි. ව්‍යාපෘති යේ වියදම රුපියල් 250,000.00 කි.

කැටයම් සහිත කොන්ක්‍රීට් කුට්ටි සහිත බිත්තියක් ඉදිකර ඇති අතර, ඉදිකිරීම් කටයුතු නිම කිරීමෙන් පසු ආතතිය යෙදවිය. පශ්චාත් ආතතන්තරගත රැඳවුම් බිත්තිවල වාසි අඩු ඉඩ ප්‍රමාණය, පිරිවැය ඉතිරිකිරීම (15%)හා මනා නිමැවුම මෙහි ඇති ලක්ෂණවේ.

6.3.2 ජීවවායු ජනක 10ක් බටුවත්ත ග්‍රාමයට බෙදාදීම

ලීටර් 500ක ධාරිතාව ඇති ප්ලාස්ටික් ටැංකි භාවිතාකර ගෘහස්ථව නිපදවෙන දීරායන කුණු භාවිතයෙන් ක්‍රියාකරන ජීවවායු ජනකයක් හඳුන්වාදෙන ලදී. මෙහි මූලික අරමුණ වූයේ කසළ වලින් තොරව ගම්මාන සංකල්පය ප්‍රාදේශීය සභා හරහා ප්‍රචලිත කිරීමයි. නිවාස 10ක් සඳහා මෙවැනි ජීවවායු ජනක 10ක් රාගම බටුවත්ත ප්‍රදේශයේ ගෙවල් 10ක් සඳහා ප්‍රාදේශීය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් බෙදා දෙන ලදී.

ප්ලාස්ටික්-ෂෙල් ජීරකය සහ ගෑස් එකතුකරණය

6.3.3 හඳුන්වා දෙන ලද නව තාක්ෂණ ක්‍රම භාවිතාකර නර්ඩ් තාක්ෂණ උද්‍යානයේ පැති බැම් ඉදිකිරීම

නර්ඩ් ආයතනය විසින් හඳුන්වාදුන් නව පැති බැම් ඉදිකිරීමේ තාක්ෂණ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් පැතිබැම් තාක්ෂණ භාවිතාකර පැතිබැම් දෙකක් නර්ඩ් තාක්ෂණ උද්‍යානයේ ඉදිකරන ලදී.

තාක්ෂණික උද්‍යානයේ පිහිටි පෙරසවි කොන්ක්‍රීට් පසුතෙරපුම් පැති බැම්ම

තාක්ෂණික උද්‍යානයේ පිහිටි පෙදරේරු පැති බැම්ම

6.3.4 ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර නිපදවීම

ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා ආයුරුවේද සංරක්ෂණ සභාවට ලබාදෙන ලදී.

6.3.5 තල් ආශ්‍රිත ආහාර සැකසීම සඳහා නිෂ්පාදනය කරන ලද වියලන යන්ත්‍රය

තල් පර්යේෂණ මණ්ඩලයේ ඉල්ලීම මත තල් නිෂ්පාදනයට අවශ්‍ය වියලන යන්ත්‍ර 20ක් සාදා ඔවුන් වෙත ලබාදෙන ලදී.

තල් යුෂ වියලාගැනීමේ යන්ත්‍රය

6.4 කර්මාන්තශාලා සඳහා සපයන ලද සේවාවන්

මධ්‍යස්ථානය විසින් බලශක්ති කළමනාකරණය, පාරිසරික කළමනාකරණය, ඉදිකිරීම් සහ කර්මාන්ත යනාදී ක්ෂේත්‍ර ආවරණය කරමින් තාක්ෂණික සේවා සැපයීම සිදු කරයි. ඒ අනුව, 2017 වර්ෂය තුළ සපයන ලද තාක්ෂණික සේවාවන් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

6.4.1 ආදාහනාගාර සහ කසලදාහකයක් අලුත්වැඩියා කිරීම සහ වෙනස් කිරීම

අංකය	ව්‍යාපෘති යේ නම	වටිනාකම මුදල් (රු.)	ලැබුණු මුදල (රු.)	තත්ත්වය
1	රත්නපුර රෝහලේ කසළ දහනාගාරයේ විමිනිය අළුත්වැඩියා කිරීම	229,765.31	114,882.66	සම්පූර්ණ කරන ලදි
2	වලපනේ ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය අළුත්වැඩියා කිරීම	94,378.32	94,378.32	සම්පූර්ණ කරන ලදි
3	කටුවන ආදාහනාගාරය ඉදිකිරීම සඳහා උපදේශන සේවා සැපයීම	200,000.00	200,000.00	සම්පූර්ණ කරන ලදි

6.4.2 බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් සේවාවන් ලංකාව පුරා පිහිටි විවිධ කර්මාන්තවල ඉල්ලීම් මත සිදු කරණ ලදී.

බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් සේවාවන් ලංකාව පුරා පිහිටි විවිධ කර්මාන්තවල ඉල්ලීම් මත සිදු කරණ ලදී.

- පාරිසරික ගැටළු සම්බන්ධව විද්‍යාගාර පරීක්ෂණ
- පාරිසරික ගැටළු පාලනය කිරීම සඳහා විසඳුම් සැපයීම
- පාරිසරික ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා අධීක්ෂණ කටයුතු කිරීම
- බොයිලර් කාර්යක්ෂමතාව සහ දුමාර වායු විශ්ලේෂණය
- කාර්මික ක්‍රියාවලි අධීක්ෂණය සහ උපදේශන සේවා සැපයීම
- පුහුණු වැඩසටහන් පැවැත්වීම
- බලශක්ති ක්ෂේත්‍රය සඳහා සේවා සැපයීම



බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද සේවාවන් පිළිබඳ සාරාංශගත තොරතුරු

ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම්	භෞතික (සේවා සංඛ්‍යාව)		මූල්‍ය (රුපියල් 1000)				
			ඉලක්කය		තත්‍යය		
	ඉලක්කය	සම්පූර්ණ කල	ආදායම්	දායකත්වය	ආදායම්	සෘජු වියදම	දායකත්වය
පාරිසරික රසායනාගාර පරීක්ෂණ	1000	872	1,500,000.00	600,000.00	1,432,811.93	958,065.54	479,157.88
කර්මාන්ත සඳහා පාරිසරික ගැටළු පාලනය කිරීම සඳහා විසඳුම් සැපයීම	50	35	1,000,000.00	800,000.00	875,223.34	219,946.62	653,543.19
රෙගුලාසි අනුව පරිසර අධීක්ෂණ සේවාවන් සැපයීම	200	198	4,750,000.00	2,850,000.00	5,823,898.24	1,435,125.25	4,388,771.99
බොයිලේරු කාර්ය සාධනය සහ ක්ෂණික වායු විශ්ලේෂණය	125	147	5,500,000.00	2,750,000.00	5,961,676.26	2,712,297.86	3,249,378.40
EMC මගින් කාර්මික ක්‍රියාවලි අධීක්ෂණ සහ උපදේශනය	50	57	1,500,000.00	1,050,000.00	865,878.44	211,758.38	654,120.06
පුහුණු වැඩසටහන් - E&EMC	2	1	300,000.00	150,000.00	144,869.58	38,969.60	105,899.98
බලශක්ති ආශ්‍රිත සේවා පැවැත්වීම	10	3	700,000.00	490,000.00	169,500.00	12,500.00	157,000.00
මුළු එකතුව			15,250,000.00	8,690,000.00	15,273,856.79	5,588,663.25	9,687,871.50

6.4.3 පුහුණු වැඩමුළු පැවැත්වීම "කළමනාකරණය හා අපජලය සමඟ සම්බන්ධිත ගැටළු"

අපජල පවිත්‍රකරණයන් සහ ප්‍රමිතීන්, අපජලය පිරිපහදු කිරීමේ තාක්ෂණික ක්‍රම, කාර්මික අපජලවල පාරිසරික බලපෑම්, කර්මාන්ත වර්ග සහ අපද්‍රව්‍ය විශ්ලේෂණය කිරීමේ ක්‍රමෝපායයන් යනාදිය ඉලක්ක කරගනිමින්ය. මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කරණු ලැබේ.

සහභාගී වූ සංඛ්‍යාව 17 කි.

6.4.4 ISO 17025 තත්ව සහතික ලබා ගැනීම

2017 වර්ෂය සඳහා අපවිත්‍ර ජලය පරික්ෂා කිරීම සහ ශබ්ද මට්ටම පරීක්ෂා සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මගින් මෙම තත්ව සහතික බලපත්‍රය ලබාගන්නා ලදි.

SLAB
SRI LANKA ACCREDITATION BOARD
Certificate of Accreditation
Sri Lanka Accreditation Board for Conformity Assessment hereby declares that
Environmental Laboratory
Energy & Environmental Management Centre
National Engineering Research and Development Centre
having being found to comply with the accreditation criteria for testing/calibration laboratories as described in ISO / IEC 17025 :2005, has been accredited as a testing laboratory under the field of
Chemical & Mechanical Testing
and has been assigned the accreditation number
TL 060-01
This certificate is issued on 14 September 2016 and is valid until
14 June 2019
The accreditation was granted for the first time for Chemical testing on 15 June 2016.
The scope and conditions of accreditation are specified in the Schedule of Accreditation bearing the accreditation number appearing in this certificate.
Deputy Director (Accreditation)
Sri Lanka Accreditation Board for Conformity Assessment
Colombo, Sri Lanka

6.4.5 සුපිරි නිමැවුම් අංශය (Centre for Manufacturing Excellence) මගින් සපයන ලද සේවාවන්

- සංකීර්ණ නිරවද්‍යා හැඩතල නිපදවීම සඳහා සැලසුම් කර නිෂ්පාදනය කිරීම.
- හැඩතල අලුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම.
- සමාන පහසුකම් සැපයීමට විභව ආයෝජකයින්ව ප්‍රවර්ධනය කිරීම.
- තාක්ෂණ ප්‍රදර්ශන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.
- පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා උපදෙස් ලබා දීම.
- සිය නිර්මාණශීලී සහ නිෂ්පාදන අවශ්‍යතා සඳහා භාවිතා කරන්නන් නිෂ්පාදකයින්ගේ / කර්මාන්තයන් නිර්මාණය කිරීම සඳහා අනුග්‍රාහක සේවාවන් සැපයීම.

ඉහත සේවාවන් සැපයීම සඳහා පහත සඳහන් නවීන යන්ත්‍රෝපකරණ, CME හි ස්ථාපිත කර ඇත.

- CAD / CAM ඒකාබද්ධ මෘදුකාංග
- CNC මෝල්ඩින් යන්ත්‍රය
- CNC යන්ත්‍රෝපකරණ යන්ත්‍රය
- CNC EDM වයර් කපන යන්ත්‍රය
- CNC EDM යන්ත්‍රය) Spark Erosion)
- අධිවේගී ස්කෑනිං යන්ත්‍රය
- නිරවද්‍යතාව සිලින්ඩරාකාර ඇඹරුම් ගල
- පෘෂ්ඨීය දොඹකරය
- ප්ලාස්ටික් ඔප දැමීමේ උපකරණ
- ඇඹරීම සහ කැටයම් පිටපත් කිරීම
- පරීක්ෂණ සහ මිනුම් උපකරණ

CME හි මගින් 2017 වර්ෂය තුලදී සිදුකරණ ලද සේවාවන්

මාසය	නිර්මාණය සහ නිෂ්පාදනය	සංගයක නිෂ්පාදනය කිරීම	පරීක්ෂණ හා පිරික්සුම්	පුහුණු වැඩසටහන්	වැඩ නිම කළ මුළු වටිනාකම
ජනවාරි	650,000.00	47,800.00		34,087.00	731,887.00
පෙබරවාරි		7,000.00	11,500.00		18,500.00
මාර්තු		63,500.00			63,500.00
අප්‍රේල්		38,800.00			38,800.00
මැයි		36,000.00			36,000.00
ජූනි		63,000.00			63,000.00
ජූලි		23,000.00		30,000.00	53,000.00
අගෝස්තු		17,000.00			17,000.00
සැප්තැම්බර්	19,999.99	119,139.15	3,000.00	15,000.00	157,139.14
ඔක්තෝම්බර්		49,000.00			49,000.00
නොවැම්බර්					0.00
දෙසැම්බර්			25,000.00		25,000.00
මුළු ගණන	669,999.99	464,239.15	39,500.00	79,087.00	1,252,826.14

6.4.6 මධ්‍යස්ථානයේ අනිකුත් දෙපාර්තමේන්තු මගින් කර්මාන්ත සඳහා සපයනු ලබන සේවාවන්;

විදුලි, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් දෙපාර්තමේන්තුව, සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, පාරිසර හා බලශක්ති දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික හා යන්ත්‍රෝපකරණ සංවර්ධනය සහ මෙකාට්‍රොනික් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද සේවාවන්.

සේවාව	සංඛ්‍යාව	වටිනාකම (රු)
ලාම්පු පරීක්ෂාව	111	636,800.00
ඊයම් ඇසිඩ් අම්ල බැටරි පරීක්ෂණය	29	50,200.00
පරීක්ෂණ හා අධීක්ෂණ සේවා	04	32,600.00
ක්‍රමාංකන සේවා	19	176,400.00
රසායනාගාර පරීක්ෂණය - සිවිල් ඉංජිනේරු	209	749,280.00
ජෛව වායු පරීක්ෂණාගාරය	08	8,000.00
පෙරසවි කොන්ක්‍රීට් ගොඩනැගිලි සංගයක නිෂ්පාදනය කිරීම.		300,000.00
දැනුම පදනම් කරගත් පුහුණු වැඩසටහන්	30	360,000.00

6.5 මධ්‍යස්ථානයේ ප්‍රධාන පරිපාලන කාර්යාලය වැඩි දියුණු කිරීම

2017 වර්ෂය තුළ මධ්‍යස්ථානයේ ප්‍රධාන පරිපාලන කාර්යාලය ප්‍රතිසංස්කරණය කරන ලදී.



මධ්‍යස්ථානයේ ඉදිරිපස කාර්යාල ගොඩනැගිල්ල

6.6 මෙකාට්‍රොනික් දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම

මෙකාට්‍රොනික් අංශයේ ගොඩනැගිල්ලේ ඉදිරිපස කොටස් සඳහා මහල් දෙකකින් යුත් පෝටිකෝවකින් යුත් කොටසක් එකතු කරණ ලදි.

පඩි පෙළ, වහලය සහ අත්වැට ඇතුළු නව පිවිසුම් ගොඩනැගිල්ල මධ්‍යස්ථානයේ ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය අනුව සිදුකර ඇත.

6.7 ඉදිරිපත් කරණ ලද පර්යේෂණ පත්‍රිකා

2017 වර්ෂය තුළ දී පහත සඳහන් පර්යේෂණ පත්‍රිකා ජාතික සහ අන්තර් ජාතික සම්මන්ත්‍රනවලදී ඉදිරිපත් කරන ලදි.

	මාතෘකාව	කර්තෘ	සංවිධායක
1	වරක් කසළ බැහැර කරමු! ජාතික වගකීම ඉටු කරමු!	ඉංජි. ජේ ඒ ඒ ඩී ජයසූරිය	ශ්‍රී ලංකා පදනම් ආයතනය
2	පාංශු ජල පද්ධතිය රැක ගැනීමට අතීතෙන් පාඩම්	ඉංජි. ඩබ්. කේ ආර් පීරිස්	ජාතික විද්‍යා පදනම
3	ජල නියාමනය හා පරිසර පද්ධති අතර සම්බන්ධතාවයක් මත ඇලවල් හරහා, ඇල මාර්ග හරහා සහ අධ්‍යයනය හරහා ෆ්ලැප් ගේට්ටු නිර්මාණය කිරීම සඳහා විශ්ලේෂණාත්මක ආකෘතියක්.	ඉංජි. ඩබ්ලිව් කේ ආර් පීරිස්	ජාතික විද්‍යා පදනම
4	ෆෙරෝ-සිමෙන්ති ටැංකි	ඉංජි. ජී ජී කේ කේ ඒ ද සිල්වා	ඉන්දියානු ෆෙරෝ සිමෙන්ති සමිතිය, කේරල
5	ෆෙරෝ-සිමෙන්ති අඩි පාලම්	ඩබ් පී පී ඩී වීරසිංහ මහතා	ඉන්දියානු ෆෙරෝ සිමෙන්ති සමිතිය, කේරල
6	පෙරසවි කොන්ක්‍රීට් රුඳවුම් බැම් ගොඩ නැගීම කිරීම	ඉංජි.ඩබ්. ඩබ්. පී. කේ. පෙරේරා	ව්‍යුහාත්මක ඉංජිනේරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකාව
7	පිරිවැය ඵලදායි ලෙස අලවන ලද සංයුක්ත පරාල හඳුන්වා දීම	ඉංජි. පී. එන්. එස්. අමරදාස	ව්‍යුහාත්මක ඉංජිනේරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකාව

6.8 තාක්ෂණ පැවරුම්, බලපත්‍ර අළුත් කිරීම, පුහුණු වැඩසටහන් සහ තාක්ෂණය ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම්

ඉහත සඳහන් ක්‍රියාකාරකම් තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධ වී සිදු කරණ ලද අතර ඒවා පහත සඳහන් පරිදි වේ.

6.8.1 2017 ව්‍යවසායකයින් සඳහා තාක්ෂණ පැවරුම්

තාක්ෂණය	බලපත්‍රලාභීන් සංඛ්‍යාව
1. පිරිවැය ඵලදායි ගොඩනැගිලි තාක්ෂණය	03
2. සිමෙන්ති ස්ථායී පස් ගල් නිෂ්පාදන කර්මාන්තය	03
3. පෙරසවි අඩි පාලම් ඉදිකිරීම	01
4. ෆෙරෝ සිමෙන්ති තාක්ෂණය භාවිතා කර අඩි පාලම් ඉදිකිරීම	01
5. එළවළු වියලනය	02
6. යෝගට් ඉන්කියුබේටර්	01
7. පාදයෙන් ක්‍රියාත්මක වන ජලකරාම	01
8. මයියොක්කා පෙති කපනය	01
9. Bottom Ash මිශ්‍ර සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය	10

6.8.2 බලපත්‍ර අළුත් කිරීම

නර්ඩ් බලපත්‍රලාභී ව්‍යවසායකයින් ඔවුන්ගේ බලපත්‍ර වාර්ෂිකව අලුත් කරගත යුතුවේ. 2017 වර්ෂයේදී එක් එක් තාක්ෂණයන් යටතේ අළුත්කරගත් බලපත්‍ර සංඛ්‍යාව පහත දැක්වේ.

1. පිරිවැය ඵලදායි ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය	22
2. පෙරසවි කොන්ක්‍රීට් ගොඩනැගිලි උපාංග නිෂ්පාදනය සඳහා කොන්ක්‍රීට් අංගනයක් පවත්වා ගෙන යාම	02
3. ආදාහනාගාර ඉදිකිරීම්	05
4. ගෘහස්ථ පොල් තෙල් නිෂ්පාදනය	01
5. මධ්‍ය පරිමාණ නැවුම් පොල් තෙල් සිදිනය	01
6. කජු වියලනය	01
7. ජීවවායු ජනක ඉදි කිරීම්	02
8. කර්මාන්ත උඳුන් සෑදීම	01
9. පොල් ලෙලි ගැසීමේ යන්ත්‍ර නිෂ්පාදනය	01
10. එළවළු වියලන නිෂ්පාදනය කිරීම	01
11. සිමෙන්ති ස්ථායි සම්පීඩිත පස්ගල් නිෂ්පාදනය	05
12. සිමෙන්ති ස්ථායි සම්පීඩිත පස්ගල් යන්ත්‍ර (අතින් ක්‍රියා කරන) නිෂ්පාදනය	01
13. සිමෙන්ති ස්ථායි සම්පීඩිත පස්ගල් යන්ත්‍ර (හයිඩ්‍රොලික්ස් ක්‍රියා කරන) නිෂ්පාදනය	01
14. ස්වාභාවික වාතය සැපයු දර ලිප	01
15. නර්ඩ් ඉදිකිරීම් තාක්ෂණය පිරිවැය ඵලදායී ලෙස සැලසුම් කිරීම	01

6.8.3 නර්ඩ් තාක්ෂණයන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්

විවිධ ආයතන හරහා මධ්‍යස්ථානය විසින් හඳුන්වාදෙනු ලැබූ තාක්ෂණ හා නිෂ්පාදන ප්‍රචලිත කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. ඒ අනුව 2017 වර්ෂය තුළ පහත සඳහන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කර ඇත.

දිනය	වැඩසටහන
24.03.2017	නාරම්මල විදාතා මධ්‍යස්ථානයේදී නර්ඩ් තාක්ෂණයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන.
04.05.2017	සෞඛ්‍ය අමාත්‍යාංශය සංවිධානය කල "සතුටු ගම්මාන" වැඩ සටහන.
28.06.2017	කිරි නිෂ්පාදනය වැඩිකිරීමේ අරමුණින් හඳුන්වා දුන් කිරි ගවයින් සඳහා ආහාර කෑම නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය පිළිබඳ - යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය
21.07. 2017	නුවර, කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල ව්‍යවසායකින් සඳහා පැවැත්වූ නර්ඩ් තාක්ෂණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්
01.07. 2017	ගනේමුල්ල - බොල්ලත උතුර සණස සමිතියේ සණස සාමාජිකයින් සඳහා නර්ඩ් තාක්ෂණික හා පිරිවැය ඵලදායි නිවාස තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන.
24.07 2017	මොරටුව විශ්ව විද්‍යාලයේ සිසුන් 55 දෙනකු සඳහා පිරිවැය ඵලදායි ගොඩනැගිලි තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
11.08. 2017	නර්ඩ් මධ්‍යස්ථානයේ ආදාහනාගාර බලපත්‍රලාභීන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම.
15.08.2017	මධ්‍යම පළාතේ නිවාස දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද අඩු වියදම් සහිත ඵලදායී ගොඩනැඟිලි තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්
16.08. 2017	ජේෂ්ඨ කාර්මික නිලධාරීන්, අධ්‍යාපන නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් සඳහා නර්ඩ් තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන වෙන්ගලවත්තිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදු කරන ලදී.
17.08. 2017	නර්ඩ් තාක්ෂණයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන මන්නාරම - නගර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජේෂ්ඨ කාර්මික නිලධාරීන් සහ අධ්‍යාපන දිස්ත්‍රික්ක නිලධරයන් සඳහා සිදු කරන ලදී.

දිනය	වැඩසටහන
31.08 2017	මධ්‍යම පළාතේ පළාත් නිවාස දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද නර්ඩ් අඩු වියදම් සහිත එලදායී ගොඩනැඟිලි තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
21.11. 2017	ත්‍රිකුණාමලය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේදී නර්ඩ් තාක්ෂණයෙන් හදුන්වන ලද කුඩා පාලම් (අඩි පාලම්) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
27.11. 2017	ගාල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති දිස්ත්‍රික්ක සංවර්ධන කමිටු රැස්වීමේදී නර්ඩ් කුඩා පාලම් (අඩි පාලම්) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
27.11.2017	කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති දිස්ත්‍රික්ක සංවර්ධන කමිටු රැස්වීමේදී නර්ඩ් කුඩා පාලම් (අඩි පාලම්) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

6.8.4 විශේෂ පුහුණු වැඩසටහන්

මධ්‍යස්ථානයේ තාක්ෂණයන් පිළිබඳ උනන්දුව දක්වන ව්‍යවසායකයින් හට පුහුණුවක් ලබාදීම සඳහා පහත සඳහන් පුහුණු වැඩ සටහන් 2017 වර්ෂය තුල පවත්වා ඇත

දිනය	වැඩසටහන	සහභාගීත්වය
2017.01.17-19	සේනපුරදී පවත්වන ලද පෙරනිමි කොන්ක්‍රීට් ගොඩනැගිලි උපාංග නිෂ්පාදනය කිරීමේ වැඩ සටහන - පුනරුත්ථාපනය වන පුද්ගලයින් සඳහා	28
2017.01.20-22	සේනපුරදී පවත්වන ලද පෙරනිමි කොන්ක්‍රීට් ගොඩනැගිලි උපාංග නිෂ්පාදනය කිරීමේ වැඩ සටහන - පුනරුත්ථාපනය වන පුද්ගලයින් සඳහා	34
2017.03.02	සිමෙන්ති ස්ථායි සම්පීඩිත පස් ගල් නිපදවීමේ තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන නර්ඩ් මධ්‍යස්ථානයේදී පැවැත්වීම.	10
2017.03.07-10	නර්ඩ් පිරිවැය එලදායී ගොඩනැඟිලි තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන (දින 4)	15
2017.03.15	සැලසුම් ශිල්පීන් සඳහා නර්ඩ් ආයතනය මගින් පැවැත්වූ ඉදි කිරීම් තාක්ෂණය පිළිබඳ වැඩ සටහන	14
2017.05.09 සහ 2017.05.18	SLIIT සිසුන් සඳහා එක්දින CAD / CAM පුහුණු වැඩසටහනක්	35
2017.05.23	සිමෙන්ති බිම් නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පුහුණු වැඩසටහන	13
2017.06.07	SLIIT සිසුන් සඳහා එක්දින CAD / CAM පුහුණු වැඩසටහනක්	13
2017.07.06	සිමෙන්ති ස්ථායි සම්පීඩිත පස් ගල් නිපදවීමේ තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන නර්ඩ් මධ්‍යස්ථානයේදී පැවැත්වීම.	12
2017.08.29	සිමෙන්ති ස්ථායි සම්පීඩිත පස් ගල් නිපදවීමේ තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන නර්ඩ් මධ්‍යස්ථානයේදී පැවැත්වීම.	13
2017.09.12-15	නර්ඩ් පිරිවැය එලදායී ගොඩනැඟිලි තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන (දින 4)	17
2017.09.26	සිමෙන්ති ස්ථායි සම්පීඩිත පස් ගල් නිපදවීමේ තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන නර්ඩ් මධ්‍යස්ථානයේදී පැවැත්වීම.	27

6.8.5 විශේෂ වැඩසටහන්

මධ්‍යස්ථානයේ වැඩි දියුණු කළ තාක්ෂණික ක්‍රම හා කර්මාන්ත ශාලා බලශක්ති කාර්යක්ෂමතාව, පාරිසරික කළමණාකරණ ගැටළු සහ විසඳුම් පිළිබඳ මූලික දැනුම ලබාදීමේ අරමුණෙන් මෙම වැඩසටහන් සංවිධානය කර තිබුණි. විවිධ ආයතන සඳහා මධ්‍යස්ථානයේ තාක්ෂණික උද්‍යානය තුළ මෙම වැඩසටහන් සිදු කර ඇත.

දිනය	වැඩසටහන	සහභාගීත්වය
04.03.2017	කාර්මික තාක්ෂණ ආයතනයේ නිලධාරීන් සඳහා විශේෂ වැඩසටහන	13
15.03.2017	ලංකා ගොවි සංවිධානයේ සාමාජිකයින් සඳහා විශේෂ වැඩසටහන	11
23.03.2017	IESL හි නිලධාරීන් සඳහා විශේෂ වැඩසටහන	21
06.06.2017	මාබිම මහා විද්‍යාලයේ සිසුන් සඳහා වූ විශේෂ විද්‍යා වැඩසටහන	300
18.08.2017	මහශක්ති සමුපකාර සමිතියේ සුළු පරිමාණ ව්‍යවසායකයන් සඳහා විශේෂ වැඩසටහන	41
12.09.2017	වාරියපොල සමෘද්ධි සමිතියේ කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා වූ විශේෂ වැඩසටහන	52
13.09.2017	සරණ සමිතියේ කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා වූ විශේෂ වැඩසටහන	44
11.10.2017	ගම්පහ ඉවුම් පිහුම් වැඩමුළුවේ සාමාජිකයින් සඳහා විශේෂ වැඩසටහන	122
24.10.2017	අම්පාර දිස්ත්‍රික්කයේ කාන්තා ජාලයේ (කාර්මික විද්‍යාලය) කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා විශේෂ වැඩසටහන	46
12.12.2017	පොල්පිතිගම විද්‍යා මධ්‍යස්ථානයේ විද්‍යා නිලධාරීන් සඳහා විශේෂ වැඩසටහන	15
15.12.2017	කාර්මික තාක්ෂණ ආයතනයේ නිලධාරීන් සඳහා විශේෂ වැඩ සටහන	22
16.12.2017	පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුඩා ව්‍යවසායකයන් සඳහා විශේෂ වැඩ සටහන	64
26.12.2017	අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයේ ගුරුවරුන් සඳහා විශේෂ වැඩසටහන	39
28.12.2017	වාද්දුව පාසැල් සිසුන් සඳහා විශේෂ වැඩසටහන	48

6.8.6 නේවාසික පුහුණු වැඩ සටහන් (Out Bound Training Programme)

`

මෙම නේවාසික පුහුණු වැඩසටහන් වලට සහභාගි වන්නන්ගේ විද්‍යා දැණුම, සාමුහීකත්වය, නායකත්ව කුසලතා යනාදිය වැඩි දියුණු කිරීමේ අරමුණින් මධ්‍යස්ථානයේ තාක්ෂණික උද්‍යානය තුළ 2017 වර්ෂය තුලදී වැඩ සටහන් හතරක් පහත සඳහන් පරිදි පවත්වා ඇත.

දිනය	ප්‍රායෝගික පුහුණුව	සහභාගීත්වය
2017/03/04-05	තරුණ නව නිපැයුම්කරුවන් සඳහා නේවාසික පුහුණුවැඩසටහන	50
2017/04/04-05	නර්ඩ් මධ්‍යස්ථානයේ නවක කාර්ය මණ්ඩලය සඳහා නේවාසික පුහුණුවැඩසටහන	27
2017/09/22-23	විද්‍යා නිලධාරීන් සඳහා නේවාසික පුහුණුවැඩසටහන	43
2017/11/21-22	අධ්‍යාපන ආයතනයේ ගුරුවරුන් සඳහා වූ නේවාසික පුහුණු වැඩසටහන	42

6.8.7 ප්‍රදර්ශන සඳහා සහභාගිවීම්

මධ්‍යස්ථානයේ වැඩි දියුණු කළ තාක්ෂණයන් ප්‍රචලිත කිරීමේ අරමුණින් ප්‍රදර්ශන සඳහා සහභාගීවීම් සිදු කරණු ලැබේ. 2017 වසර තුල පහත දැක්වෙන ප්‍රදර්ශන සඳහා සහභාගී වී ඇත.

දිනය	ප්‍රදර්ශනය
09.01.2017	හරිත ප්‍රදර්ශනය (මහවැලි අමාත්‍යාංශය), බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදි
1-3.02.2017	සබරගමුව විශ්ව විද්‍යාලයේ පැවති 2017- පිරිහිම්බිනි දියවර ප්‍රදර්ශනය
13-15.02.2017	කෑගල්ල විද්‍යාලයේ පැවති ප්‍රදර්ශනය
15-17.02.2017	ඩී. එස්. සේනානායක විද්‍යාලයේ පැවති ප්‍රදර්ශනය
23-25.02.2017	දංකොටුව විද්‍යාලයේ පැවති අභිමාන ප්‍රදර්ශනය
17-19.03.2017	අම්පාර නගර සභා පිටියේ පැවති "දිගාමඩුළු නවෝදා "වෙළඳ ප්‍රදර්ශනය සහ අම්පාර සම්ප්‍රදායික කර්මාන්ත හා වාණිජ සායනය -2017
11.03.2017	"ලිය වරුණ 2017" නිදහස් ආර්කේඩ්හි සජීවී විකාශන වැඩසටහන
30.03.2017-01.04 2017	"කොළඹ 05 විශාඛා විද්‍යාලයේ ප්‍රදර්ශනය - (අයිතම පමණක් ප්‍රදර්ශනය)
31.03.2017-04.04.2017	බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති "ව්‍යවසායකයා - 2017" අධ්‍යාපනික හා ව්‍යවසායික වෙළඳ ප්‍රදර්ශනය
25-27.08.2017	ගාලු මුවදොර පැවති තල් සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනය
01-05.10.2017	කැලණිය විශ්වවිද්‍යාලයේ පැවති විද්‍යා ප්‍රදර්ශනය
13-15.10.2017	බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති ටෙක්නෝ - 2017 ප්‍රදර්ශනය
11.11.2017	නර්ඩC තාක්ෂණ උද්‍යානයේ පැවති විවෘත දින ප්‍රදර්ශනය

6.8.8 සහභාගි වූ රූපවාහිනී හා ගුවන්විදුලි වැඩසටහන්

දිනය	වැඩසටහන
11.03 2017	"ලිය වරුණ - 2017" තොරතුරු තාක්ෂණ ඒකකය
24.05.2017	සිරස ටීවී විසින් නිෂ්පාදනය කරනු ලබන කැදැල්ල වැඩසටහනේ කෙටි වීඩියෝ දර්ශන විකාශනය කිරීම
21.06.2017	ගෘහස්ථ ජෛව වායු පද්ධතිය සහ දෘෂ්‍ය ජලය පිරිපහදු කිරීම පිළිබඳ විදුලොව වැඩසටහනේ පටිගත කිරීම
16.07. 2017	වියදම එලදායී ගොඩනැඟිලි තාක්ෂණය පිළිබඳ කැදැල්ල රූපවාහිනී වැඩසටහන
23.07. 2017	වියදම එලදායී ගොඩනැඟිලි තාක්ෂණය පිළිබඳ කැදැල්ල රූපවාහිනී වැඩසටහන
06.08. 2017	වියදම එලදායී ගොඩනැඟිලි තාක්ෂණය පිළිබඳ කැදැල්ල රූපවාහිනී වැඩසටහන
13.08. 2017	වියදම එලදායී ගොඩනැඟිලි තාක්ෂණය පිළිබඳ කැදැල්ල රූපවාහිනී වැඩසටහන
20.08.2017	වියදම එලදායී ගොඩනැඟිලි තාක්ෂණය පිළිබඳ කැදැල්ල රූපවාහිනී වැඩසටහන
01.09.2017	ස්වාධීන රූපවාහිනී අයාතනයේ "මල්පාර" තොරතුරු තාක්ෂණ ඒකකයේ වැඩසටහන
26.07.2017	ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ පැවති සජීවී වැඩසටහන "සඳමිණි ආර" (කාන්තා සහරාව) යටතේ නර්ඩ් තාක්ෂණ හා නිමැවුම් ස්වයං රැකියා සහ ගෘහ අපද්‍රව්‍ය කලමනාකරණය සඳහා වූ වැඩසටහන
17 & 24.08. 2017	විදුලොව විද්‍යාත්මක වැඩසටහන් 02 ක්
29.08. 2017	සජීවී වැඩසටහන "සඳමිණි ආර" (කාන්තා සහරාව) තොරතුරු තාක්ෂණ ඒකකය

6.8.9 පල කරණ ලද ලිපි

	පුවත්පත් ලිපි සහවෙබ් ලිපි
1	විද්‍යා සහරාවෙ හි ලිපිය - 26.04.2017
2	බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ හි වෙබ් අඩවිය-ව්‍යවසායක ප්‍රදර්ශනයෙහි ලිපිය
3	ගංවතුරට ගොදුරු වූවන්ට උපකාර කිරීම සම්බන්ධයෙන් වෙබ් අඩවියේ ලිපිය
4	නිපුනතා සහරාවේ ලිපිය - ජූලි 2017
5	විද්‍යා සහරාවෙ හි ලිපි – 2017 අගෝස්තු වෙළුම
6	නිපුනතා සහරාවේ ලිපි - සැප්තැම්බර් 2017
7	නිපුනතා සහරාවේ ලිපිය - නොවැම්බර් 2017
8	අන්තර්ජාල ලිපි ලේඛන 02 ක් - ඉන්කියුබේටර් විවෘත කිරීම සහ විවෘත දින ප්‍රදර්ශනය 2017
9	විවෘත දිනය දෙරණ රූපවාහිනී ටෙලි නාට්‍ය (නොවැම්බර් 01 සිට 10 දක්වා)
10	සමාජ මාධ්‍ය සඳහා යොමුවීම - ෆේස්බුක් පිටුව
11	වත්මන් පිරිවැය ඵලදායි ගොඩනැගිලි ඉදිකිරීමේ බලපත්‍රලාභීන් සඳහා අඩි පාලම ඉදිකිරීම පිළිබඳ වැඩමුළුව.
12	ත්‍රිකුණාමලය හා කෑගල්ල දිස්ත්‍රික්කයේ ලේකම් කාර්යාලවල පැවති නර්ඩ් අඩි පාලම් තාක්ෂණය සහ අනෙකුත් තාක්ෂණයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්.
13	වෙළඳ දැන්වීම් 03 ක් දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් වල නර්ඩ් තාක්ෂණික උද්‍යානය 2017 නොවැම්බර් 10 දින මහජනයාට නොමිලේ නැරඹීමට විවෘත බව
14	ස්වාධීන රූපවාහිනී ආයතනයේ හිරු ටීවී ආයතනයේ ප්‍රධාන පුවත් සහරාවේ ඉන්කියුබේටර් විවෘත කරන ලද බව.

6.8.10 2017 වර්ෂය තුළදී සකස් කරනු ලැබූ පේටන්ට් බලපත්‍ර

පහත සඳහන් තාක්ෂණයන් සඳහා පේටන්ට් අයදුම්පත් ඉදිරිපත් කරන ලදී.

පේටන්ට් අංකය	පේටන්ට් බලපත්‍රය	ලිපි භාරදීම
19589	දුම් ගැසූ මාළු සැකසීමේ ඒකකය සඳහා	09/11/2017
19590	කකුලේ ඇඟිලි වලින් ක්‍රියා කරන රොබෝ අත	09/11/2017
19598	යාන්ත්‍රිකරණය කරන ලද ස්ලිප්-ස්වරූපයේ බිත්ති ඉදිකිරීමේ උපකරණය	16/11/2017

6.8.11 තාක්ෂණ උද්‍යානය සහ ඉංජිනේරු කෞතුකාගාරය නැරඹීම

මධ්‍යස්ථානයේ තාක්ෂණ උද්‍යානය සහ ඉංජිනේරු කෞතුකාගාරය සෑම සතියකම අඟහරුවාදා සිට සෙනසුරාදා දක්වා දිනයන්හි විවෘතව පවතී.

2017 වර්ෂය තුළ තාක්ෂණ උද්‍යානය නැරඹූ සංඛ්‍යා පහත පරිදි වේ.

ශිෂ්‍ය සංඛ්‍යාව	-	8,687
ගුරුවරුන්	-	894
පොදු මහජනතාව	-	1,623

ලබා ඇති මුළු ආදායම	-	රු. 685,900.00
		===========

07. සුභසාධන හා ආගමික කටයුතු

ආයතනික කාර්ය මණ්ඩලයේ අන්තර් පුද්ගල සබඳතා, සහයෝගීතාවය, කණ්ඩායමක් වශයෙන් කටයුතු කිරීම, ආයතනික පොදු කටයුතු සඳහා දක්වන කැපවීම යනාදිය වර්ධනය කරලීමේ අරමුණින් සේවක සුභසාධක හා ආගමික ක්‍රියාකාරකම් සඳහාද ආයතනය විසින් විශේෂ අවධානයක් දී කටයුතු කරනු ලබේ. ඒ අනුව, 2017 වර්ෂයේදී මධ්‍යස්ථානයේ සේවක සුභසාධක සංගමය හා ආගමික සංගම් විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් සාරාංශයක් ලෙස පහත සඳහන් වේ.

7.1 සුභසාධක සංගමය

2017 වර්ෂය තුලදී මධ්‍යස්ථානයේ සුභසාධක සංගමය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

- නර්ඩ් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ සහ ඔවුන්ගේ දුවා දරුවන්ගේ සහභාගීත්වයෙන් බක්මහ උළෙලක් සංවිධානය - 2017.04.26
- ආයතනයේ පුරෝගාමී සභාපතිවරයෙකු වූ විද්‍යාජෝති ඒ.එන්.එස් .කුලසිංහ මැතිතුමාගේ ජන්ම දිනය නිමිතිකරගෙන වාර්ෂිකව පවත්වනු ලබන ලේ දන්දීමේ වැඩසටහන සංවිධානය කිරීම - 2017.10.27
- නර්ඩ් කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් සුහද හමුවක් සංවිධානය කිරීම - 2017.12.29

7.2 ආගමික සංගම්

බෞද්ධ සංගමය හා කතෝලික සංගමය යන සංගම් දෙක මධ්‍යස්ථානය තුල ආගමික කටයුතු සම්බන්ධයෙන් ප්‍රමුඛව ක්‍රියාත්මක වේ. මධ්‍යස්ථානයේ සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාත්මීය හා මානසික සංවර්ධනය සඳහා විවිධ වූ වැඩසටහන් මෙම සංගම් දෙකෙහි පුරෝගාමීත්වයෙන් සිදු කරනු ලැබේ. මධ්‍යස්ථානයේ සෑම සේවකයෙකුම ස්වේච්ඡාවෙන් මෙම සංගම් දෙකෙන් එකක සාමාජිකත්වය හිමිවීම විශේෂත්වයකි.

එම සංගම් 2017 වර්ෂය තුලදී පහත සඳහන් ආගමික හා සමාජ සත්කාර ක්‍රියාකාරකම්හි නිරතව ඇත.

7.2.1 බෞද්ධ සංගමය

- මධ්‍යස්ථානයේ නව වසරේ කටයුතු ඇරඹීම නිමිත්තෙන් 2017.01.02 දින සෙත් පිරිත් සජ්ඣායනයක් පැවැත්වීම
- පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාමවාසී කුකුල්පනේ සුදස්සී ස්වාමින්වහන්සේ විසින් 2017.03.21 දින සුමධුර ධර්ම දේශනයක් පැවැත්වීම
- වෙසක් පොහොය නිමිතිකරගෙන ශාස්ත්‍රපති පූජ්‍ය කිඹුලාපිටිය විමලානන්ද ස්වාමීන් වහන්සේ විසින් 2017.05.08 දින සුමධුර ධර්ම දේශනයක් පැවැත්වීම
- කොත්මලේ අඹතලාව ප්‍රඥාප්‍රදීප පිරිවෙනේ 2017 වසරේ කඨින පිංකම සිදු කිරීම සහ ඒ සඳහා සහභාගී වීම. - 2017.10.08 සහ 09 දින
- 2017.10.25 වන දින ජාඇල, වැලිගම්පිටිය ජයවර්ධන ළමා නිවාසයේ දරුවන් සඳහා දිවා ආහාරය හා පරිත්‍යාගයන් සිදුකිරීම.

7.2.2 කතෝලික සංගමය

- ආයතනයේ වාර්ෂිකව පවත්වනු ලබන නත්තරල් දේව මෙහෙය 2017.12.18 දින මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පැවැත්වීම

08. ගිණුම්කරණ ප්‍රතිපත්ති

8.1.1 මූල්‍ය වාර්තා පිළියෙල කරන පදනම

මෙහි සමන්විත මූල්‍ය ප්‍රකාශන මත මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සාදා ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලවය.

ප්‍රවර්තන ගිණුම් වර්ෂය ලෙස සලකා ඇත්තේ 2017.01.01. සිට 2017.12.31 කාලපරිච්ඡේදයය.

8.1.2 අගය කරලීම හා ගිණුම්ගත කරන පදනම

මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීම පිළිබද ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම හා ඓතිහාසික පිරිවැය සංකල්ප මත පදනම්වය.

8.1.3 ගණුදෙණු ක්‍රියාත්මක වූ හා ඉදිරිපත් කරන මූල්‍ය ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පිළිබිඹු වන ගණුදෙණු සිදු කර ඇත්තේ හා ඉදිරිපත් කර ඇත්තේ මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයෙහි භාවිතා වන මූල්‍ය ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. එසේ නොවන අවස්ථාවකදී ඒ පිළිබඳ වෙනම දක්වා ඇත.

8.1.4 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ 2016.12.31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදයටය. මෙහිදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ගිණුම්කරණ සටහන් ප්‍රවර්ථන කාලපරිච්ඡේදය හා සැසදිය හැකි වනු ඇත.

8.1.5 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්වය කරලීම, ඇස්තමේන්තු හා උපකල්පනයන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුව මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති, වත්කම්, වගකීම්, ආදායම්, අසම්භව්‍ය වගකීම් හඳුනාගැනීම් සම්බන්ධයෙන් කළමණාකරණ විනිශ්වය කරලීම් ඇස්තමේන්තුගත කරලීම හා උපකල්පනයන් භාවිතා කර ඇත. කෙසේ නමුත් උපකල්පනයන් හා ඇස්තමේන්තු සම්බන්ධයෙන් වන අවිනිශ්චිතතාවයන් මත ඉදිරිපත් කරන ලද වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක ගැලපීම් ඉදිරි කාලපරිච්ඡේදයක සිදු විය හැක. මෙහිදී මධ්‍යස්ථානයේ ඉදිරි අනාගත අඛණ්ඩ පැවැත්ම හා සම්පත් ප්‍රමාණාත්මකභාවය පිළිබඳව කළමණාකාරිත්වය නිසි ඇගයීමක පිහිටා ඇත. තවදුරටත් මධ්‍යස්ථානයේ පැවැත්ම පිළිබඳව බලපාන අවිනිශ්චිත තත්වයක් හෝ සැකයක් කළමණාකාරිත්වය වෙත නොමැත. මෙනිසා මූල්‍ය ප්‍රකාශ සාදා ඇත්තේ අඛණ්ඩ පැවැත්ම යන පදනම මතය.

8.2 දේපල

8.2.1 හඳුනාගැනීම හා මැනීම

පිරියත ලෙස ගෙන ඇත්තේ ඍජුව මිළදී ගැනීම් සඳහා අදාල වන වියදම්ය. මධ්‍යස්ථානය විසින්ම ගොඩ නංවා ගනු ලැබූ වත්කම්වල පිරිවැය ලෙස ඒවායේ අභිලාෂගත අරමුණු ඉටුවන මට්ටම දක්වා දරණ ලද අමුද්‍රව්‍ය, ඍජු ශ්‍රමය හා අනෙකුත් ඍජුව හඳුනාගත හැකි වියදම් පිරිවැය ලෙස සලකනු ඇත. ප්‍රාග්ධන ප්‍රතිසංස්කරණ ගොඩනැංවීම් වලදී ගොඩනැගිලි ඉවත්කරලීම් පිරිවැය හා අදාල පරිදි ණය පොළී පිරිවැය ප්‍රාග්ධනිත කරනු ඇත.

යම් ප්‍රාග්ධන භාණ්ඩයක අත්‍යාවශ්‍ය අංගයක් ලෙස මෘදුකාංග පවතින විට එම මෘදුකාංග පිරිවැය අදාල භෞතික උපකරණය සමඟම ප්‍රාග්ධනිත කෙරේ. ප්‍රාග්ධන භාණ්ඩවල අනුයුක්ත කොටස් සඳහා වෙන වෙනම වූ ඵලදායී ජීවිත කාලයක් ඇති අවස්ථාවකදි එම භාණ්ඩයන් වෙන වෙනම හඳුනා ගැනේ. ස්ථාවර වත්කම් බැහැර කරලීමේ දී ජනිත වන ලාභ හෝ අලාභ හඳුනා ගැනෙන්නේ එම වත්කමේ විකුණුම් මිළ හා පොත්වල ඇති ශුද්ධ අගය සැසඳීමෙනි. මෙම උපලබ්ධි ලාභය/අලාභය අමතර ආදායම් හෝ අමතර වියදම් ලෙස හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් හරලන අවස්ථාව වන විටදී ඒ හා අදාල අගයක් ප්‍රත්‍යාගණන සංචිතය තුල පවතින්නේ නම් එය ඉදිරියට ගෙනා රඳවාගත් ඉපැයුම් ශේෂය සමග ගැලපේ.

8.2.2 ප්‍රත්‍යාගණනය

මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කිරීම සඳහා දේපල හා පිරියත සමගාමීව ප්‍රත්‍යාගණනය කරනුයේ එකම කාණ්ඩයට අයත් වත්කම් තෝරාගෙන වටිනාකම හා දින අතර ඇති වෙනස ඉවත් කිරීමටය.

වත්කම් කාණ්ඩවල ප්‍රත්‍යාගණනය පෙරෙලෙන පදනමක් යටතේ ප්‍රත්‍යාගණනය කරනුයේ වත්කම් කාණ්ඩ වල අගය සුලු කාලයක් ඇතුලතදී යාවත්කාලීන කිරීමටය.

දේපල හා පිරියත වල සාධාරණ අගය සාමාන්‍යයන් නිර්ණය කරන්නේ වෙළඳ අගය පදනම් කරගෙනය. වත්කම් වල ඇගයීම සිදු කරනු ලබන්නේ අගයන් පිළිබඳ වෘත්තීමය දැනුමක් ඇති කණ්ඩායමක් විසිනි. වත්කම් වැඩි ප්‍රමාණයක සාධාරණ අගය ගනු ලබන්නේ වෙළඳපොලේ සඳහන් මිල අනුවය.

ප්‍රත්‍යාගණනය කිරීමේදී වත්කම් කාණ්ඩ වල අගයෙහි වැඩිවීමක් ලැබූ විට එය ප්‍රත්‍යාගණන අතිරික්තයක් ලෙස පෙන්වයි. කෙසේ වෙතත් ඌනතාවයක් පෙන්නුම් කරන අවස්ථාවේදී අතිරික්තය සමතුලිත වන සේ ඌනතාවය කපා හැරේ. ප්‍රත්‍යාගණන අතිරික්තය එකම කාණ්ඩයක් යටතේ ඇති වත්කම් වලින් කපා හැරීම මිස වෙනත් කාණ්ඩයක ඇති අතිරික්ත වලින් කපා හැරීම සිදු නොකෙරේ.

8.2.3 ක්ෂය කරලීම

වත්කම් ක්ෂය කරලීම වත්කම් වල පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කරලීමෙන් අනතුරුව එන අගය මත පදනම් වනු ඇත. යම් වත්කමක් සංයුතියෙහි ඇති ප්‍රමාණාත්මක වැදගත් අංශයන්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය විවිධ වන අවස්ථාවලදී ඒවා වෙන වෙනම ක්ෂය කරලීමට භාජනය කරනු ඇත. වත්කම් වල ක්ෂය ඒවායේ ඇස්තමේන්තුගත ජීවිත කාලය තුල ලාභාලාභ ගිණුමෙහි පෙන්වනු ඇත. සලකා බලන වර්ෂයේදී හා පසුගිය වර්ෂයේදී මෙම ඇස්තමේන්තුගත අනුපාතයන් පහත පරිදිය.

වත්කම් කාණ්ඩය	ක්ෂය%
ගොඩනැගිලි	2.5
කාර්යාල උපකරණ	15
උපකරණ	15
ප්‍රදර්ශන භාණ්ඩ	15
පරිගණක යන්ත්‍ර	331/3
රථ වාහන	15
ලී බඩු උපකරණ	10
යන්ත්‍රෝපකරණ සහ විද්‍යාගාර පහසුකම්	15
පුස්තකාල පොත්	05
යටිතල පහසුකම්	15
මෘදුකාංග	33 1/3

8.2.4 පොත්වලින් ඉවත්කරලීම

වත්කමක ගෙන යන අගය පොත්වලින් ඉවත්කරලීම එහි අනාගත ඇස්තමේන්තුගත ප්‍රතිලාභ නොමැති විටදී හෝ එය ඉවත් කරනු ලබන විටකදී සිදු කරනු ඇත. වත්කම් බැහැර කරන අවස්ථාවකදී සිදුවන ලාභ හා පාඩු, වත්කම් වල විකුණුම් අගය හා ශුද්ධ අගය අතර වෙනස සැසඳීමෙන් ගන්නා අතර එය මෙහෙයුම් වාර්තාවන්හි අනෙකුත් ආදායම් යටතේ දක්වනු ඇත.

8.2.5 අස්පෘශ්‍ය වත්කම්

මධ්‍යස්ථානය විසින් අත්පත් කරගන්නා ලද නිශ්චිත ජීවන කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් අගය කරනු ලබන්නේ පිරිවැයෙන් ඒවායේ ක්‍රම ක්ෂය හා මුලු අගය අඩුවීමද ගැලපීමෙනි. අනතුරුව ලැබෙන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එම වියදම නිසා අදාල අස්පෘශ්‍ය වත්කමෙහි අනාගත ප්‍රතිලාභ ලැබීම වර්ධනය වන ස්වරූපයක් ඇති නම් පමණි. ක්‍රම ක්ෂය කරනු ලබන්නේ පිරිවැය හා අවශේෂ අගය අතර වෙනසටය. ක්‍රම ක්ෂය අගය මෙහෙයුම් ප්‍රකාශයන්හි සරල මාර්ග ක්ෂය ක්‍රමයට අදාල අනුපාතය මත පෙන්නුම් කෙරේ. භායනය කරනු ලබන්නේ අස්පෘෂ්‍ය වත්කම මධ්‍යස්ථානයේ භාවිතයට ගත් දින සිටය. අස්පෘෂ්‍ය වත්කමෙහි ඇස්තමේන්තුගත අනුපාතයන් සමාලෝචිත වර්ෂයන් හා සංසන්දනාත්මකව පහත දී ඇත.

- මෘදුකාංග - 33 1/3 %

8.3 තොග

තොග අගය කර ඇත්තේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අවමය සලකාය. තොග පිරිවැය FIFO තොග නිකුත් කරලීමේ මූලධර්ම මත පදනම්ව ඇත. තොගයන් වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා දරනු ලැබූ වියදම් ඒවායේ පිරිවැය ලෙස ඇත.

රසායනාගාර තොග හා කෙරීගෙන යන වැඩ ඒවායේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන්නෙන් අඩු අගයට ගෙන ඇත.

8.4 ලැබිය යුතු වෙළඳ ශේෂ

වෙළඳ ශේෂ ප්‍රථමයෙන්ම සාධාරණ අගය මත පදනම්ව හඳුනා ගැනේ. අනතුරුව ඵලදායී පොලී අනුපාතය මත අගය හීනවීම වට්ටම් කරලීම හා අගය පිරිහීම මත වෙන් කරලීමක්ද කරනු ලැබේ.

8.5 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගනු ලබන්නේ අතැති මුදල්, බැංකු මුදල්, තාවකාලික කැඳවුම් තැන්පතු හා රාජ්‍ය ආයතනවල අතිරික්ත තැන්පතු ගිණුම්ය.

8.6 දෙන ලද ණය හා ලැබිය යුතු ගිණුම්

යම්කිසි ස්ථාවර හෝ නිශ්චිත ගෙවීම් සිදු කරන හා වෙළඳපොල තුල සංසරනය නොවන ණය දීම් මුලින්ම සාධාරණ අගය හා සෘජුව ස්ථාපනය කල හැකි වියදම් මත පදනම්ව හඳුනා ගැනෙනු ඇත.

8.7 මූල්‍ය වගකීම්

ව්‍යුත්පන්නයන් නොවන මූල්‍යමය වගකීම් අනෙකුත් මූල්‍යමය වගකීම් ලෙස හඳුනා ගැනේ. මෙම අනෙකුත් මූල්‍යමය වගකීම් ලෙස නියෝජනය වන්නේ වෙළඳ ගෙවිය යුතු ගිණුම් හා සම්බන්ධිත පාර්ශවයනට කල යුතු ගෙවීම්ය. මෙම වගකීම් ප්‍රථමයෙන්ම හඳුනාගනු ලබන්නේ සාධාරණ අගයට යම් සෘජුව හඳුනාගත හැකි පිරිවැය ගැලපීමෙනි. මූල්‍ය තත්ව ප්‍රකාශනයේදී මූල්‍ය වගකීම් හා මූල්‍ය වත්කම් එකිනෙකට හිලව් කර පෙන්වනු ලබන්නේ මධ්‍යස්ථානයට ඒ සඳහා නීතිමය අයිතියක් පවතින්නේ නම් පමණි.

8.8 සේවක ප්‍රතිලාභ වගකීම්

සේවය හැරයාමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ ව්‍යවස්ථාපිතව දක්වා ඇති පරිදි සිදු කර ඇත. සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා මධ්‍යස්ථානයේ දායකත්වය පිළිවෙලින් 15% හා 3% ක් වේ. 1983 අංක 12 දරණ පනත ප්‍රකාරව පාරිතෝෂික වෙන් කර ඇත. පාරිතෝෂික වෙන්කරලීම සඳහා මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන සපයනු ලැබේ. මෙම පාරිතෝෂික වෙන්කරලීම පහත පරිදි ගනනය කෙරේ. (අවසන් වරට ගත් මූලික වැටුප + ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් අදාල දීමනා /2 x සම්පූර්ණ කර ඇති වර්ෂ ගණන)

8.9 වෙන්කරලීම්

මින් නියෝජනය වන්නේ අතීතයේදී ඇතිවුනු සිද්ධියක් මත මධ්‍යස්ථානය වෙත වර්තමානයේදී හඳුනාගත හැකි නීතිමය හෝ ඵලදායි ස්වරූපයේ බැඳීම් මත විශ්වාසනීයව පූර්වකථනය කරගත හැකි අනාගත මූල්‍ය පිටතට ගලා යාමය.

8.10 වෙන්කරලීම්, අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම්

ශේෂපත්‍ර දිනට මධ්‍යස්ථානය වෙත ඇති ප්‍රමාණය ඇස්තමේන්තු කර ගත හැකි, අනාගත සම්පත් පිටව යාමක් විය හැකි බැදියාවන් සඳහා වෙන් කරලීම් තබනු ඇත. අසම්භාව්‍ය වගකීම් සඳහා ශේෂ පත්‍රයේ සටහන් ලෙස දක්වා ඇත.

8.11 ආදායම් හඳුනා ගැනීම

යම්කිසි ආදායමක් විශ්වාසවන්තව ගණනය කලහැකි නම් හා ඊට අදාල ආර්ථික ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානය වෙත හැකියාවක් ඇති අවස්ථාවේදී ආදායම් හඳුනා ගැනේ. ලැබී ඇති හා ලැබීමට ඇති අගයන්ගේ සාධාරණ අගයට වට්ටම් හා බදු ඉවත් කරලීමෙන් ආදායම් හඳුනා ගනී. ආදායම් හඳුනා ගැනීමේදී පහත දැක්වෙන විශේෂ ලක්ෂණයන් පදනම් කරගෙන ඇත.

a) සංවර්ධනය කරන ලද භාණ්ඩ විකිණීම

අදාල තාක්ෂණයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මකව ප්‍රතිලාභයේ හා අවදානමේ හිමිකාරිත්වයේ අයිතිය මාරු වීම සිදුවන අවස්ථාවේදී ආදායම හඳුනා ගනී. පවරනු ලැබූ තාක්ෂණයන් සම්බන්ධයෙන් පසු කාලින කළමණාකාරිත්ව හෝ පාලන මැදිහත් වීමක් මධ්‍යස්ථානය දරණු නොලැබේ.

b) සේවා සැපයීම

සේවා ආදායම හඳුනාගනු ලබනුයේ අදාල සේවාව ජනනය වූ හෝ කරනු ලැබූ කාල පරිච්ඡේදයටය.

c) කොන්ත්‍රාත් ආදායම

කොන්ත්‍රාත්තුවක ආදායම එහි සමස්ථ ප්‍රතිඵලය විශ්වාසනීයව අගය කල නොහැකි විටකදී කර ඇති වැඩ ප්‍රතිශතය මත ලබා ගනී.

d) බදු

ව්‍යවස්ථාපිතව මධ්‍යස්ථානය ගෙවිය යුතු වන ආදායම් බදු එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු යනාදිය අදාල ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවනු ලැබේ.

e) පොලී ආදායම

උපචිත වන අවස්ථාවේදී පොලී ආදායම හඳුනා ගනී.

f) ජංගම වත්කම් බැහැර කරලීමෙන් ජනිත වන ලාභ හා අලාභ

ජංගම නොවන වත්කම් වල විකුණුම් මිලෙන් එම වත්කම් වල ශුද්ධ පොත් අගය හා ඒවා බැහැර කරලීමට කරනු ලබන අනෙකුත් වියදම් ද අඩු කරලීමෙන් පසු ලැබෙන ප්‍රතිඵලය ආදායම ප්‍රකාශනයට ගනු ලැබේ. තවද ප්‍රමාණාත්මක වශයෙන් අඩු අගයකින් සමන්විත ජංගම නොවන වත්කම් වල ඉවත් කරලීම එකිනෙකට වෙන වෙනම නොව පොදුවේ ශුද්ධ අගය දක්වනු ලැබේ.

g) අනෙකුත් ආදායම්

අමතර ආදායම් ලෙස තාක්ෂණික පැවරුම් කටයුතු වල ශුද්ධ ලාභය, කැඳවුම් තැන්පතු හා බැඳුම්කර පොලී ආදායම කාල ප්‍රමාද දඩ මුදල්, ලබා දී ඇති ණය වලට පොලී, නැවත නොගෙවන තැන්පතු, සැපයුම්කරුවන් ලියාපදිංචි කරලීම, සුළු ආදායම්, හානි වූ තොග විකුණුම්, ජංගම නොවන වත්කම් බැහැර කරලීම් ආදායම හා පොදු කාර්ය අයකර ගැනීම ආදිය ඇතුලත් වේ.

h) විලම්භීත ආදායම

රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් අත්පත් කර ගන්නා ජංගම නොවන වත්කම් වලට අදාල ක්ෂය වෙන් කරලීම් වලින් විලම්භීත ආදායම සමන්විත වේ.

8.12 ප්‍රදානයන්

ප්‍රදානයන් ලෙස ආදායම් ප්‍රකාශන වල දක්වනු ලබන්නේ ලැබීම සඳහා සාධාරණ සහතික වීමක් ඇති හා ලබා ගැනීම උදෙසා මධ්‍යස්ථානය විසින් සියළුම කොන්දේසි සපුරා ඇති විටකදිය. ප්‍රදානයන් ලැබීමේදී එය අදාල කාල පරිච්ඡේදයේදී ආදායමක් ලෙස සලකා එමගින් ආවරණය වන වියදම් සමඟ ගලපා ඇත. යම්කිසි ස්ථාවර වත්කමක් ලබා ගැනීම සඳහා අදාල වන පරිදි ලැබී ඇති ප්‍රදානයන් මත විලම්භීත ආදායම් ගණනය කෙරේ. මධ්‍යස්ථානයට මූල්‍ය නොවන ප්‍රදානයන් ලැබීමේදී සාධාරණ අගය මත ගණනය කරනු ලැබේ.

8.13 වියදම්, ආදායම් ප්‍රකාශනයන්හි ඉදිරිපත් කරලීම

ආදායම් ප්‍රකාශන වලදී ආදායමට අදාලව ජනනය වී ඇති වියදම සමඟ ගලපා ඇත. මධ්‍යස්ථානයේ එදිනෙදා කටයුතු පවත්වා ගෙන යාමේ වියදම්, ජංගම නොවන වත්කම් වලට සම්බන්ධ ක්ෂය වැනි ආදායමට එරෙහිව ගොඩනැගෙන්නා වූ වියදම සලකනු ඇත.

8.14 පර්යේෂණ හා සංවර්ධන වියදම

පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා ප්‍රමුඛතම මූල්‍යකරණය භාණ්ඩාගාරය මගින් ඉටු කෙරේ. පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් යම් සේවාදායකයෙකු විසින් මූල්‍යකරණය කරනු ලබන විට එහි පිරිවැයට එරෙහිව ආදායමක් ලෙස සටහන් කරනු ඇත. පිරිවැය ලෙස ඍජු පිරිවැය පමණක් සලකනු ඇත.

8.15 පර්යේෂණ සඳහා ත්‍යාග උදෙසා වෙන් කරලීම්

මධ්‍යස්ථානයේ පර්යේෂණයන් සඳහා ලැබුණා වූ ත්‍යාගයන් අදාල පර්යේෂණ ඉංජිනේරුවරුන් අතර පහත පරිදි බෙදා හැරලීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත.

a ත්‍යාගයන් ලැබීම සඳහා අදාල වූ පර්යේෂණයන් සඳහා ඍජුවම දායක වූ පර්යේෂණ ඉංජිනේරුවරුන් අතර එම ත්‍යාගයෙන් 60% ක ප්‍රමාණයක් බෙදා හැරීම. මේ සඳහා පර්යේෂකයන් ලෙසට අදාළ ත්‍යාගය සඳහා අයදුම් කරනු ලැබූ පර්යේෂණ ඉංජිනේරුවරුන් තෝරා ගැනේ.

b. මෙම අගය බෙදා හරිනු ලබන්නේ අදාළ ත්‍යාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දින පැවති වැටුප් මත පදනම්වය.

c. මෙම ත්‍යාග පිරිනැමීම් ක්‍රමවේදය අතීත ප්‍රදානයන් හා අනාගත ප්‍රදානයන්ට යන දෙකටම අදාළ වේ.

d. අතීත ත්‍යාගයන් සඳහා පිරිනැමීම් කරනු ලබන්නේ ඒවා පිරිනමන දින වන විට මධ්‍යස්ථානයේ සිටින්නා වූ පර්යේෂකයන්ට පමණි. (නමුත් ගණනය කරලීම සඳහා සියළුම කණ්ඩායම් සාමාජිකයන් සලකා බලනු ලැබේ.)

e. සේවයේ නොසිටින සේවකයන්ට හිමි කොටස හා ඉතිරි 40% ක ප්‍රමාණය නර්ඩ් මධ්‍යස්ථානයේ ඉදිරි පර්යේෂණ සංස්කෘතික දියුණුවට යොදා ගන්නා බව සභාපති තුමා අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දී ඇත.

09. 2017.12.31 දිනට තත්ව ප්‍රකාශය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

2017.12.31 දිනට තත්ත්ව ප්‍රකාශය (අගය - රුපියල්)

විස්තරය	2017	2016
වත්කම්		
ජංගම වත්කම්		
මුදල් හා මුදල් සමාන දෑ	136,516,464.38	95,484,593.69
වෙළඳ ණය ගැතියෝ	2,835,586.32	26,268,321.13
තොග	9,254,216.45	9,372,054.11
කලින් ගෙවීම්	815,851.44	701,155.98
වෙනත් ජංගම වත්කම්	79,959,745.12	45,736,233.42
	229,381,863.71	177,562,358.33
ජංගම නොවන වත්කම්		
දේපල හා පිරියත		
අනෙකුත් අස්පෘශ්‍ය වත්කම්	547,326,563.44	581,193,032.51
වෙනත් ජංගම නොවන වත්කම්	345,770.45	312,420.45
	26,771,564.62	25,651,942.83
	574,443,898.51	607,157,395.79
මුළු වත්කම්	803,825,762.22	784,719,754.12
බැරකම්		
ජංගම බැරකම්		
වෙළඳ හා අනෙකුත් ගෙවියයුතු දෑ		
මුළු ජංගම බැරකම්	38,330,467.02	33,169,313.17
ජංගම නොවන බැරකම්	38,330,467.02	33,169,313.17
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්		
සුරක්ෂිත තැන්පතු	101,529,300.36	98,094,019.75
	6,200.00	6,200.00
මුළු බැරකම්	101,535,500.36	98,100,219.75
ශුද්ධ වත්කම්	139,865,967.38	131,269,532.92
	663,959,794.84	653,450,221.20
ශුද්ධ වත්කම්/ස්කන්ධය		
විලම්භිත ආදායම්		
රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්	67,626,350.93	103,967,207.79
ප්‍රත්‍යාගනන සංචිතය	302,607,774.43	250,560,299.26
සමුච්චිත අතිරික්තය/(ඌනතාවය)	535,207,831.83	535,275,831.83
	(241,482,162.35)	(236,353,117.68)
ශුද්ධ වත්කම්/ස්කන්ධය		
	663,959,794.84	653,450,221.20

ඉංජි. ඩබ් ජේ එල් එස් ප්‍රනාන්දු
සභාපති

ඉංජි. ඩී ඩී ඒ නාමල්
අධ්‍යක්ෂ ජනරාල්

ඩී වී එස් පෙරේරා
අධ්‍යක්ෂිකා මුදල්

10. 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් වර්ගීකරණය කාර්‍ය පදනම මත විදහා පෑම

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් වර්ගීකරණය කාර්‍ය පදනම මත විදහා පෑම

(මූල්‍ය ඒකකය - රුපියල්)

විස්තරය	2017	2016
<u>අයභාරය</u>		
අනෙකුත් රාජ්‍ය අස්තිත්වයන්ගෙන් හුවමාරු	259,040,000.00	231,025,150.00
විලම්භිත ආදායම්	57,860,922.57	53,875,510.82
අනෙකුත් අයභාරය	23,774,133.92	28,015,620.20
මුළු අයභාරය	340,675,056.49	312,916,281.02
<u>වියදම්</u>		
පරිපාලන පිරිවැය	255,830,901.09	236,291,492.37
අනෙකුත් වියදම්	27,454,993.39	21,116,555.70
ක්ෂය	62,471,359.75	59,596,057.96
මූල්‍ය වියදම	46,846.93	94,439.63
මුළු වියදම	345,804,101.16	317,098,545.66
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)	(5,129,044.67)	(4,182,264.64)

11. 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය (මූල්‍ය ඒකකය -රුපියල්)

විග්‍රහය	2017	2016
මෙහෙයුම් මත ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ අතිරික්තය/ඌනතාවය	(5,129,044.67)	(4,182,264.64)
මුදල් නොවන වෙනස්වීම		
ක්ෂයවීම්	62,471,359.75	59,596,057.96
අඩමාන ණය සඳහා වෙන් කිරීම්වල වැඩිවීම	(113,107.71)	(1,042,716.03)
විලම්භිත ආදායම් (වැඩිවීම/ අඩුවීම)	(57,860,922.57)	(53,875,510.82)
ගෙවිය යුතු වියදම් වල වැඩිවීම/ අඩුවීම	2,331,280.27	(9,207,023.19)
සේවක පිරිවැය (වැඩිවීම/ අඩුවීම)	6,251,393.36	(33,468.75)
දේපල හා යන්ත්‍රෝපකරණ විකුණුම් (ලාභ/පාඩු)	1,216,644.34	1,523,208.79
අනෙකුත් ජංගම වත්කම් (වැඩිවීම/ අඩුවීම)	(35,326,230.46)	15,730,337.84
ලැබීම්වල (වැඩිවීම/ අඩුවීම)	23,545,842.52	(12,407,293.17)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය	(2,612,785.17)	(3,898,672.01
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
පිරියත හා උපකරණ මිළට ගැනීම්	(30,995,305.45)	(37,622,266.37)
පිරියත හා උපකරණ විකුණුම්	1,072,420.43	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(29,922,885.02)	(37,622,266.37)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන ලැබීම්	37,997,000.00	31,114,964.00
ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසමෙන් ලද අරමුදල්	35,570,540.88	
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	73,567,540.88	31,114,964.00
මුදල් හා මුදල් සමාන වත්කම් වල ශුද්ධ (වැඩිවීම/අඩුවීම)	41,031,870.69	(10,405,974.38)
කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	95,484,593.69	105,890,568.07
කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	136,516,464.38	95,484,593.69

12. 2017.12.31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

2017.12.31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

	ආරම්භක ප්‍රාග්ධනය	රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන	භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් නොවන ප්‍රදානයන්	විලම්භිත ආදායම්	අනෙකුත් මාර්ග වලින් ලද ප්‍රාග්ධනය	යලි සැකසූ ප්‍රත්‍යාගණන සංචිතය	සමුච්චිත ලාභ/ අලාභය	මුළු ශුද්ධ ස්කන්ධය	2016.12.31 දිනට යලි සැකසූ ශේෂය
2016/01/01 දිනට ශේෂය	1,000,000.00	56,124,025.77	51,325,000.00	120,285,393.23	148,553,634.87	535,275,831.83	(232,170,853.04)	680,393,032.66	472,808,421.99
2016 වර්ෂයේ වත්කම් ස්කන්ධයේ වෙනස්කම්									
ලද ප්‍රාග්ධන ප්‍රදානයන්		31,114,964.00						31,114,964.00	31,798,897.00
වාහන ප්‍රදානයන්									7,975,000.00
විලම්භිත ආදායමට මාරු කල ප්‍රාග්ධන ප්‍රදාන		(37,557,325.38)		(16,318,185.44)				(53,875,510.82)	(39,230,133.16)
අනෙකුත් මාර්ග වලින් ලද ප්‍රාග්ධනය									28,568,545.00
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)							(4,182,264.64)	(4,182,264.64)	(2,238,655.09)
ප්‍රත්‍යාගනන සංචිත අතිරික්තය									180,710,956.92
2016.12.31 දිනට ශේෂය	1,000,000.00	49,681,664.39	51,325,000.00	103,967,207.79	148,553,634.87	535,275,831.83	(236,353,117.68)	653,450,221.20	680,393,032.66
<u>2017 වර්ෂයේ ස්කන්ධයේ වෙනස්කම්</u>									
ලද ප්‍රාග්ධන ප්‍රදානයන්		37,997,000.00						37,997,000.00	31,114,964.00
ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසමෙන් ලද අරමුදල්		35,570,540.88						35,570,540.88	
වාහන ප්‍රදානයන්									
විලම්භිත ආදායමට මාරු කල ප්‍රාග්ධන ප්‍රදාන		(21,520,065.71)		(36,340,856.86)				(57,860,922.57)	(53,875,510.82)
අනෙකුත් මාර්ග වලින් ලද ප්‍රාග්ධනය									
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)							(5,129,044.67)	(5,129,044.67)	(4,182,264.64)
ප්‍රත්‍යාගනන සංචිත අතිරික්තය						(68,000.00)		(68,000.00)	
2017.12.31 දින ඉදිරියට ගෙන ගිය ශේෂය	1,000,000.00	101,729,139.56	51,325,000.00	67,626,350.93	148,553,634.87	535,207,831.83	(241,482,162.35)	663,959,794.84	653,450,221.20

13. 2017.12.31 දිනට ගිණුම්කරණ සටහන්

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

2017.12.31 දිනට ගිණුම්කරන සටහන් පූර්ව වර්ෂ ගැලපීම (අගය - රුපියල්)

අංකය යොමුව	විස්තරය	ගැලපුම් විස්තරය	2016	2016.01.01 දිනට පෙර ශේෂය	මූල්‍ය තත්ත්වයට බලපෑම
1.1	RED/COM/67/15 සත්ත්වෝද්‍යානය - රු.45,226.00 වූ බලවර්ධන ඉංජිනේරු ආයතනයට කරන ලද අධි වෙන්කරලීම ඉවත් කරලීම	2016 ගැලපීමෙන් පසු ආදායම 7,270,009.38 7,270,099.38 වියදම (7,446,982.65) (7,401,756.65) ශුද්ධ අතිරික්තය/ඌනතාවය (176,883.27) (131,657.27)	45,226.00		වෙළඳ වගකීම් අඩුවීම
1.2	රු.138,563/- ක් වූ CVL/47/16 අදාල වූ CVL/42/16 ට යායුතු වියදම නිවැරදි කරලීම	CVL/47/16 2016 ගැලපීමෙන් පසු ආදායම 670,841.65 532,278.65 වියදම (267,883.11) (267,883.11) ශුද්ධ අතිරික්තය/ඌනතාවය 402,958.54 264,395.54	(138,563.00)		
		CVL/42/16 2016 ගැලපීමෙන් පසු ආදායම 188,832.24 203,832.24 වියදම (99,232.71) (99,232.71) ශුද්ධ අතිරික්තය/ඌනතාවය 89,599.53 104,599.53	15,000.00		බලපෑමක් නැත
		CVL/45/16 2016 ගැලපීමෙන් පසු ආදායම 582,798.87 706,361.87 වියදම (499,825.06) (499,825.06) ශුද්ධ අතිරික්තය/ඌනතාවය 82,973.81 206,536.81	123,563.00		
1.3	රු.55,000/- ක් වූ තාක්ෂණික පැවරුම් ගාස්තු, EMC/COM/40/16 ව්‍යාපෘතියට ආදායම් ලෙස ගැනීම නිවැරදි කෙරුණි.	EMC/COM/40/16 2016 ගැලපීමෙන් පසු ආදායම 1,024,621.01 969,621.01 වියදම (623,782.24) (623,782.24) ශුද්ධ අතිරික්තය/ඌනතාවය 400,838.77 345,838.77	(55,000.00)		බලපෑමක් නැත
		තාක්ෂණික පැවරුම් අලුත්කිරීමේ ගාස්තු 161,932.77 216,932.77	55,000.00		
1.4	වර්ෂ 2010 දී ලාම්පු පරීක්ෂා කරලීම් ව්‍යාපෘතියට අදාල පහත වැඩ ඇණවුම් පොත්වලට ගෙන නැත. වැඩ ඇණවුම් අංකය				වෙළඳ ණයගැති ඉහල යාම
	531	8,100.00			
	583	24,300.00			
	695	8,100.00			
	766	8,100.00			
	939	24,299.92		72,899.92	
	575	141,300.00		-11,900.00	
	554	(153,200.00)			
1.5	සම්පත් දායක ගෙවීම වැරදි ව්‍යාපෘතියකට අයකර තිබුණි.	RED/COM/112/16 2016 ගැලපීමෙන් පසු ආදායම 225,826.02 225,826.02 වියදම (171,936.22) (144,936.22) ශුද්ධ අතිරික්තය/ඌනතාවය 53,889.80 80,889.80	27,000.00		
		RED/COM/121/16 2016 ගැලපීමෙන් පසු ආදායම 178,940.00 178,940.00 වියදම (48,696.50) (75,696.50) ශුද්ධ අතිරික්තය/ඌනතාවය 130,243.50 103,243.50	(27,000.00)		බලපෑමක් නැත

1.6	RED/RES/92/13 ඉන්ධන දැව ක්‍රියාත්මක කිරීම 2013-2016 වියදම වියදම් ප්‍රතිපූරණය 2013 වර්ෂය	2013-2016 ගැලපීමෙන් පසු ආදායම 1,314,093.79 1,314,093.79 වියදම (600,000.00) 714,093.79 1,314,093.79		(600,000.00)	වෙළඳ වගකීම් වැඩීම
1.7	RED/COM/67/15 දෙහිවල සත්ත්වෝද්‍යානය කරන ලද වැඩ අගය අඩුවෙන් තක්සේරුව ඇත.	RED/COM/67/15 2016 ගැලපීමෙන් පසු ආදායම 7,270,099.38 7,516,626.76 වියදම (7,446,982.65) (7,446,982.65) ශුද්ධ (176,883.27) 69,644.11 අතිරික්තය/ඌනතාවය	246,527.38		ණයගැති වැඩිවීම
1.8	මධ්‍යස්ථානයෙන් ගාස්තු අය කර නොගත් බැවින් ආචාර්ය එන් සෝමරත්න හට ගෙවූ ගරු ගෙවීම් මධ්‍යස්ථානයේ ආදායමක් ලෙස ගැනීම		2,000.00		වෙළඳ වගකීම් වැඩීම
1.9	RED/RES/108/2016 ශීතකරණ පරීක්ෂා කරලීම පර්යේෂන වියදම් අඩු කෙරුණි.	2016 ගැලපීමෙන් පසු ආදායම 240,000.00 319,999.55 වියදම (257,687.13) (257,687.13) ශුද්ධ (17,687.13) 62,312.42 අතිරික්තය/ඌනතාවය	79,999.55		ණයගැති වැඩිවීම
1.10	දිරිදීමනාවලට අදාල අධිවෙන්කිරීම සහ පරිපාලන අඩුකරලීම, සේවයෙන් ඉවත්වන ලද සේවකයනට හිමි ගණන යනාදිය නැවත ගැනීම	2016 ගැලපීමෙන් පසු 5,175,398.43 6,313,171.34	1,137,772.91		වගකීම අඩුවීම
1.11	2015.12.31 දිනට ප්‍රත්‍යාගණනයේදී සිදුව ඇති ද්වි ගණන දෝෂ ඉවතලීම FA 0003478 Outside Micro meter set	අගය අගය අඩු කිරීම 68,000.00 10,200.00	10,200.00		ප්‍රත්‍යාගණන සංචිතය රු.68,000/- කින් අඩු කිරීම හා 2016 මෙහෙයුම් ප්‍රතිඵලය රු.10,200/- කින් ඉහල යාම
1.12	RED/COM/144/14 හබරාදූව ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම	2016 ගැලපීමෙන් පසු ආදායම 1,706,666.70 1,678,237.43 වියදම (1,244,893.00) (1,244,893.00) ශුද්ධ 461,773.70 433,344.43 අතිරික්තය/ඌනතාවය		(28,429.27)	කරන ලද වැඩවල අගය අඩු වීම
1.13	CVL/COM/1/91/2015 යෝජිත සායන ගොඩනැගිල්ල උදෙසා වූ වෙන්කරලීම ඉවතලීම	2015 ගැලපීමෙන් පසු ආදායම 820,593.86 820,593.86 වියදම (153,735.64) (139,185.64) ශුද්ධ 666,858.22 681,408.22 අතිරික්තය/ඌනතාවය		14,550.00	විකිණීමෙන් පසු සේවා සඳහා වූ වෙන්කරලීම අඩු නවී
1.14	RED/COM/1/91/2014 අනුරාධපුර ශික්ෂණ රෝහල - ජීවවායු ඒකකය ඉදිකිරීම රු.120,471.98 ක් වූ අවප්‍රමාණවු කෙරීගෙන යන වැඩ සැලකීම හා 2017.08.29 දින අංක 8 දරණ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී ගත් තීරණයක් පරිදි අයකරගැනීමට නොහැකි ණය ඉන්වොයිසිය පොත් වලින් කපා හැරීම	2014 ගැලපීමෙන් පසු ආදායම 700,500.00 396,282.86 වියදම (494,331.30) (494,331.30) ශුද්ධ 206,168.70 (98,048.44) අතිරික්තය/ඌනතාවය		(304,217.14)	

1.15	2015 වර්ෂයේදී වෙන්කරලීමක් තිබීම නොසලකා 2016 වර්ෂයේදී දරණ ලද වියදම	2016 ගැලපීමෙන් පසු වියදම 2,959,071.30 2,809,071.30	150,000.00		
1.16	පුස්තකාල පොත් සඳහා වූ සමුච්චිත ක්ෂය අධිවෙන් කරලීම			568,528.97	2017 වර්ෂයේ සමුච්චිත ක්ෂය අඩුකරලීම
1.17	බලශක්ති කළමණාකරන අංශයේ ගින්න හේතුවෙන් හානි වූ වත්කම් වල ක්ෂය වෙන්කරලීම අඩුවෙන් කර තිබීම		(5,895.21)		සමුච්චිත ක්ෂය අගය ඉහල යනු ඇත
1.18	උපකරණ සඳහා වන විලම්භිත ආදායම අධිප්‍රමාණය වී ඇත.		(4,304.79)		
1.19	CVL/COM/02/85/2015 නල්ලූර්, සන්දිලිපේ, ශාන්තමරුදු,සහ කහවත්ත යෝජිත විද්‍යා ගොඩනැගිලි සඳහා වන ආදායම අධිප්‍රමාණව ඇති වීම	2016 ගැලපීමෙන් පසු ආදායම 16,677,550.94 16,618,087.59 වියදම (13,383,893.14) (13,383,893.14) ශුද්ධ 3,293,657.80 3,234,194.45) අතිරික්තය/ඌනතාවය	59,463.35		කෙරීගෙන යන වැඩ අගය අඩු වේ
1.20	ගෙවිය යුතු සංස්ථාපිත ආදායම් බදු 2016 වර්ෂය සඳහා පොලී ආදායම මත රඳවා ගනු ලැබූ බද්ද 2016 වර්ෂය සඳහා සංස්ථාපිත බදු		386,480.07 (457,563.21)		ශුද්ධ ආදායම අඩු වේ
1.21	CVL/COM/86/11 පොලොන්නරුව හෙද නේවාසිකාගාරය ඉදිකිරීම තරගෙන යන වැඩ අධිප්‍රමාණය වීම	2014 & 2015 ගැලපීමෙන් පසු ආදායම 25,769,609.15 24,071,074.57 වියදම (26,579,863.43) (26,579,863.43) ශුද්ධ (810,254.28) (2,508,788.86) අතිරික්තය/ඌනතාවය		(1,698,534.58)	
1.22	2016 වර්ෂයේ දී උපචිත වූ වියදමක් 2017 වර්ෂයේදී ඇරීම		(51,880.00)		
1.23	RED/COM/83/16 විකිණීමෙන් පසු සේවා උදෙසා අධි වෙන්කරලීම RED/COM/84/16 විකිණීමෙන් පසු සේවා උදෙසා අධි වෙන්කරලීම	2016 ගැලපීමෙන් පසු ආදායම 740,000.00 740,000.00 වියදම (722,604.53) (677,864.74) ශුද්ධ 17,395.47 62,135.26) අතිරික්තය/ඌනතාවය ආදායම 685,000.00 685,000.00 වියදම (498,235.34) (459,441.98) ශුද්ධ 186,764.66 255,558.02 අතිරික්තය/ඌනතාවය	44,739.74 38,793.36		ණය හිමියන් අඩු වේ

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

2. සුරක්ෂිතයන් ලෙස තබන ලද ඇප තැන්පතු

ඇපකරය නිකුත් කරන ලද්දේ	ඇප අංකය/දිනය	සුරක්ෂිත ලෙස තබා ඇති සහතිකය	සුරක්ෂිතයෙහි වටිනාකම	බැංකුව	ඇප අගය
ටොයෝටා ලංකා පුද්ගලික සමාගම	15/2008- 19/12/2017- 18/12/2018	C/33734579-507908	100,000.00	ලංකා බැංකුව ජාඇල	75.000.00
නාගරික කොමසාරිස් කුරුණෑගල	10/2017 21/12/2017 21/12/2018	1057614-81889909 1057615-81889925 1057616-81889906	1,000,000.00 1,000,000.00 1,000,000.00	ලංකා බැංකුව ජාඇල	2,845,000.00

3. ස්ථාවර වත්කම් ඉවත්කරලීම

අගය (රු.)

වත්කම් වර්ගය	පිරිවැය	සමුච්චිත ක්ෂය	ශුද්ධ අගය	විකුණුම් අගය	ලාභය/(අලාභය)
පරිගණක	463,250.00	154,401.23	308,848.77		(308,848.77)
ප්‍රදර්ශන භාණ්ඩ	73,000.00	10,950.00	62,050.00		(62,050.00)
ලිබඩු හා සවිකිරීම්	52,066.76	5,210.59	46,856.17		(46,856.17)
උපකරණ	675,040.00	101,084.40	573,955.60		(573,955.60)
මෝටර් බයිසිකල්	765,000.00	172,209.95	592,790.05	1,072,420.43	479,630.38
කාර්යාල උපකරණ	301,000.00	45,150.00	255,850.00		(255,850.00)
පිරියත හා යන්ත්‍ර	90,968.46	13,328.57	77,639.89		(77,639.89)
ආයුධ	436,120.30	65,046.01	371,074.29		(371,074.29)
මුලු අගය	2,856,445.52	567,380.75	2,289,064.77	1,072,420.43	(1,216,644.34)

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

4. වර්ෂය තුල මධ්‍යස්ථානයේ වාහන අනතුරු

වාහන අංකය	අනතුර වූ දිනය	ඇස්තමේන්තු ගත මුදල	රක්ෂණ නියොජිත	රක්ෂණය ඉල්ලුම් කල දිනය	ලද රක්ෂිත අගය	ලද දිනය	නොලැබූ අගය	නොලැබූ අගය දරණ ලද්දේ
NB-3275	2017/03/03	154,956.75	SLI	2017/07/01	154,956.75	2017/07/20		NERDC
NB-3275	2017/04/03	11,650.00	SLI	2017/05/05	11,650.00	2017/12/15	-	-
KX-7908	2017/05/02	56,075.06	SLI	2017/06/15	56,074.86	2017/06/20	00.20	NERDC
KX-7908	2017/05/03	62,479.11	SLI	2017/06/15	62,479.07	2017/06/20	00.04	NERDC
PD-8992	2017/10/10	61,200.00	SLI	20/12/2017	Pending	Pending	61,200.00	-

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 2018/01/11 දාකම ලිපිය අනුව, PD-8992 වාහනය සම්බන්ධයෙන් වූ අයහපත් ඉල්ලුම් තත්ත්වය මත, රු.100,000.00 වන අනිවාර්ය අතිරක්තයක් පනවා ඇති හෙයින් රක්ෂිත ප්‍රතිලාභ හිමි නොවීමට බලපා තිබුණි.

ඩී ඒ එම් මුණසිංහ
අධ්‍යක්ෂිකා (මානව සම්පත්)

5. තාවකාලික කැඳවුම් තැන්පතු

මධ්‍යස්ථානයේ සේවකයන් විසින් එළෙඹෙන ලද බැදුම්කර, නිශ්චිත බැදුම්කර කාලය ඉක්මයාමට පෙර ආයතනයෙන් ඉවත්ව ඇති විටකදී අයකර ගන්නා ලද මුදල්ය. ඒවා ලංකා බැංකුවෙහි State Institutions Temporary Surplus Trust Funds හි තැන්පත් කර ඇත. රු.8,994,089.90 ක්ව තිබූ අගය ලාභාංශ හා පොලී ආගණනය හා රු.1,500,000.00 වන, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 1/2017 චක්‍ර ලේඛණය මත වූ 2017/07/31 මුදල් ඉවත් කර ගැනීමද සලකා රු.11,792,691.52 අගයක් 2017/12/31 දිනට ඇත.

ගණුදෙනුකරුවන්ගෙන් ලබන වැඩ අත්තිකාරම් අදාල වැඩ වලට උපයෝගී කර ගන්නා තෙක් කැඳවුම් තැන්පතු ලෙස බැංකුවේ තැන්පත් කරනු ඇත.ඉන් ලැබෙන පොලිය අමතර ආදායම් ලෙස දක්වා ඇත.

6. කෙරීගෙන යන වැඩ

2016 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ වල අගය අනෙකුත් ජංගම වත්කම් යටතේ පෙන්වා ඇතත් සලකා බලන වර්ෂයේදී එය තොග යටතේ පෙන්වා ඇත.

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සටහන් (අගය - රුපියල්)

විග්‍රහය	2017	2016
මෙහෙයුම් මත ක්‍රියාකාරකම් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
ලැබීම්	61,955,983.77	62,117,386.02
ප්‍රවර්තන හා පර්යේෂණ ලැබීම්	259,040,000.00	231,025,150.00
පොලිය ලැබීම්	7,855,255.50	5,571,196.02
අනෙකුත් ලැබීම්	1,893,816.75	3,177,530.02
ගෙවීම්		
සේවක පිරිවැය	(216,162,656.43)	(191,785,507.08)
විශ්‍රාම වැටුප්	7,853,764.92	(6,399,166.50)
සැපයුම්	(60,912,933.40))	(81,987,676.93)
අනෙකුත් ගෙවීම්	(63,524,759.22)	(25,617,603.56)
බදු	(611,302.06)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය	(53,678,657.93)	(3,898,672.01)
ආයෝජන මගින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
වත්කම් මිළට ගැනීම්	(30,995,305.45)	(37,622,266.37)
උපකරණ විකුණුම්	1,072,420.43	
ආයෝජන මගින් ඉපැයූ ශුද්ධ මුල්‍ය ප්‍රවාහය	(29,922,885.02)	(37,622,266.37)
මූල්‍ය කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන ලැබීම්	73,567,540.88	31,114,964.00
මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	73,567,540.88	31,114,964.00
මුදල් හා සමාන වත්කම් වල (වැඩිවීම/අඩුවීම)	41,031,870.69	(10,405,974.38)
කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා සමාන දෑ	95,484,593.69	105,890,568.07
කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	136,516,464.38	95,484,593.69

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සටහන

2. මුදල් නොවන ගණුදෙනු (අගය - රුපියල්)

	2017	2016
භාණ්ඩාගාරයෙන් වාහන ලැබීම	-	-
	-	-

3. මුදල් හා සමාන වත්කම්

	2017.12.31 දිනට	2016.12.31 දිනට
ජංගම ගිණුම් අංක 404949 ලංකා බැංකුව ජාඇල ශාඛාව	10,507,686.29	2,173,287.47
ජංගම ගිණුම් අංක 405005 ලංකා බැංකුව ජාඇල ශාඛාව	21,189.09	106,284.36
ජංගම ගිණුම් අංක 404956 ලංකා බැංකුව ජාඇල ශාඛාව	1,214,636.27	429,001.16
ජංගම ගිණුම් අංක 1667 ලංකා බැංකුව, ආයතන ශාඛාව	5,331,410.73	1,222,056.52
අතැති මුදල්	9,358.41	91,473.87
තාවකාලික කැඳවුම් තැන්පතු - ජාඇල ශාඛාව	53,000,000.00	39,800,000.00
තාවකාලික කැඳවුම් තැන්පතු - ආයතන ශාඛාව	55,000,000.00	39,500,000.00
රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල	11,432,183.69	12,162,490.31
	136,516,464.38	95,484,593.69

14. 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීර්සී/බී/එන්ඊආර්ඩීසී/1/17/49   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2018 නොවැම්බර් 09 දින

සභාපති,

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වගන්තියේ හා 1 උප වගන්තිය අනුව සහ 1974 අගෝස්තු 14 දිනැති හා 124/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ජපන් රජයෙන් පරිත්‍යාගයක් ලෙස පෞද්ගලික ආයතනයකට ලද පානීය ජලය පිරිසිදු කිරීම සඳහා වන උපකරණ හයක් වරායෙන් නිදහස් කිරීමේ ගාස්තුව වූ රු. 359,248 ක් අමාත්‍යාංශයේ උපදෙස් මත මධ්‍යස්ථානය විසින් දරා තිබුණු අතර එය ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට පර්යේෂණ ප්‍රචලිත කිරීමේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානය විසින් නිමකර භාරදී තිබූ වාණිජ ව්‍යාපෘති 04 ක දෝෂ ආවරණ කාලය 2018 ජූලි විගණන දින වනවිට අවසන් වී තිබුණද, රු.482,122 ක් වූ රඳවාගත් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් නිමකර තිබූ ව්‍යාපෘති 04 කට අදාලව මාස 24 සිට මාස 18 ක කාලයක සිට පැවත එන ලැබිය යුතු රු.970,622 ක මුදලක් 2018 ඔක්තෝබර් වනවිටත් අයකරගෙන නොතිබුණි.

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,129,045 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,182,265 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.946,780 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු. 28,014,850 කින් හා විලම්භිත ආදායම රු. 3,985,412 කින් වැඩි වුවද, පරිපාලන වියදම් රු. 19,539,409 කින් වැඩිවීම, වෙනත් වියදම් රු. 6,338,438 කින් වැඩිවීම, ක්ෂය වීම් රු. 2,875,302 කින් වැඩිවීම හා වෙනත් ආදායම් රු. 4,241,487 කින් අඩුවීම මෙම ඌනතාවය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013 වර්ෂයේදී රු. 28,114,860 ක් වූ ඌනතාවය 2015 වර්ෂය වන විට 2,238,655 ක් දක්වා අඩුවී තිබුණ ද, 2017 වර්ෂයේ දී එය රු. 5,129,045 ක් දක්වා වර්ධනය වී තිබුණි. එසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමේදී 2013 වර්ෂයේ දී රු. 191,433,742 ක් වූ මධ්‍යස්ථානයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේ දී රු. 272,949,075 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වියදම් පිරිමැසුම්දායක ගොඩනැඟිලි තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 04 ක් හා පුහුණු වැඩසටහන් 3 ක් පවත්වා තිබුණු අතර ඊට 253 දෙනෙකු සහභාගී වී තිබුණි. 14 දෙනෙකු සඳහා මෙම තාක්ෂණය පැවරීමට අපේක්ෂා කලද, අදාල තාක්ෂණය ලබා ගැනීම පිළිබඳ අවධානය යොමුකර තිබුනේ පුද්ගලයින් 3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

දෙනෙකු පමණි. මේ අනුව පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් අපේක්ෂිත අරමුණු ඉටුකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී මධ්‍යස්ථානය හඳුන්වා දුන් තාක්ෂණයන් 21 කින් බලපත්‍ර 55 ක් ලබා දීමට ඉලක්ක කර තිබුණ ද ලබා දීමට හැකි වී තිබුණේ තාක්ෂණයන් 9 කින් බලපත්‍ර 23 ක් පමණි. එම තාක්ෂණයන්ගෙන් තාක්ෂණයන් 8 ක්ම 2008-2012 කාලයන්හි දී මධ්‍යස්ථානය විසින් හඳුන්වා දෙන ලද තාක්ෂණයන් වූ අතර 2013-2017 කාල පරිච්ඡේදයේදී හඳුන්වා දී තිබූ තාක්ෂණයන් ප්‍රචලිත වී නොතිබුණි.

(ඇ) 2013-2017 කාලයට අදාලව මධ්‍යස්ථානය විසින් තාක්ෂණ හා තාක්ෂණ උපකරණ 20 ක් හඳුන්වා දී තිබුණු අතර ඒ සඳහා රු. 14,992,213 ක පිරිවැයක් දරා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට තාක්ෂණ පැවරීම් (Technology Transfers) සිදු කිරීමට හැකි වී තිබුණේ පිරිවැය රු. 312,102 ක් වූ තාක්ෂණයන් 2ක් සඳහා පමණි. හඳුන්වා දී තිබූ අනෙකුත් තාක්ෂණයන් 18 න් කිසිවක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සමාජගත වී නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල බලපත්‍ර 100ක් අළුත් කිරීමට ඉලක්ක කර තිබුණ ද, අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 46 කි. හඳුන්වාදීමට බලාපොරොත්තු වූ තාක්ෂණයන් පිළිබඳව ව්‍යවසායකයින්ගේ උනන්දුවක් නොමැති බැවින් ඉලක්කගත මට්ටමට නව බලපත්‍ර නිකුත් කිරීම හා අළුත් කිරීම සිදු කළ නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. මධ්‍යස්ථානයේ තාක්ෂණයන් පිළිබඳව මහජනයා අතර විශ්වාසය තහවුරු කිරීමත්, හඳුන්වා දුන් තාක්ෂණයන්හි යල් පැනීම් සිදුවීම වැලැක්වීමේ පියවර ගැනීමත්, ප්‍රචාරණ කටයුතු පුළුල් කිරීමත් පිළිබඳ මධ්‍යස්ථානය අවධානය යොමු කර නොතිබුණි.

(ඉ). 2013-2017 කාලපරිච්ඡේදයේදී මධ්‍යස්ථානය විසින් තාක්ෂණයන් 20 ක් හඳුන්වා දී තිබුණද පේටන්ට් බලපත්‍ර සඳහා ඉල්ලුම්කර තිබුණේ තාක්ෂණයන් හතරක් සඳහා පමණක් බව නිරීක්ෂණය විය.

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබන ව්‍යාපෘති බොහෝ අවස්ථාවලදී අපේක්ෂිත කාලය තුලදී අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය. නියැදි විගණන පරීක්ෂාව අනුව 2014-2016 කාල පරිච්ඡේදයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘති 20 ක් මාස 2 සිට මාස 24 දක්වා කාලයකින් නිම කිරීමට සැලසුම් කර තිබුණද අදාල කාල සීමාව තුළ නිම කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මාස 6 සිට මාස 31 දක්වා කාලයන්ගෙන් දින දීර්ඝ කිරීම් සිදු කර තිබුණි. සැලසුම් කිරීමේ අඩුපාඩු පැවතීම, බාහිර පාර්ශවයන් සමඟ විධිමත් පරිදි ගිවිසුම්වලට නොඑළඹීම හා ව්‍යාපෘති කර ගෙන යෑමේදී දෙපාර්ශවය අතර සිදු වන නොඑකඟතාවයන් හේතුවෙන් ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද වී තිබුණි.

(ඇ) අත් යන්ත්‍ර කර්මාන්තය සඳහා අවශ්‍ය රෙදිපිළි පරීක්ෂා කිරීමේ යන්ත්‍රයක් නිපදවීමේ ව්‍යාපෘතියක් 2015 දෙසැම්බර් 8 දින ආරම්භ කර තිබුණු අතර එහි පළමු අදියර ලෙස රු.840,950 ක් වටිනා යන්ත්‍රයක් නිපදවා 2016 දෙසැම්බර් 23 දින කර්මාන්ත දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. යන්ත්‍රයේ වරින් වර ඇති වූ ගැටළු පිළිබඳව 2018 ජූලි විගණිත දිනය වන විට අවස්ථා 6 ක දී කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් මධ්‍යස්ථානයට වාර්තා කර තිබුණු නමුත් යන්ත්‍රය ක්‍රියාත්මක කළ හැකි තත්ත්වයට පත් කර නොතිබුණි. ගිවිසුම ප්‍රකාරව II අදියරේදී මෙම යන්ත්‍රය සඳහා වැඩි දියුණු කිරීම් සිදු කිරීමට අපේක්ෂා කලද එය ඉටු කරගත නොහැකි වී තිබුණි.

(ඈ) කුරුණෑගල මහ නගර සභාව සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.5,690,000 ක් වූ උසස් තාක්ෂණයන් සහිත නව ආදාහනාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් 2016 පෙබරවාරි 05 දින ආරම්භ කර 2018 මාර්තු 30 දින වන විට අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණු අතර ව්‍යාපෘති කාලය 2018 සැප්තැම්බර් 30 දක්වා දිනු දීර්ඝ කොට තිබුණි. එදිනට රු. 4,766,748 ක් මේ සඳහා වැය කර තිබුණ ද ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

(ඉ). ගාල්ල වග්ගල් මෝදර හා බෙන්තර වී පර්යේෂණ ආයතනයේ ඇල ඔස්සේ ලවන ජලය ගොඩබිමට ඒම පාලනය කිරීම සඳහා මධ්‍යස්ථානය කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ එක්ව 2014 වර්ෂයේදී ව්‍යාපෘති දෙකක් ආරම්භ කර තිබුණු අතර 2014 දෙසැම්බර් වන විට අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණි. 2018 ජූලි විගණන දින වන විට ව්‍යාපෘති දෙක වෙනුවෙන් රු. 218,108 ක් වැය කර තිබුණු නමුත් එම ව්‍යාපෘති අවසන් කර නොතිබුණි. දෙපාර්ශවය අතර නොඑකඟතාවයන් පැවතීමත්, විධිමත් ගිවිසුම්වලට නොඑළඹීමත් හේතුවෙන් ව්‍යාපෘති කටයුතු ප්‍රමාද වී තිබුණි.

7

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

4.3 හඳුනාගන්නා ලද පාඩු

2015 - 2017 කාලයේදී නිමකරන ලද වාණිජ ව්‍යාපෘති 10 කින් ආදායමට වැඩි වියදමක් දැරීමට සිදු වීම හේතුවෙන් රු. 2,771,188 ක අලාභයක් සිදු වී තිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් තම විෂය පථය යටතේ වන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී තිබුණි.

(ආ) ඉහත පරිදි දැනුවත් වී තිබුණද තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද, හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම, ඉලක්කයන්හි ළඟා වීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන, පුහුණු සේවකයන් හෝ භෞතික පහසුකම්වල අවශ්‍යතාවයන් හඳුනා ගෙන නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2:1 (ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි එක් එක් අදියර සඳහා කාලයන් නිරූපණය වන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් අඩු වියදම් ඉදිකිරීම් තාක්ෂණයන් හඳුන්වා දී තිබියදී කාර්යාලයේ ඉදිරිපස පරිශ්‍රය නවීකරණය කිරීමේ (Rehabilitation of Front Office Building) කොන්ත්‍රාත්තුව රු. 7,868,607 කොන්ත්‍රාත් වටිනාකමකට බාහිර කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණි.

8

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මධ්‍යස්ථානයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු විය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍රය	නිරීක්ෂණ
(අ) සේවක මණ්ඩල කළමනාකරණය	කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමේදී ප්‍රමාදයන් පැවතීම
(ආ) ප්‍රසම්පාදන කළමනාකරණය	(i) භාණ්ඩ මධ්‍යස්ථානයට ලැබුණු පසු කාර්යසාධන ඇපකර ලබා ගැනීම
	(ii) ගෙවීම් අනුමත කිරීමට පෙර භාණ්ඩ නිසි පරිදි ක්‍රියාත්මක වන බවට නිර්දේශයක් ලබා නොගැනීම
	(iii) තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා දින රහිතව ලබා දී තිබීම
	(iv) ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුලත් නොවූ භාණ්ඩ මිලදී ගත් අවස්ථා පැවතීම
	(v) ඇස්තමේන්තුගත පිරිවැය හා තත්‍ය පිරිවැය අතර විශාල විචලනයන් පැවතීම
	(vi) භාණ්ඩ ඇණවුම් කළ පසු භාණ්ඩ සැපයීම සඳහා දීර්ඝ කාලයක් ගතවූ අවස්ථා පැවතීම
	(vii) ලංසු විවෘත කිරීමේ දී, ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තාවල සියලුම සාමාජිකයන් අත්සන් යොදා නොතිබූ අවස්ථා පැවතීම
(ඇ) බඳවා ගැනීම් හා උසස් කිරීම්	(i) පුරප්පාඩු පිරවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලැබී තිබුණද බඳවා ගැනීමට කටයුතු නොකිරීම
	(ii) සම්මුඛ පරීක්ෂණ ලේඛනවල සියලුම නිලධාරීන් අත්සන් යොදා නොමැති අවස්ථා පැවතීම

9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) ව්‍යාපෘති කළමනාකරණය	(i)	ව්‍යාපෘති කාලය දීර්ඝ කරන අවස්ථාවන්හිදී ඒ සඳහා හේතු දක්වා නොමැති අවස්ථා පැවතීම
	(ii)	ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථමව විධිමත් ගිවිසුම්වලට එළඹ නොමැති අවස්ථා පැවතීම

එච්. එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

15. 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පැහැදිළි කිරීම්

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමු.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

අප විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ උපදෙස් පරිදි පානීය ජලය පිරිසිදු කිරීම සඳහා වූ උපකරණ නිදහස් කර ගැනීම සඳහා කල ගෙවීම් සහ ලැබීම් මධ්‍යස්ථානයේ තාක්ෂණයන් ප්‍රවලිත කිරීමේ වියදම් වලින් දරණු ලැබිය. මෙම මුදල ලබා ගැනීම පිළිබදව අමාත්‍යාංශය වෙත ලිඛිත දැනුම් දීමක් සිදුකර ඇත. මෙම මුදල් ලැබුණු පසු එය ප්‍රවලිත වියදම් ශීර්ෂයට ආදායමක් ලෙස සැලකීමට නියමිතය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) මෙහි දක්වා ඇති රඳවාගත් මුදල් සම්බන්ධ ව්‍යාපෘතීන් වනුයේ පහත සඳහන් ව්‍යාපෘතීන්ය.

(i) දිඹුලාගල ආදාහනාගාරය ඉදිකිරීම	රු. 128,176.92
(ii) ඇලහැර ආදාහනාගාරය ඉදිකිරීම	රු. 128,176.92
(iii) දෙහිවල සත්වෝද්‍යානයේ දාහකගාරය ඉදිකිරීම	රු. 141,167.01
(iv).විල්ගොඩ ඇලමාර්ගය සඳහා අසව් දොරටුවක් සවි කිරීම	රු. 84,601.00
	රු. 482,121.85

ඉහත ව්‍යාපෘතීන් සියල්ලම නිසි පරිදි සම්පූර්ණ කොට අදාල ආයතනයන් වෙත විධිමත්ව බාරදී තිබේ. ඒවායේ රඳවාගත් ඉතිරි මුදල් ලබාගැනීම සඳහා වාචිකව හා ලිඛිතව ඉල්ලීම් අඛන්ඩව සිදුකර තිබේ. එසේම තවදුරටත් ඒ සම්බන්ධයෙන් උත්සාහ දරණ බැව් දන්වනු කැමැත්තෙනි.

(ආ) මෙහි දක්වා ඇති ව්‍යාපෘතීන් 04 සඳහා පැහැදිළි කිරීම් පහත දැක්වේ.

කුරුණෑගල ශික්ෂණ රෝහල සඳහා ජීව වායු පද්ධතියන් ඉදි කිරීම

කුරුණෑගල ශික්ෂණ රෝහලේ ජීවවායු ජනක පද්ධතියක් ඉදිකිරීම සඳහා වූ මෙම ව්‍යාපෘතිය එවකට එම රෝහලේ අධ්‍යක්ෂ වරයෙකුගේ ඉල්ලීමක් මත ආයතනය විසින් භාරගන්නා ලදී. එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමේදී අප ආයතනය විසින් සැලසුම් කොට තෝරා ගන්නා ස්ථාන 3ක් රෝහල් පාලනාධිකාරිය මගින් විටින් විට වෙනත් ස්ථානවලට ගෙන යන ලදී. පසුව එම ස්ථානයේ ඉදිකිරීම් කටයුතු සියල්ල සම්පූර්ණ කොට ක්‍රියාකාරිත්වයෙන් යුතු ජීව වායු ජනක පද්ධතිය කුරුණෑගල ශික්ෂණ රෝහල වෙත 2016.05.30 දින භාරදෙන ලදී. මෙම ජීවවායු ජනක පද්ධතිය ක්‍රියාකාරී තත්වයේ පවත්වා ගැනීම සඳහා එයට අවශ්‍ය ජීරක ද්‍රව්‍ය (මුළුතැන්ගෙයින් ඉවත ලද එළවළු, අපද්‍රව්‍ය හා ඉඳුල්) ජීරකවලට දැමීමට ගෙනයාමට සිදුවූයේ රෝහලේ වාට්ටු අසලින්මය. (මෙම සිදුවීමට හේතුවූයේ මුලින් සැලසුම් කරන ලද ස්ථාන වෙනස් කිරීමයි). නමුත් එම අපද්‍රව්‍ය තරමක දුර්ගන්ධයක් සමග වාට්ටු තුළට එන බවට රෝගීන්ගෙන් හා වෛද්‍යවරුන් ඇතුළු කාර්යමණ්ඩලයෙන් පැමිණිල්ලක් ලැබී තිබුණි. ඒ අතර තුරදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ රෝහල් අධ්‍යක්ෂවරයාට මාරුවීමක් ලැබී අලුත් අධ්‍යක්ෂවරයෙකු සේවය සඳහා පැමිණ ඇත. නව අධ්‍යක්ෂවරයාට ලැබුණු පැමිණිල්ල අනුව ජීරක පද්ධතිය ක්‍රියාකාරී තත්වයේ තබාගැනීම අත්හිටුවීමට තීරණයක් ගෙන තිබුණි. මේ තත්වය තුළ අප ආයතනයෙන් කරන ලද නිරීක්ෂණ වලට අනුව ජීරක ද්‍රව්‍ය ඇතුළු කරන ස්ථාන (inlets) සියල්ල සිමෙන්ති බදාම යොදා මුද්‍රා තබා තිබූ අයුරු නිරීක්ෂණය කොට ඇත. ඒ අනුව එම පද්ධතිය ක්‍රියාකාරිත්වයෙන් නොමැතිව තිබේ. අප විසින් ක්‍රියාකාරී තත්වයෙන් ලබාදුන් ජීරක පද්ධතිය අක්‍රීය තත්වයට පත්වීම හේතුවෙන් අප කිහිපවතාවක් කරන ලද ලිඛිත හා වාචික ඉල්ලීම් නොසලකා හරිමින් මෙම ඉතිරි මුදල ගෙවීම ඔවුන් විසින් මගහරිමින් සිටී. මේ සම්බන්ධව තවදුරටත් කටයුතු කරමින් පවතී.

<u>**බස්නාහිර පළාත් කර්මාන්ත සේවා අධිකාරිය වෙත රෙදි පරික්ෂා කිරීමට යන්ත්‍රයක් නිපදවා ලබා දීම**</u>
මෙම රෙදි පරික්ෂා කිරීමේ යන්ත්‍රයක් නවීන තාක්ෂණය යොදාගෙන නිපදවා සැපයීම සඳහා අප වෙත භාරදෙන ලදී. ඒ අනුව එයට පර්යේෂණ හා සංවර්ධන කටයුතු ඇතුලත්ව තිබුණි. එම කටයුතු සියල්ල සම්පූර්ණ කොට බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී. නමුත් එම යන්ත්‍රය අදාල කටයුතු සඳහා භාවිතා කිරීමේදි විටින් විට ඇතිවූ දෝෂ අප විසින් නිවැරදි කරන ලදී. තවදුරටත් එම යන්ත්‍රය දෝෂ රහිත විධිමත් යන්ත්‍රයක් ලෙස වැඩි දියුණු කොට භාර දීමට මේ වන විට කටයුතු කර ඇත. ඒ සම්බන්ධයෙන් කර්මාන්ත දෙපාර්තමේන්තු අධීක්ෂණ නිලධාරීන් සහ යන්ත්‍ර ක්‍රියාකාරුවන් ද සමග පැමිණ අධීක්ෂණ කටයුතු ද සිදු කරන ලදී. ඔවුන් ඒ පිළිබඳව සතුටුදායක ප්‍රතිචාර දක්වා ඇත. ඒ අනුව රඳවාගත් මුදල වන 47,971 ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.

<u>**මීගමුව නගර සභාවේ අදාහනාගාරය අළුත්වැඩියා කිරීම**</u>
මෙම ව්‍යාපෘතිය සඳහා රුදවුම් මුදල් හැර ඉතිරි සියළුම මුදල් ගෙවා ඇත. රඳවාගත් මුදල් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.

<u>**පුල්මුඩේ ඛනිජ වැලි නීතිගත සංස්ථාවේ ඛනිජ වැලි වෙන්කිරීමේ යන්ත්‍ර පද්ධතියේ අලුත්වැඩියා කටයුතු කිරීම**</u>

මෙම අලුත්වැඩියා කටයුතු සියල්ල සිදුකරන අතර තුරදී ඛනිජ වැලි නීතිගත සංස්ථාවේ කර්මාන්ත ශාලා නිලධාරීන්ගේද නිරීක්ෂණයට භාජනය විය. එම අවස්ථාවේ ඔවුන්ගේ නිරීක්ෂණ වලට අනුව කරන ලද වැඩකටයුතු වලින් 85% ක වැඩ සම්බන්ධයෙන් සතුටුදායක ප්‍රතිචාර ලැබුණි. ඉතිරි වැඩ කටයුතු නිමකිරීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස්කර තිබියදී ඔවුන්ගේ ලිඛිත ඉල්ලීම වූයේ කරන ලද වැඩ ප්‍රමාණයට පමණක් ගෙවීම් කටයුතු සිදුකල හැකි බවත් නැවත යන්ත්‍රය ඔවුනට ගෙනයාමට අවසර දෙන ලෙසත්ය. ඒ අනුව අප ආයතනයට ඉතිරි 35%ක මුදල වූ රු.275,543/-ක මුදල ගෙවීම සඳහා ඉල්ලුම් කොට ඇත.

3. <u>මූල්‍ය සමාලෝචනය</u>

3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>
මෙහි සඳහන් මූල්‍ය ප්‍රඊපල සමඟ එකඟ වේ.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>කාර්යසාධනය</u>

4.1.1 <u>ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය</u>

(අ) වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීමේ අරමුණ, එම තාක්ෂණය භාවිතා කිරීම සම්බන්ධව එම ක්ෂේත්‍රයේ නියුතු වෘත්තිකයින් හා ශ්‍රමිකයින් හට දැනුවත් කිරීමත් එමගින් මෙම තාක්ෂණය රට තුළ ප්‍රචලිත කිරීමත්ය. මෙමගින්, මෙම තාක්ෂණය පැවරීමටද යම් රුකුලක් ලැබේ. මේ අනුව දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් අපේක්ෂිත අරමුණු ඉටු නොවුවායැයි නිගමනය කළ නොහැක

(ආ) තාක්ෂණ පැවරීමට බලාපොරොත්තු වූ තාක්ෂණ 21න් තාක්ෂණ 7ක් සඳහා සාර්ථකව ක්ෂේත්‍ර පරික්ෂණ නිමකිරීමට නොහැකි වූ බැවින් ද, තාක්ෂණ 2ක් සාර්ථකව නිම කිරීමට නොහැකි වූ බැවින් ද, එම තාක්ෂණයන් 9ය සඳහා පැවරුම් කටයුතු සිදුකිරිමට නොහැකි විය. අනෙකුත් තාක්ෂණයන් සඳහා තාක්ෂණ පැවරීමට යම් යම් උත්සාහයන් ගත්තත්, තාක්ෂණ ලාභීන් ඉදිරිපත් නොවීය.

(ඇ) 2013-2012 කාලය තුලදී හඳුන්වා දී ඇති තාක්ෂණයන් 20 න් 2018 දෙසැම්බර් වන විට තාක්ෂණයන් 2 ක් ව්‍යවසායකයින්ට පවරා ඇත. තාක්ෂණයන් 4 ක් සඳහා අදාල උපකරණ කිහිපයක් නිෂ්පාදනය කොට විකිණීම මගින් සමාජගත කර ඇත. තවත් තාක්ෂණයන් 5 ක් ක්ෂේත්‍ර පරික්ෂණ කරමින් පවතී. මේ අනුව මෙම තාක්ෂණයන් පැවරීමට සහ සමාජගත කිරීමට කටයුතු ඉදිරියේදී කරණු ලැබේ.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ බලපත්‍ර 100 ක් අළුත් කිරීමට ඉලක්ක කර තිබුණද, බලපත්‍ර අළුත්කිරීම ක්‍රමයෙන් අඩුවී ඇත.

තාක්ෂණ බලපත්‍ර අළුත් කිරිම සඳහා බලපත්‍රලාභීන්ගෙන් ලැබුණු ප්‍රතිචාරය අඩු මට්ටමක පැවතිණ. පේටන්ට් බලපත්‍ර ලබා ගත් තාක්ෂණයන් සඳහා බලපත්‍ර ලබාගත්තද ලබාගත් සමහර තාක්ෂණයන් දැනටමත් වලංගු කාලය ඉක්මවා ඇති බැවින් එම තාක්ෂණයන්ට අදාල බලපත්‍ර අළුත් කිරීමට කටයුතු කරීමට උනන්දු වී නොමැත.

එමෙන්ම සමහර තාක්ෂණයන් තාක්ෂණ ලාභීන් විසින් හුදෙක් ඒ අවස්ථාවේ ඇති වූ උනන්දුව නිසා ලබාගත්තද පසුව එම තාක්ෂණය ඉදිරියට ගෙන යාම සඳහා උනන්දුවක් දක්වා නොමැත.

මේ සම්බන්ධව නව තාක්ෂණයන් හඳුන්වා දෙමින් ව්‍යවසායකයින් දිරි ගැන්වීම උදෙසා පියවර ගෙන ඇත. යල් පැන ගිය තාක්ෂණයන්ගෙන් බැහැරව නව තාක්ෂණික ක්‍රමවේදයන් යොදා ගැනීම තුලින් මහජනයාගේ විශ්වාසය තහවුරු කිරීමටත්, ප්‍රචාරණ කටයුතු පෙරට වඩා පුළුල් කිරීමටත් අපගේ දැඩි අවධානය යොමු වී ඇත. මෙම තත්ත්වය යටතේ ඉදිරියේදී බලපත්‍ර අළුත්කිරීම වැඩි කර ගත හැකි බව දන්වා සිටිමි.

(ඉ) පේටන් බලපත්‍ර ලබාගැනීම සෑම තාක්ෂණයකටම කළ නොහැක. මේ අනුව පේටන් බලපත්‍ර ලබාගැනීමට දැනට තාක්ෂණයන් හතරක් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරණ ලදී. තවත් තාක්ෂණයන් සඳහා ඉල්ලුම් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

(ඊ) දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය විසින් හඳුනාගත් ගැටළුවක් වන " වැව්වල ජලජ පැලෑටි ඉවත්කිරීම" සඳහා යන්ත්‍රයක් සෑදීමේ අවශ්‍යතාවය අප සමග සාකච්ඡා කරන ලදී. මෙහිදි අප විසින් මේ වන විට පර්යේෂණ මට්ටමේ පවතින ඇලවල්වල ජලජ ශාක ඉවත් කිරීමේ යන්ත්‍රයක් සාදා නිපදවා අවසන් වූ විට යොදා ගැනීමට ඇති හැකියාවද සාකච්ඡා කරන ලද අතර, එයට වඩා සරල යාන්ත්‍රණයක් ඔවුන් විසින් යෝජනා කරන ලදී. මෙම යාන්ත්‍රණය සාර්ථකව ක්‍රියාකරන බව අපගේ ඉංජිනේරුවන්ගේ ද අදහස වූ බැවින් ඒ අනුව පර්යේෂණ කොට යන්ත්‍රයක් නිපදවා දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය සමග ක්ෂේත්‍ර පර්යේෂණ සිදු කිරීමට මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර, මෙය මාස තුනකින් නිමකිරීමට සැලසුම් කරන ලදී. මෙම යන්ත්‍රය කෙටි කාලයකදී සාදා නිමකර ක්ෂේත්‍ර පරික්ෂාව සිදුකල අතර, එහිදි හඳුනාගන්නා ලද අඩුපාඩු නිවැරදිකර ක්ෂේත්‍ර පරික්ෂා කිහිපයක් සිදුකරන ලදී. මෙම යන්ත්‍රය බලාපොරොත්තු වූ ආකාරයට සාර්ථකව ක්‍රියානොකල බැවින් මේ සඳහා දීර්ඝ කාලයක් ගත විය. අවසානයේ අපහට නිගමනය කළහැකි වූයේ මෙම සරල යාන්ත්‍රණය මේ සඳහා යෝග්‍ය නොවන බවයි. පර්යේෂණ ව්‍යාපෘති වලදී අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම සාමාන්‍ය දෙයකි.

ඉහත දක්වා ඇති කරුණු නිසා මේ වන විට මෙම ව්‍යාපෘතිය නතරකර ඇත. අප මේ වන විට ක්‍රියාත්මක ඇලවල්වල ජලජ ශාක ඉවත්කිරීමේ යන්ත්රය සාදා නිමවී ක්ෂේත්‍ර පරික්ෂා වලින් පසුව සාර්ථක වූ විට, එම යාන්ත්‍රණය වැව්වල ජලජ පලෑටි ඉවත්කිරීමේ යන්ත්‍රයට ද යොදා ගත හැකිය. එමනිසා ඉහත ව්‍යාපෘතිය අවසන් වූ පසු එම යාන්ත්‍රනය යොදා වැව්වල ජලජ පැලෑටි ඉවත්කිරීමට යන්ත්‍රයක් අත්හදා බැලීමට අදහස් කර ඇත.

(උ) මෙම යන්ත්‍රය නිපදනු ලබන්නේ පර්යේෂණ කටයුතුද ඇතුලත්වය. මෙම ක්‍රියාවලියේදී බලාපොරොත්තු නොවූ තාක්ෂණික ගැටළු මතු වූ අතර මේ වන විට ඒවා නිවරදි කර ගනිමින් සිටී. යන්ත්‍රයේ සියලුම ප්‍රධාන කොටස් නිමවා ඇත. යන්ත්‍රයේ යථා ක්‍රියාකාරිත්වය තහවුරු කර ගැනීමෙන් පසු එය භාර දී ඉතිරි මුදල් ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

(ඌ) මෙම ව්‍යාපෘතිය COSTI ආයතනය විසින් සම්බන්ධීකරණය කරන ලද අතර මෙහි පාර්ශවකරුවන් වනුයේ;

1. ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2. කාර්මික තාක්ෂණ ආයතනය
3. විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන

මෙම යන්ත්‍රයේ සැලැස්ම හා නිර්මාණය (Design) කොරියානු පාර්ශව කරුවන් විසින් සිදු කළ අතර, අපගේ කාර්ය භාරය වූයේ ප්‍රථමයෙන්ම ඔවුන්ගේ සැලසුමට අනුව එම පිරිවිතරයන් කිසිත් වෙනස් නොකර එම යන්ත්‍රය නිපදවා එය පරික්ෂා කොට වැඩි දියුණු කිරීම් හඳුනාගැනීමයි. මේ සඳහා අප හට 1,745,425/- මුදලක් කොරියානු පාර්ශවය විසින් ලබා දෙන ලදී. ඒ අනුව අප විසින් කොරියන් ආකෘතියට හැම අතින්ම සමාන වන පරිදි ආදර්ශ යන්ත්‍රයක් නිපදවන ලදී. එය පරික්ෂා කිරීමේදී එය

නිසි ලෙස ක්‍රියා නොකරණ බව හඳුනා ගන්නා ලදී. ඒ අනුව එහි අවශ්‍ය වැඩි දියුණු කිරීම් හඳුනා ගන්නා ලදී. මේ සඳහා අප හට වැය වූ සෘජු වියදම රු. 493,823.74 ක් පමණි. මේ වන විට යන්ත්‍රයට අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කරමින් පවතී.

4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

(අ) මෙම ව්‍යාපෘති දෙක වනුයේ වියදම් පිරිමැසුම්දායක ලෙස වහලය සඳහා දැව රාමුවක් ඉදිකිරීම හා පෙරනිම් කොන්ක්‍රීට් තාක්ෂණය භාවිතාකර තරප්පු පෙළක් නිර්මාණය කිරීමයි. මෙම ව්‍යාපෘති දෙකම පහත පරිදි සාර්ථකව අවසන්කර ඇත.

වියදම් පිරිමැසුම්දායක ලෙස වහලය සඳහා දැව රාමුවක් ඉදිකිරීම
මෙම ව්‍යාපෘතිය තුළින් ලබාගත් පර්යේෂණ ප්‍රථිපල අඩි 10 ට වඩා අඩු පරාසයන් සහිත උළු වහල රාමුව ඉදිකිරීම සඳහා සුදුසු බව තහවුරු වී ඇත. තවද මෙම ප්‍රථිපල ව්‍යුහාත්මක ඉංජිනේරු ආයතනය මගින් සංවිධානය කළ වැඩමුළුව සඳහා ඉදිරිපත් කරණ ලදී.

පෙරනිම් කොන්ක්‍රීට් තාක්ෂණය භාවිතාකර තරප්පු පෙළක් නිර්මාණය කිරීම
නිවාස ඉදිකිරීම සඳහා පෙරනිම් කොන්ක්‍රීට් භාවිතා කර වියදම් අඩු තරප්පු පෙලක් ඉදිකිරීමට අවශ්‍ය තාක්ෂණය හඳුන්වාදීමට මෙම ව්‍යාපෘතිය ආරම්භ කරණ ලදි.

මෙම පර්යේෂණ ව්‍යාපෘතිය තුළින් තරප්පු පෙළ හඳුන්වා දුන් අතර, ප්‍රායෝගිකව යොදා පරීක්ෂා කරණ අවස්ථාවේ සියුම් පිපිරීම් දක්නට ලැබිණ (සියුම් ඉරි) එම පිපිරීම් වැලැක්වීමට අවශ්‍ය කරණ ප්‍රතිකර්ම සඳහා වැඩි මුදලක් අවශ්‍ය වූ අතර, එම මුදල දැනට අප බලාපොරොත්තු වූ සීමාව ඉක්ව වූ බැවින් ව්‍යාපෘතිය තවදුරටත් කරගෙන යාම නුසුදුසු බව තීරණය කරණ ලදී.

(ආ) **පර්යේෂණ ව්‍යාපෘති සඳහා කාලය දීර්ඝ කිරීමට බලපාන හේතු පහත පරිදි වේ.**

i. අළුතෙන් බඳවා ගන්න ඉංජිනේරුවන් පර්යේෂන වටපිටාවට හුරුවීම සඳහා වසර දෙකක්වත් ඔවුන් එකදිගට පර්යේෂණ ව්‍යාපෘතිවලට සම්බන්ධව කටයුතු කල යුතු වුවද ඉංජිනේරුවන් ආයතනයට සම්බන්ධවී වැඩි පිරිසක් කෙටි කාලයකින් නර්ඩ් ආයතනයෙන් ඉවත්වේ. මේ නිසා පර්යේෂණ කටයුතු ප්‍රමාද වන අතර ඉහත දක්වා ඇති සියළුම පර්යේෂණ ව්‍යාපෘතිවල කාලය දීර්ඝ කර ගැනීමට ප්‍රධාන හේතුවක් ලෙස මෙම කරුණ දැක්විය හැක.

ii. සමහර පර්යේෂණ ව්‍යාපෘති සඳහා නිවැරදිවම කල වකවානු තීරනය කිරීම අපහසුවේ. පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා කාලය තීරණය කරනු ලබන්නේ පර්යේෂණයට පෙර ඒ සම්බන්ධව පර්යේෂණ ඉංජිනේරුවන් සිදු කරන අධ්‍යනයක් තුලිනි. එම කරුණු පිලියෙල කල වැඩ සැලැස්මට අනුව පර්යේෂණ සිදු කිරීමේදී විවිධ තාක්ෂණික ගැටලු විසඳීමට සිදුවන අතර එම විසඳුම් පර්යේෂණ ව්‍යාපෘතියේදී ලබා ගැනීමට ආවේනික කාලය නිශ්චිතව සඳහන් කිරීම අපහසුවන අතර සාර්ථක විසඳුම් සොයාගන්න තුරුම ඒ සඳහා කාලය යෙදවීමට සිදුවේ. මෙම තත්වය නිසාම ව්‍යාපෘතිවල කාලය දීර්ඝ කිරිම අවශ්‍යවේ.

iii. පර්යේෂණ ව්‍යාපෘතිවල අලුතෙන් හඳුන්වා දෙන තාක්ෂණයන් හෝ නිෂ්පාදනයන් ක්ෂේත්‍රයේදී සිදු කරන භාවිතාව තුලින් නැවත වැඩි දියුණු කල යුතු දේවල් හඳුනා ගෙන ඒවා වැඩි දියුණු කල යුතුය. මෙවැනි ක්ෂේත්‍ර පර්යේෂණ සඳහාද සැලසුම් කල කාලසීමා වලදී සිදුකිරීමට නොහැකිවේ.

iv. පිටත ආයතන වලින් සම්පත් දායකත්වය ලබා ගැනීමේදී ද සැලසුම්කරණය තුල සිදුකිරීමට බොහෝවිට සිදුනොවේ. විශේෂයෙන්ම මානව සම්පත් දායකත්වය පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලබා ගැනීමේදී පර්යේෂණ සැලසුමත් ක්‍රියාකාරී සැලැස්මත් සම්පත් දායකයාගේ දායකත්වය ලබාගැනීමේ හැකියාව මත පර්යේෂණ ව්‍යාපෘතියේ කාල සීමාව තීරණය වේ.

(ඇ) මෙම යන්ත්‍රය 2016 දෙසැම්බර් මස 23 දින කර්මාන්ත දෙපාර්තමේන්තුවට භාර දුන් අතර ඔවුන් විසින් දිගටම යන්ත්‍රය භාවිතා කරන ලදී. එසේ වුවද විටින් විට ඇති වූ කාර්මික දෝෂ ඔවුන් විසින් දැනුම් දුන් විට කිහිපවතාවක්ම අප විසින් නිවරදි කර දෙන ලදී. මේ වන විට එම යන්ත්‍රයේ පැවති දෝෂ සම්පූර්ණයෙන්ම නිවරදි කරන ලදී. මේ අනුව ඔවුන් විසින් රඳවාගෙන ඇති (Retention) මුදල ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) අප ආයතනය විසින් පර්යේෂණ සිදුකර ආදාහනාගාරයක් සාර්ථක ලෙස 1990 දශකයේ නිපදවා වැඩිදියුණු කර ඇත. මේ වන විට තාක්ෂණය තාක්ෂණලාභීන් 06 දෙනෙකුට පවරා ලංකාව පුරා අදාහනාගාර 150 කට වැඩි ප්‍රමාණයක් ස්ථාපනය කොට ක්‍රියා කරමින් පවතී. මෙම ආදාහනාගාර හඳුන්වාදෙන ලද කාලයට වඩා අද පරිසර ප්‍රමිතීන් ඉහල ගොස් ඇති අතර, අද කාලයට අදාල පරිසර ප්‍රමිතීන් හා අනෙකුත් තාක්ෂණයන් හට ගැලපෙන පරිදි මෙම අදාහනාගාරය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය අපගේ ඉංජිනේරුවන් විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව එම ගැටළු නිරාකරණය කරමින් අදාහනාගාර තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා කුරුණෑගල නගර සභාව සමඟ එක්ව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙහිදී මෙහි ඍජු වියදම් වල මූලික ඇස්තමේන්තුව රු.11,380,000/- වූ අතර, නර්ඩ් ආයතනය හා කුරුණෑගල නගර සභාව මෙම මුදලින් 50% බැගින් දැරීමට (රු.5,690,000) අත්සන් කරන ලද ගිවිසුමට අනුව එකඟවී ඇත.

මෙම ව්‍යාපෘතිය 2016 පෙබරවාරි 5 දින ආරම්භ කර 2018 මාර්තු 30 දින වන විට අවසන් කිරීමට අපේක්ෂා කර තිබිණි. නමුත් ව්‍යාපෘති ඉංජිනේරු විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් හේතු වලට අනුව මෙම ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කරන ලදී.

ව්‍යාපෘතිය දීර්ඝ කිරීමට හේතු;

i. මේ සඳහා පාර්ශව කරුවෙක් සොයාගැනීමට කල්ගත වීම
ii. සොයාගත් පාර්ශව කරුවා වන කුරුණෑගල නගර සභාව මගින් මුදල් වෙන්කර ගැනීමට කාලය ගත වීම හා ගිවිසුම්ගත වීමට කල්ගත වීම
iii. අවශ්‍ය වායු දහක මිලදී ගැනීමට කල්ගත වීම
iv. තාප හුවමාරු ඒකකය (Heat exchanger) නිපදවීම සඳහා මිලගණන් කැඳවීමේ සිදු වූ ප්‍රමාදය
v. ගොඩනැගීම් අවස්ථාවේ අවශ්‍ය වූ වෙනස් කිරීම් නිසා ඇති වූ ප්‍රමාදය

(ඉ) ගාල්ල වග්ගල්මෝදර ඇල ආශ්‍රිතව අසව් දොරටුව ඉදිකිරීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් රු.112,000 ක් අප වෙත භාරදෙන ලද අතර මෙය 2014 දෙසැම්බර් වන විට අවසන් කිරීමට යෝජිතව තිබිණි. නමුත් පසුව ගොවිජනසේවා දෙපාර්තමේන්තුව මගින් දන්වා සිටියේ වග්ගල්මෝදර ඇලට නොව මෙම ගේට්ටුව බෙන්තර ඇල ආශ්‍රිතව ඉදිකරදෙන ලෙසය. මේ අනුව පිරිවිතයන් වෙනස් වූ බැවින් ඇස්තමේන්තුව රු.533,929 ක් විය. මෙහිදි ගේට්ටුව සවිකිරීමට අදාල කොන්ක්‍රීට් ව්‍යුහය ඉදිකිරිම ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් සිදුකිරිමට නියමිත විය. ගොවිජනසේවා දෙපාර්තමේන්තුව විසින් එකඟ වූ පරිදි කොන්ක්‍රීට් ව්‍යුහය ඉදිනොකිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය මේ වන විට අවසන් කිරීමට නොහැකි වී ඇත. මේ සම්බන්ධව ගොවිජනසේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.

4.3 හඳුනාගන්නා ලද පාඩු

මෙහි දක්වා ඇති ව්‍යාපෘති වියදම වැඩිවීම සම්බන්ධයෙන් පැහැදිලි කිරිම පහත පරිදි වේ.

RED/COM/106/2013 - අම්බලන්ගොඩ අසව් දොරටුව

මෙම අසව් දොරටුව සවිකිරීමේදී ජලය යට අඩි 6ක් පමණ ගැඹුරින් සිදු කිරීමට තිබූ අතර, ඒ සඳහා විශේෂ වූ තාක්ෂණික ක්‍රමයක් අප විසින් භාවිතා කරන ලදී. අනපේක්ෂිත ලෙස අයහපත් කාලගුණය තත්වය දිගටම පැවැති අතර, ජල මට්ටමද බලාපොරොත්තු වූවාට වඩා වැඩි මට්ටමක පවතින විට ගේට්ටුව සවිකිරීමේදී ගේට්ටුව ගඟ පතුලේ සිර වීමකට ලක්විය.

ගේට්ටුව දිගටම වැසී පැවැතීම නිසා ඉහල ගඟේ (up stream) ජල මට්ටම වැඩි වීමේ තිබණි. එම නිසා අවහපත් කාලගුණ තත්ව යටතේම විශේෂ උපකරණ සහ අමතර කම්කරු ශ්‍රමය යොදාගෙන තත්වය නිවැරදි කිරීමේදී මෙම අලාභය සිදු වී ඇත.

RED/COM-Act /53/2017 -ශීතකරණ විද්‍යාගාරය

මෙම ව්‍යපෘති සඳහා අලාභයක් සිදු වී නොමැත.

RED/COM/02/90/2017 - රත්නපුර දහනාගාරය

ව්‍යාපෘතිය ඇස්තමේන්තුගත කිරීමේදී පැවැති වැට් ප්‍රතිශතය පසුව අඩු වීම හේතුවෙන් මෙම රු. 1686/- ක අලාභය සිදු වී ඇත.

RED/COM/2/127/2014 - රන්වැඹේ ජීවවායු ජනකය

රු. 33,817/-ක් ලැබිය යුතුව තිබුනද,එම මුදල් ඉල්ලා කිහිප වරක්ම කරන ලද ඉල්ලීම් වලට ප්‍රතිචාරයක් නොමැති වූ නිසා මෙම අලාභයක් සිදු වී ඇත.

RED/COM/11/133/2014 - අතුරුවැල්ල අසව් දොරටුව

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් අදාල ස්ථානයේ ගඟේ හරස්කඩ (පළල, ගැඹුර වෙනස්වන ආකාරය ආදිය) පිලිබඳ ලබාදුන් විස්තර නිවැරදි නොවීය.

අයහපත් කාලගුණික තත්ව යටතේ ජල ප්‍රවාහය නතර කිරිමට තාවකාලික බැම්ම ගැසීමේ ක්‍රියාවලිය අපේක්ෂිත වූ ආකාරයෙන් කිහිප වාරයක්ම ජල ප්‍රවාහය මගින් කැඩී බිඳී ගිය නිසා ගේට්ටුව සවිකිරීමට දීර්ඝ කාලයක් ගතවිය. කාලය දීර්ඝ වීම සහ විශාල වශයෙන් මිනිස් ශ්‍රමය සහ කිහිප වාරයක්ම යාම් ඊම් නිසා ප්‍රවාහන ගාස්තු ද ඉහල නැගී නිසා මෙම අලාභය සිදු විය.

RED/COM/2/142/2014 - කුරුණෑගල ජීවවායු ජනකයක් ඉදිකිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල මහ රෝහලේ, ජනනය වන ඉඳුල් හා එළවලු කසල ජීවවායු ජනක ආධාරයෙන් අපහරණය කරන අතරම ජීවවායුව ආපන ශාලාව වෙත ලබා දීමට සැලසුම් කර තිබුණි. පහත සඳහන් හේතු මත මෙම ව්‍යාපෘති ඇස්තමේන්තුගත මුදල තුල නිමාවට පත් කිරීමට නොහැකි විය.

1. ඉදිකිරීමට අප යෝජනා කල ස්ථාන වෙනුවට, වෙනස් ස්ථාන රෝහල් පාර්ශවය මගින් ලබා දුන් අතර, එම ස්ථාන වාහන වලින් අමුද්‍රව්‍ය රැගෙන යාමට නොහැකි ස්ථානයි. මිනිස් ශ්‍රමය යොදාගෙන ගඩොල්, වැලි, සිමෙන්ති ආදිය ගෙන යාමට සිදුවීම නිසා වැඩි මුදලක් හා කාලයක් වැය විය.

2. අයහපත් කාලගුණය දිගින් දිගටම පැවැති නිසා (ජීරක වලවල් වල ඉවුරු කඩා වැටීම, ඉදිකිරීම් කටයුතු අඩාල වීම වැනි කරුණු මත) අලාභයක් සිදුවිය.

3. අයහපත් කාලගුණික තත්ව යටතේ වැලි සහ ගඩොල් කලට වේලාවට ලබා ගත නොහැකි වූ නිසා සේවකයින් රාජකාරියක් නොමැතිව (idling) පසුවිම යන කාරණා මත ඉහත අලාභය සිදුවී ඇත.

RED/COM/11/136/2014 - විල්ගොඩ අසව් දොරටුව

මෙහිදී නන්නාඳුනන පිරිසක් විසින් දොරටුව අදාල සීරුමාරු නොසලකා එකවර (ජලශයේ ජලය පිරී ඇති විට) විවෘත කෙරුම නිසා දොරටුව ක්‍රියාත්මක වන යන්ත්‍රණයට හානි වී තිබූ නිසා එය නැවත පිලිසකර කොට දොරටු යථා තත්වයට පත් කෙරුමට සිදුවූ නිසා මෙම වියදම දැරීමට සිදුවිය.

N/CVL/Com/01/86/2016 - විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ ඉදිකිරීම් සඳහා උපදේශකත්ව සේවා

2015 වර්ෂයේදී ඉහත ඉදිකිරීම් සැළසුම් කිරිම සඳහා ගිවිසුම් අත්සන් කලද බලාපොරොත්තු වූ පරිදි විජය කුමාරතුංග රෝහල විසින් මෙම කටයුතු නවත්වන ලදී. විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙම කාර්යය නතර කරන ලෙස අප ආයතනය වෙත දන්වා තිබුණි. ඒ වන තෙක් කරන ලද කාර්යය වෙනුවෙන් ගිවිසුමේ පරිදි ගාස්තුව විජය කුමාරතුංග රෝහල වෙත දැන්වීමට කටයුතු කරන ලදී. තවද නර්ඩ් ආයතනය මේ වන විට මේ සඳහා රු. 28,889.00 ක මුදලක් වැයකර තිබුණි.

එහෙත් එම ඉදිකිරීම් කටයුතු රෝහල විසින් නවතා දැමීම නිසා අප විසින් ඉල්ලා යැවූ මුදල අප වෙත ලබාදීම අවිනිශ්චිත වූ අතර 2017.02.27 සහ 2017.05.08 දිනැති ලිපි මගින් ගිවිසුමේ පරිදි අප වෙත ලැබිය යුතු මුදල් ලබාදෙන ලෙස නැවත මතක් කිරීම් කර ඇත.

TMD/COM-ACT/9/67/2017 - පුහුණු පාඨමාලා

අපගේ තාක්ෂණ ව්‍යාපෘති ජනතාව අතර ප්‍රචලිත කිරිම සඳහා අප විසින් පුහුණු පාඨමාලා පවත්වනු ලබන අතර එම පුහුණු පාඨමාලා පවත්වනු ලබන්නේ ඉතාමත් සහනදායි මුදලක් අය කිරීමෙනි. එම පුහුණු පාඨමාලා පිළිබඳව ජනතාව දැනුවත් කිරිම සඳහා අප විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය 03 න්ම පුවත් පත් දැන්වීම් පළ කිරිමක් සිදු කරනු ලදි. ඒ සඳහා රු. 145,800.00 ක පමණ වූ මුදල මෙම ව්‍යාපෘතියට බැර කිරීමට සිදු වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ වියදම වැඩි වීමක් සිදු විය.

DFCI/COM/05/114/2015 - රබර් පාපිස්සක් සඳහා අච්චුවක් සෑදීම

අප විසින් මෙම ඇණවුම භාර ගැනීමේදී වියදම් ඇස්තමේන්තුව සකස් කරනුයේ ආයතනයේ යන්ත්‍ර සූත්‍ර හා මානව සම්පත් යොදා කාර්යය නිම කරන බව සළකා ගෙනය. නමුත් මෙම ඇණවුම නිම කරන කාලය තුළදී අදාල යන්ත්‍රසූත්‍ර ක්‍රියා විරහිත විය. එබැවින් අදාල ඇණවුම නියමිත දිනට ලබා දිය යුතුව තිබූ බැවින් අච්චුවට අවශ්‍ය ඇතැම් කොටස් බාහිර ආයතනයක් මඟින් නිෂ්පාදනය සිදු කර ගන්නා ලදි. එහිදී අප බලාපොරොත්තු නොවූ අමතර වියදමක් දැරීමට සිදුවීම නිසා අලාභය සිදුවූ බව නිගමනය කළ හැක.

5. තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

(අ) අපගේ ව්‍යාපෘතීන් සැළසුම් කිරීමේදී තිරසාර සංවර්ධන ඉලක්ක වලට අවධානය යොමු කරණු ලැබේ.

(ආ) 2019 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්මට තිරසාර සංවර්ධන අරමුණු හා 2030 න්‍යාය පත්‍රයට අනුව අරමුණු පහැදිලිව සඳහන් කිරීමට කටයුතු කරණු ලැබේ.

6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

6.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලීය

(අ) සමහර ප්‍රසම්පාදනයන් සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් තිබුණු අතර, සමහර ප්‍රසම්පාදන සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් නොතිබුණත්, ප්‍රසම්පාදන ක්‍රියාවලීයේ ප්‍රධාන ක්‍රියාවලීන් ඇතුළත් ලුහුඩු සැලැස්මක් තිබිණි. කෙසේ වෙතත් දැනට සිදු කරණු ලබන සියළුම ප්‍රසම්පාදන සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරිමට පියවර ගෙන ඇත.

(ආ) ආයතනයේ ප්‍රධාන කාර්යාලය ගොඩනැගිල්ල (NERD Front Office) වසර 40 කට වඩා පැරණි ගොඩනැගිල්ලක් වශයෙන් පැවතීම නිසා එය නවීකරණය කිරීමට භාජනය කරන ලදි. අඩු වියදම් නිවාස තාක්ෂණය නව ඉදිකිරීම් සඳහා භාවිතා කලද නවීකරණ කටයුතු සඳහා එය යොදා ගැනීම නොකරයි. කෙසේ වුවත් අඩු වියදම් නිවාස තාක්ෂණයේ ඉදිකිරීම් කටයුතු කිරීමේ තාක්ෂණය බලපත්‍රලාභීන් වෙත ලබා දී එමගින් සිදු කරනු ලබන අතර නර්ඩ් ආයතනය මගින් ඉදිකිරීම් කටයුතු සිදු නොකරයි. එම නිසා බාහිර කොන්ත්‍රාත්කරුවන් ලවා මෙය සිදු කරගන්නා ලදි.

7. පද්ධති හා පාලනයන්

(අ) වර්ෂයකට වරක් කඩඉම් විභාග පවත්වනු ලැබේ.

(ආ) ඉහත කරුණු ගැන අවධානය යොමු කරමින් මගහැරීම් වලක්වාගැනීමට කටයුතු කිරීමට නිලධාරින් හට උපදෙස් ලබා දෙන්නෙමු.

(ඇ) (I) ආයතනයේ අධ්‍යක්ෂ (තාක්ෂණික), ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු තනතුරු පුරප්පාඩු නිරන්තරයෙන්ම පවතින අතර වසරක් පුරාවටම බලපැවැත්වෙන පරිදි (2016, 2017 වර්ෂද ඇතුළුව) පුවත් පත් මගින් සහ ආයතනයේ වෙබ් අඩවිය මගින් දැන්වීම් ප්‍රසිද්ධ කළද අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සපුරන ලද අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම මත බඳවාගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇත. තවද, ඉංජිනේරු වෘත්තිය සඳහා පවතින ඉහළ රැකියා ඉල්ලුම සහ වෙනත් ආයතනවල ඔවුන් සඳහා ඉහළ වැටුප් හා දීමනා ලැබීම හේතුවෙන් බඳවාගන්නා ලද අයදුම්කරුවන්ද ඉතාමත් කෙටි කලකින් සේවයෙන් ඉවත්ව යාමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බැවින් ඉහත තනතුරු වල නිරන්තරයෙන්ම පුරප්පාඩු පවතී. මෙය වසර ගණනක සිට අප ආයතනයේ පවතින බරපතල ගැටළුවක් බවට පත්ව ඇත.

තවද, පෙදරේරු, විද්‍යාගාර සහායක වැනි තනතුරු සඳහා NVQ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් නොමැතිවීමේ ගැටළුව හේතුවෙන් දැන්වීම් ප්‍රසිද්ධ කර බඳවාගැනීමට කටයුතු කළද පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. මේ සම්බන්ධයෙන් සුදුසු පියවරයන් යෝජනා කරමින් මේ වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.

(II) 2017.06.06 දින කාර්මික සහකාර (විදුලි) – MA 2-2 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නියෝජනය කළ_අමාත්‍යාංශ නිලධාරි සහභාගී නොවුණ හෙයින් ලකුණු ලේඛනයේ ඔහුගේ අත්සන තබා නොතිබිණ.

2016.11.04 දින පර්යේෂණ ඉංජිනේරු (Mechanical) AR -1 තනතුර සඳහා බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නියෝජනය කළ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු දෙපාර්තමේන්තු ප්‍රධානී හදිසි පෞද්ගලික කටයුත්තක් හේතුවෙන් ආයතනයෙන් බැහැර යෑමට සිදු වූ හෙයින් එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සහභාගී වීමට නොහැකි වීම හේතුවෙන් ලකුණු ලේඛනයේ අත්සන් යොදා නැත.

(ඈ) සමහර අවස්ථාවලදී මෙහිදී දක්වා ඇති කරුණු මගහැරී ඇති අතර, එසේ නොවීමට කටයුතු මේ වන විට යොදා ඇත.

මෙයට විශ්වාසී
ජා.ඉං.පර්.සහ සං. මධ්‍යස්ථානය

ඉංජි. ඩබ්.ජේ.එල්.එස් ප්‍රනාන්දු
සභාපති

ඉංජි. ඩී ඩී ආනන්ද නාමල්
අධ්‍යක්ෂ ජනරාල්